# දෙසතිය

පුවත් සඟරාව

2026 පෙබරවාරි


# මානව ප්‍රාග්ධනයේ හැරවුම



විමුක්තිවාදී නිදහස

# ස්වර්ණමය දොරටුවක්



මහාචාර්ය අනුරාධ මහසිංහ සමඟ මොරටුව විශ්වවිද්‍යාලයේ මහාචාර්ය අසෝක එස් කරුණානන්ද, මහාචාර්ය තුෂාරි සිල්වා සහ සන්දීප අලගියවන්න



මහාචාර්ය අනුරාධ මහසිංහ, උපකුලපති මහාචාර්ය ඉන්දික මහේෂ් කරුණාතිලක සහ විද්‍යා පීඨාධිපති මහාචාර්ය උපුල් සොන්නාදර

අභ්‍යවකාශයේ ජනාවාස තනන්නට සැරසෙන අතිනවීන ලෝකය වෙත පිවිසීමේ ස්වර්ණමය දොරටුවක් ශ්‍රී ලංකාවේ විද්‍යාත්මක හා තාක්ෂණික සංවර්ධන ක්ෂේත්‍රයට නොබෝදා විවර වුණා. ඒ, ශ්‍රී ලංකාවේ පළමු වැනි කොන්ටම් පරිගණකය දොරට වැඩීමත් සමඟ. එය මෙරට කොන්ටම් යුගයේ ආරම්භයයි සනිටුහන් කළේ.

මෙහිදී මුල් ම කොන්ටම් පරිගණකය ඇතුළත් නවතම විද්‍යාගාර පහසුකම 2026 ජනවාරි 21 දින කොළඹ විශ්වවිද්‍යාලයේ ගණිත දෙපාර්තමේන්තුව අනුබද්ධිත කොන්ටම් පරිගණකකරණයේ ගණිතමය ආකෘති නිර්මාණය සඳහා වූ පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය ලෙසින් විවෘත වුණා. කොළඹ විශ්වවිද්‍යාලයේ නව උපකුලපති මහාචාර්ය ඉන්දික මහේෂ් කරුණාතිලකගේ ප්‍රධානත්වයෙන් ගණිත විද්‍යා දෙපාර්තමේන්තුවේ ගණිතමය ආකෘති නිර්මාණය සඳහා වූ පර්යේෂණ හා සංවර්ධන නව මධ්‍යස්ථානයේ ප්‍රධානී මහාචාර්ය අනුරාධ මහසිංහ ප්‍රමුඛ ගණිත, පරිගණක විද්‍යා සහ තාක්ෂණ විශේෂඥ පිරිසක් මේ අවස්ථාවට එක් ව සිටියා.

න්‍යෂ්ටික චුම්බක අනුනාද (nuclear magnetic resonance) ආධාරයෙන් ක්‍රියාත්මක වන මෙය චීනයේ ස්පින්කිවු (SpinQ) සමාගමේ නිර්මාණයක්. මෙය ලොව ප්‍රමුඛ පෙළේ විශ්වවිද්‍යාලවල කොන්ටම් පරිගණක විද්‍යාව ඉගැන්වීමට සහ පර්යේෂණ කිරීමට භාවිත කෙරෙන අතිනවීන උපාංගයක්.

කොන්ටම් පරිගණක නිර්මාණය කර ඇත්තේ එකවර බහු සංකීර්ණ ගණනය කිරීම් සිදු කිරීමට හැකි වන පරිදි. එයට සංකීර්ණ දත්ත විශාල ගණනක් එකවර සැකසිය හැකියි. මේ නිසා සකල විද්‍යා ක්ෂේත්‍රවල ම පර්යේෂණ සහ අධ්‍යයන මෙන් ම දැනුම රැස්කිරීම සමඟ නව නිෂ්පාදන නොසිතූ විරූ වේගයකින් ඉහළ යාමට මෙයින් ලැබෙන්නේ විස්මිත බලපෑමක්. අණුවල හැසිරීම අනුකරණය කිරීමට සහ ඖෂධ අතර අන්තර්ක්‍රියා අනුකරණය කිරීමට රසායන විද්‍යාව සහ ජෛව වෛද්‍ය විද්‍යාව වැනි ක්ෂේත්‍රවලදී මේ විශිෂ්ට තාක්ෂණික හැකියාව භාවිත කිරීමෙන් පහසුවෙන්, ඉක්මනින් සහ අඩු වියදමකින් පුද්ගලාරෝපිත නව ඖෂධ නිපදවීමට හැකිවෙනවා.

මේ නව පරිගණකයේ සම්ප්‍රාප්තියත් සමඟ සිසුන්ට කොන්ටම් පරිගණක ක්ෂේත්‍රයේ රාජ්‍ය මට්ටමේ පිළිගත් උසස්, නිරවුල් කොන්ටම් අධ්‍යාපනයක් ලබා ගැනීමට අවස්ථාව ලැබෙනු ඇති.

**සුගත්ප්‍රිය කුලතුංග ආරච්චි**



# දෙසතිය
පුවත් සඟරාව

වෙළුම 48, කලාපය 02,
2026 පෙබරවාරි



**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව,**
163, කිරුළපන ඇවනිව්,
පොල්හේන්ගොඩ, කොළඹ 05.

**සංස්කරණ මණ්ඩලය**
දු. අ. 011 - 2513757 / 0112 - 513153
Email - desathiya@gmail.com
බෙදාහැරීම - ප්‍රකාශන කාර්යාංශය
දු. අ. 011 - 2512759



උපදේශක සංස්කාරක
**එච්. එස්. කේ. ජේ. බණ්ඩාර**
රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්

අංශ ප්‍රධානී - දෙසතිය
**ඩබ්. එම්. ශාන්තප්‍රිය**

සංස්කාරක
**මාලා මල්කාන්ති පරණගමගේ**

රූ රටා සංස්කාරක
**සංජීව පෙත්තාවඩු**

විශේෂාංග ලේඛක
**රංගිකා අබේසේකර**

ඡායාරූප
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ඡායාරූප අංශය**

මුද්‍රණය
**රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව**

ප්‍රකාශනය හා බෙදාහැරීම
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව**


**හිතවත් පාඨකයිනි,**
47 වසරක් ඔබ වෙත දැනුම ලබාදුන් 'දෙසතිය' පුවත් සඟරාව වෙත පාඨක ඔබගේ අදහස් කෙටියෙන් ලියා තැපැල් ලිපිනයට හෝ විද්‍යුත් තැපැල් ලිපිනයට හෝ යොමු කරන්න

**සංස්කාරක**


මෙහි පළ වන ඇතැම් ඡායාරූප අන්තර්ජාලයෙන් ලබාගත් ඒවා වන අතර ඒවායේ අයිතිය මුල් හිමිකරු සතු යි.


## කවරයේ කතාව





21



12
තාක්ෂණයේ භීෂණය



03
තමන්ගේ තැනක් ලස්සන ජීවිතයක්



35
ඇන්ද සේකර



05
ආරෝග්‍යා පරමා ලාභා



39
රග්බි

# දෙසතිය
පුවත් සඟරාව

**දෙසතිය** සඟරා දයකත්වය

වාර්ෂික දයකත්වය රු. 1680.00
අර්ධ වාර්ෂික දයකත්වය රු. 840.00

**මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ මුදල් තැන්පත් කිරීමේදී**

'රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ, ගිණුම් අංක 119100109026220 -මහජන බැංකුව, නාරාහේන්පිට' ගිණුමට මුදල් තැන්පත් කර ඔබගේ ගෙවීම තහවුරු කිරීමට අදළ බැංකු බැරපත හා සඟරා දයකත්ව කූපන්පත 0707444138 අංකයට Whatsapp කරන්න. (Remarks/Decription යන ස්ථානයේ 'Desathiya' ලෙස සටහන් කරන්න)

**මුදල් ඇණවුම් එවීමේදී**

'රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ' නමට ලියා ගෙවන තැපැල් කාර්යාලය 'කම්කරු මහලේකම් කාර්යාලය, නාරාහේන්පිට ලෙස යොමු කර රජයේ ප්‍රකාශන කාර්යාංශය, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, අංක 163, පොල්හේන්ගොඩ, කොළඹ 05 යන ලිපිනයට එවන්න. අංකය සහ දිනය සහිත චෙක්පත් ද 'රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ' නමට ලියා මෙම ලිපිනයට යොමු කරන්න. විමසීම් - 0112512759

**දෙසතිය**

සඟරා ලැබිය යුතු නම හා ලිපිනය (ඉංග්‍රීසි භාෂාවෙන්)

Name ........................................

Address ........................................

........................................

........................................

........................................

ID Number ........................ Tel / Mobile ........................

Signature ........................ Date ........................


# ජීවිත උකසට නොතබන්න

සෞඛ්‍ය ආරක්ෂාව ලැබීම මූලික මානව අයිතියක්. ලෝක සෞඛ්‍ය සංවිධානය අදහස් කරන්නේ කරන්නේ සෑම පුද්ගලයෙකුට ම ඔවුන්ට අවශ්‍ය සෞඛ්‍ය සේවාවන් අවශ්‍ය විටදී, කොතැනකදී හෝ මූල්‍ය දුෂ්කරතාවකින් තොර ව ලබා ගැනීමට හැකියාව පැවතිය යුතු බව. කිසිවෙකු දරිද්‍රතාව නිසා හෝ ඔවුන්ට අවශ්‍ය සෞඛ්‍ය සේවාවන්ට ප්‍රවේශවීමට නොහැකි වීම නිසා හෝ අසනීප වී මිය නොයා යුතු බවත් ඔවුන් අවධාරණය කරනවා.

රටක මානව සුවතාව සම්බන්ධයෙන් මෙවැනි පසුබිමක් පැවතිය ද සෞඛ්‍ය සේවයේ නිරත වගකිව යුතු ඇතැම් පිරිස් වරින් වර දියත් කරන වැඩවර්ජන හා වෘත්තීය ක්‍රියාමාර්ග නිසා අසරණභාවයට පත් වන්නේ රෝගී ජනතාව. නොබෝද රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමය ඔවුන්ගේ වෘත්තීය ඉල්ලීම් රැසක් දිනා ගැනීමට දීප ව්‍යාප්ත සංකේත වැඩ වර්ජනයක් හා වෘත්තීය ක්‍රියාමාර්ගයකට එළඹියා. මේ සඳහා එක්වූයේ සීමිත පිරිසක් බැවින් රටේ රෝහල් පද්ධතිය හෝ සෞඛ්‍ය සේවාවන් හෝ සම්පූර්ණයෙන් අකර්මන්‍ය වූයේ නැහැ. නිදහස් සෞඛ්‍ය සේවයේ ඵල භුක්ති විඳින ජනතාව ප්‍රතිකාර සඳහා රෝහල් වෙත පැමිණ අපහසුතාවට පත් වූ අවස්ථා ද තිබුණා. රෝගීන් ප්‍රාණ ඇපයට තබා ගන්නා වෘත්තීය ක්‍රියාමාර්ග පිළිබඳ ප්‍රතිකාර පතා පැමිණි ඔවුන් දෝෂාරෝපණය කළේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ නිර්මාණය වී ඇති මේ බේදවාචකය පිළිබඳ මැසිවිලි නගමින්.

රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමය සඳහන් කරන ආකාරයට ඔවුන් මෙවැනි වෘත්තීය ක්‍රියාමාර්ගයකට එළඹ ඇත්තේ රෝහල් පද්ධතියේ පවතින ඖෂධ හිඟය, බාල ඖෂධ ගැටලුව ඇතුළු නිදහස් සෞඛ්‍ය සේවයේ පවත්නා ගැටලු සඳහා විසඳුම් ලබා ගැනීමට. මෙහිදී ඔවුන් රෝහලෙන් බැහැර ව ඖෂධ මිලදී ගැනීමට හෝ රසායනාගාර පරීක්ෂණ සිදුකිරීමට හෝ රෝගීන්ට නිර්දේශ නිකුත් නොකිරීම ඇතුළු විශේෂිත සේවා කිහිපයකින් ඉවත් වී සිටිනවා. එහෙත් රජය සඳහන් කරන්නේ ආර්ථික සාධක මුල්කර ගනිමින් වෛද්‍ය වෘත්තිකයන් මේ වෘත්තීය ක්‍රියාමාර්ග වෙත එළඹ ඇති බව. රාජ්‍ය සේවක වැටුප් වැඩිකිරීම් ඇතුළු මූල්‍ය සහන රැසක් ලබා දී තිබියදී ඔවුන් මෙවැනි වැඩවර්ජන හා වෘත්තීය ක්‍රියාමාර්ග සඳහා යොමු වීම යුක්තිසහගත නොවන බවත් තෙවසරක රාජ්‍ය සේවක වැටුප් වැඩි කිරීම් සඳහා පමණක් රුපියල් බිලියන 330ක් වෙන් කර ඇති බවත් රජය අවධාරණය කරනවා.

මහජන මුදලින් වැටුප් ලබන පිරිසක් ලෙස රෝගීන්ගේ ජීවිත උකසට තබා කරන මේ වැඩ වැරැම් කිසිසේත් අනුමත කරන්නට බැහැ. අනෙක් සඳහන් කළ යුතු කරුණ වන්නේ නිදහස් සෞඛ්‍ය සේවාවක් රටේ ක්‍රියාත්මක වන්නේ ද? යන්න උභතෝකෝටිකයක් බවට පත් ව තිබීම. රජයේ රෝහල්වලින් නිසි ප්‍රතිකාර නොලැබීම හේතුවෙන් ඇතැම් පිරිස් පෞද්ගලික රෝහල්වලින් ප්‍රතිකාර ගන්නේ ඇති හැකි නිසා ම නොවෙයි. තම රෝගියා සුවපත් කර ගැනීම තමන්ට වටිනා බැවින්.

රෝගීන්ගේ ජීවිත රැක ගැනීමට ගෞරවනීය ලෙස වෛද්‍ය වෘත්තීයේ නියැළෙන බොහෝ පිරිස් සිටිනවා. එහෙත් අතළොස්සක් වෛද්‍යවරු රජයේ රෝහල්වලදී රෝගීන් කෙරෙහි නොදක්වන සැලකිල්ලක් පෞද්ගලික රෝහල්වලදී දක්වන බව සැමට නොරහසක්. ජීවිතවලට වඩා මුදලට වටිනාකමක් දෙන මෙවැනි අවස්ථාවලදී රෝගී ජීවිත බේරා ගැනීම පසෙක තබා ඊට නිරුත්තර වීම පමණයි කළ හැක්කේ. නිදහස් අධ්‍යාපනයෙන් උගත්තවුන් ලෙස වෛද්‍යවරුන් මෙවැනි අවස්ථාවලදී තම හෘදසාක්ෂ්‍යය විමසීමට තරම් කාරුණික නොවීම රෝගීන්ගේ නොලැබීම ද? යන්න ඇතැම් විට ඇසෙන කතා.

එසේ හෙයින් වෛද්‍ය වෘත්තිකයන්ට රටේ ජනතාවගේ සෞඛ්‍ය සුරක්ෂිතතාව පිළිබඳ පැවරෙන වගකීම සහ වගවීම යළි යළිත් සිතා බලන්නට අවස්ථාව එළඹ තිබෙනවා.

\- සංස්කාරක -

# තමන්ගේ තැනක් ලස්සන ජීවිතයක්

**කාංචනා සිරිවර්ධන**

'කුසට අහර' මෙන් ම 'හිසට වහලක්' තිබිය යුතු ය යන්න මූලික මානව අයිතිවාසිකමක් ලෙස මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයෙන් තහවුරු කර තිබෙනවා. ඒ, එහි 25 (1)වගන්තියෙන්. මේ නිසා ඕනෑ ම රටක පුද්ගලයකුගේ අපේක්ෂාව වන්නේ නිවාස සිහිනය සැබෑ කර ගනිමින් සුව පහසු ජීවිතයක් ගත කිරීම. අනෙක් අතට නිවාස අහිමි ජනතාවට තමාගේ නිවසක ජීවත් විය හැකි රටක් නිර්මාණය කිරීමයි රජයේ අරමුණ. මේ යටතේයි 'ජාතික නිවාස සංවර්ධන වැඩසටහන 2026' 'තමන්ගේ තැනක් ලස්සන ජීවිතයක්' තේමාව යටතේ නිවාස 31,318ක් ගොඩනැගීමට සැලසුම් කර ඇත්තේ.

එම වැඩසටහනේ ආරම්භය නොබෝද (ජනවාරි 16 දින) යාපනය, චාවකච්චේරිය, මීසාලේ වීරසිංහ ප්‍රාථමික විදුහල් ක්‍රීඩාගංණයේදී ජනාධිපතිවරයාගේ ප්‍රධානත්වයෙන් සිදු වුණා. මෙහිදී යුද්ධයෙන් අවතැන් වූ යාපනය දිස්ත්‍රික්කයේ පවුල් 800ක් වෙනුවෙන් නිවාස ඉදිකර ගැනීම සඳහා රුපියල් ලක්ෂ 20ක් ලබා දී පළමු අදියර යටතේ රුපියල් ලක්ෂ 03 බැගින් වූ චෙක්පත් ප්‍රදානයක් ද සිදු කෙරුණා.

නියෝජ්‍ය අමාත්‍ය ටී.බී සරත් පෙන්වා දෙන ආකාරයට ගොඩනැගීමට සැලසුම් කර තිබෙන නිවාස 31,318න් නිවාස 18,229ක් නිවාස ඉදිකිරීම් හා ජලසම්පාදන අමාත්‍යාංශය යටතේ ඉදිකරනවා. ඒ අනුව සියලු දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි අඩු ආදායම්ලාභී නිවාස 13,347ක් ගොඩනැගීමයි අපේක්ෂාව. මෙහිදී රාජ්‍ය සේවකයන් ඉලක්ක කරමින් නිවාස 1,000ක් ඉදිකිරීමට සැලසුම් කරන අතර එක් නිවාසයක් සඳහා වෙන් කරන මුදල රුපියල් ලක්ෂ 12ක්. මේ නිවාස ව්‍යාපෘතිය යටතේ උතුරු නැගෙනහිර යුද්ධයෙන් අවතැන් වූ ජනතාව නැවත පදිංචි කිරීම සඳහා ඉදිකිරීමට සැලසුම් කර තිබෙන නිවාස සංඛ්‍යාව 2,500ක්. ඒ සෑම නිවාසයක් සඳහා ම රුපියල් ලක්ෂ 20 බැගින් වෙන් කෙරෙනවා. ප්‍රවාහන, මහාමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය යටතේ මධ්‍යම ආදායම්ලාභීන්, අඩු ආදායම්ලාභීන්, කලාකරුවන්, මාධ්‍යවේදීන් යන පිරිස් ඉලක්ක කරගෙන ඉදිකිරීමට නියමිත නිවාස සංඛ්‍යාව 4,998ක්.

> මේ නිවාස ව්‍යාපෘතිය වඩාත් ප්‍රශස්ත මට්ටමේ ව්‍යාපෘතියක් බවට පත් කරගැනීමටනම් ඉදිකිරීම් ක්ෂේත්‍රයේ පවතින ගැටලු, තිරසර සංවර්ධනය, පාරිසරික සුරක්ෂිතතාව වැනි කරුණු පිළිබඳ විශේෂයෙන් සැලකිලිමත් වීම වැදගත්.

එසේ ම වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයෙන් නිවාස 3,100ක්, ග්‍රාමීය සංවර්ධන සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ අමාත්‍යාංශයෙන් නිවාස 1,256ක්, ක්‍රීඩා අමාත්‍යාංශයෙන් නිවාස 320ක්, ළමා හා කාන්තා කටයුතු අමාත්‍යාංශයෙන් නිවාස 1,000ක් ඉදිකිරීමට සැලසුම් කර තිබෙනවා. පළාත් සභා යටතේ සබරගමු පළාත් සභාවෙන් නිවාස 344ක්, වයඹ පළාත් සභාවෙන් නිවාස 210ක්, ඌව පළාත් සභාවෙන් නිවාස 515ක්, මධ්‍යම පළාත් සභාවෙන් නිවාස 516ක්, උතුරු මැද පළාත් සභාවෙන් නිවාස 93ක්, බස්නාහිර පළාත් සභාවෙන් නිවාස 285ක්, උතුරු පළාත් සභාවෙන් නිවාස 107ක් ඉදිකිරීමටයි නියමිත.

දිට්වා සුළි කුණාටුවෙන් ආපදාවට පත් වූ නිවාස ගොඩනැගීම සිදු කෙරෙන්නේ මේ නිවාස ව්‍යාපෘතියට අමතර ව. මේ



ව්‍යාපෘතිය යටතේ උතුරු නැගෙනහිර යළි පදිංචි කිරීමේ නිවාස ඉදිකෙරෙනවා 2500ක්. රටේ අනෙකුත් ප්‍රදේශවල අඩු ආදායම්ලාභීන් වෙනුවෙන් ඉදිකරන සියලු ම නිවාස සඳහා වෙන්කර ඇත්තේ රුපියල් ලක්ෂ 10ක මුදලක්. එම නිවාස එවැනි මුදලකින් සාදා නිම කිරීමට අපේක්ෂා කරන්නේ ප්‍රජා සහභාගිත්වය උපරිම ව ලබා ගැනීමෙන්. වතු යටිතල පහසුකම් අමාත්‍යාංශයෙන් ලබා දෙන නිවාස 3,100 සඳහා එක් නිවාසයක් වෙනුවෙන් වෙන් කෙරෙන්නේ රුපියල් ලක්ෂ 25-27 අතර මුදලක්.

මේ නිවාස ලැබිය යුතු පිරිස් හඳුනා ගැනෙන්නේ විශේෂ නිර්ණායක යටතේ. මේ සම්බන්ධයෙන් අදහස් දක්වන ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සභාපති අරවින්ද සිරිනාත; "ඉදිකිරීමට බලාපොරොත්තු වන නිවාස 31,318න් නිවාස 15,601ක් ඉදිකෙරෙන්නේ ජාතික නිවාස සංවර්ධන අධිකාරියෙන්. එහිදී ඊට අදාළ නිර්ණායක මත ශ්‍රී ලංකාවේ සෑම දිස්ත්‍රික්කයක් ම, සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් ම ආවරණය වන පරිදි නිවාස ලැබිය යුතු පුද්ගලයන් තෝරා ගැනීම කමිටුවකින් සිදු කරනවා. හඳුනා ගැනීමේ ක්‍රියා පටිපාටියෙන් පසුවයි එම වැඩසටහනට අදාළ පළමු චෙක්පත් ප්‍රදානය සිදු කරන්නේ. එම නිවාස ගොඩනැඟීමට අවශ්‍ය මුදල් පියවර කිහිපයක් යටතේ ලබා දෙනවා. මේ සෑම නිවසක් ම තෙමසක් ඇතුළත සාදා නිම කළ යුතුයි. පියවරෙන් පියවර අපගේ තාක්ෂණික නිලධාරින් අධීක්ෂණය කිරීමෙන් අනතුරුවයි ඊළඟ පියවර සඳහා අවශ්‍ය මුදල ලබා දෙන්නේ. ඊට අමතර ව ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ණය වැඩසටහනක් යටතේ නිවාසලාභීන්ට ලබාදෙනවා ණය වර්ග දෙකක්. ඉන් ලක්ෂ 15ක් දක්වා ලබා දෙන සේවා අභිමානී ණය (රාජ්‍ය සේවකයන් සඳහා ඉදිරිපත් කරන ණය) ක්‍රමය යටතේ ගොඩනැඟීමට අපේක්ෂා කරන නිවාස සංඛ්‍යාව 1,000ක්. විසිරෙන ණය වැඩසටහන යටතේ තවත් නිවාස 2,500ක් අලුතෙන් ඉදිකිරීමට ණය ලබා දෙනවා. මේ සියල්ල එකතුව ඉදිරි වසර සඳහා නිවාස 15,000 ඉක්මවූ සංඛ්‍යාවක් ඉදිකිරීමේ ඉලක්කගත සැලැස්මක් ක්‍රියාත්මක කිරීමට අප තීරණය කර තිබෙනවා."

මේ නිවාස ව්‍යාපෘතිය වඩාත් ප්‍රශස්ත මට්ටමේ ව්‍යාපෘතියක් බවට පත් කරගැනීමටනම් ඉදිකිරීම් ක්ෂේත්‍රයේ පවතින ගැටලු, තිරසර සංවර්ධනය, පාරිසරික සුරක්ෂිතතාව වැනි කරුණු පිළිබඳ විශේෂයෙන් සැලකිලිමත් වීම වැදගත්. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය මයුර සමරකෝන් පවසන්නේ නිවාස ඉදිකිරීමේදී ශ්‍රී ලංකාවේ ඉඩම් භාවිතය පිළිබඳ පැහැදිලි රාජ්‍ය ප්‍රතිපත්තියක් නිර්මාණය වීම අවශ්‍ය බව. අදහස් දක්වන ඔහු; "දැනට මෙරට කෝටි දෙක ඉක්ම වූ ජනගහනයක් සිටිනවා.

රජයක් විදිහට ප්‍රතිපත්තිමය තීරණයක් ගත යුතුයි සිරස් සංවර්ධනය පිළිබඳ ව. පහළ සිට ඉහළට කෙරෙන නිවාස ඉදිකිරීම්වලදී භූමිය විශාල වශයෙන් ඉතිරි කරගත හැකියි. තිරස් අතට නිවාස ඉදිකිරීමේදී භූමි පරිභෝජනය වැඩිවීමෙන් අනාගතය වෙනුවෙන් පරිසරයේ සුරක්ෂිත කරගත යුතු සංවේදී ස්ථාන අහිමි විය හැකියි. අතීතයේ විවිධ රජය යටතේ දැකගත හැකි වූ ආකාරයට ම නිවාස ව්‍යාපෘතිවලින් කුඩා කුඩා නිවාස තනි තනි ව තිරස් අතට ඉදි වුවහොත් භූමි පරිභෝජනය විශාල වශයෙන් සිදු වනවා. එය අනාගතයේදී රටක් ලෙස අපට ඉතා අවාසිදායක වන්නට පුළුවන්.

ඉදිරියේදී එය තවදුරටත් වර්ධනය වුවත් භූමියේ කිසිදු ආකාරයක වර්ධනයක් සිදු වන්නේ නැහැ. මේ නිසා තිරසර සංවර්ධනයට අදාළ ව අපේ භූමිය පරිභෝජනයට ගන්නා ප්‍රමාණය සහ ඉඩම් භාවිතය සම්බන්ධයෙන් විශාල ගැටලු තිබෙනවා. අද ලෝකය සංවර්ධනය වන්නේ පහළ සිට ඉහළට. අප එය හඳුන්වනවා සිරස් සංවර්ධනය නමින්. රජයක් විදිහට ප්‍රතිපත්තිමය තීරණයක් ගත යුතුයි මේ සිරස් සංවර්ධනය පිළිබඳ ව. පහළ සිට ඉහළට කෙරෙන නිවාස ඉදිකිරීම්වලදී භූමිය විශාල වශයෙන් ඉතිරි කරගත හැකියි. තිරස් අතට නිවාස ඉදිකිරීමේදී භූමි පරිභෝජනය වැඩිවීමෙන් අනාගතය වෙනුවෙන් පරිසරයේ සුරක්ෂිත කරගත යුතු සංවේදී ස්ථාන අහිමි විය හැකියි. අතීතයේ විවිධ රජය යටතේ දැකගත හැකි වූ ආකාරයට ම නිවාස ව්‍යාපෘතිවලින් කුඩා කුඩා නිවාස තනි තනි ව තිරස් අතට ඉදි වුවහොත් භූමි පරිභෝජනය විශාල වශයෙන් සිදු වනවා. එය අනාගතයේදී රටක් ලෙස අපට ඉතා අවාසිදායක වන්නට පුළුවන්."

මේ නිවාස ලබා දිය යුත්තේ නිවාසලාභීන්ගේ ප්‍රධාන ජීවනෝපාය පිළිබඳ ව ද සලකා බලමින්. එනම් සිය ජීවනෝපාය ඉදිරියටත් කරගෙන යෑමට පහසුකම් ඇති ප්‍රදේශවලිනුයි නිවාස ලබාදිය යුත්තේ. නිදසුනක් ලෙස ධීවර කර්මාන්තය ජීවනෝපාය කරගත් පිරිස් මුහුදුකරයෙන් බොහෝ ඈතක පදිංචි කරවීම යෝග්‍ය නොවන බවයි මහාචාර්ය මයුර සමරකෝන් සඳහන් කරන්නේ. විශේෂයෙන් ජීවන වෘත්තිය, අපේ සමාජ සංස්කෘතියත් සමඟ සම්බන්ධ වී තිබෙනවා. බොහෝ දෙනෙකු නව ජීවන වෘත්තියකට හැඩගැසීමේ අපහසුතාවක් පෙන්වන නිසා ඒ පිළිබඳවත් සංවේදී විය යුතු වනවා මෙන් ම නිවාස ලබාදීමේදී පාසල් පද්ධති, රෝහල් සහ නිවාසලාභීන්ට ලැබෙන යටිතල පහසුකම් පිළිබඳවත් සැලකිලිමත් වීම වැදගත්. ඔවුන්ට කිසියම් අනන්‍යතාවක් සහ තමන්ගේ වර්ග පරම්පරාව සමග ජීවත්වීමට හැකියාව තිබිය යුතු බව මහාචාර්යවරයා අවධාරණය කරන කරුණක්.

ප්‍රශස්ත අන්දමින් අදාළ ඉලක්ක කලට වේලාවට සපුරාගන්නේනම් මේ නිවාස ව්‍යාපෘතිය මෙරට වසරකදී වැඩි ම නිවාස සංඛ්‍යාවක් සාදා නිම කරන නිවාස ව්‍යාපෘතිය බවට පත් වනු ඇති. ඒ වෙනුවෙන් මේ වන විටත් රජය විශේෂ වැඩපිළිවෙළක් දියත්කොට අවසන්. එහි ප්‍රගතිය නුදුරු දිනෙක ඵල දරනු දැකීම නිවාසලාභීන්ගේ පරම සිහිනය වනු නොඅනුමානයි.



# ආරෝග්‍යා පරමා ලාභා

**රංගිකා අබේසේකර**

ප්‍රාථමික සෞඛ්‍යය දියුණු තත්ත්වයට පත් නොකළ රටක සෞඛ්‍ය සේවාව අස්ථාවර බවයි ලෝක සෞඛ්‍ය සංවිධානයේ ස්ථාවරය. සෞඛ්‍ය සේවාව ස්ථාවර වූ රටක් සාර්ව සෞඛ්‍ය ආවරණය (UHC-Universal Health Coverage) කළ රටක් ලෙසයි සැලකෙන්නේ. සාර්ව සෞඛ්‍ය ආවරණය යනුවෙන් අදහස් කරන්නේ සියලු ජනතාවට මූල්‍යමය දුෂ්කරතාවකින් තොර ව අවශ්‍ය ගුණාත්මක සෞඛ්‍ය සේවාව අවශ්‍ය අවස්ථාවලදී ඕනෑ ම ස්ථානයක සිට ලබා ගැනීමට හැකි වීම. එය රෝගයක් වැළැක්වීම, ප්‍රතිකාර ලබාගැනීම, පුනරුත්ථාපනය සහ සහන සත්කාර දක්වා අත්‍යවශ්‍ය සෞඛ්‍ය සේවාවල අඛණ්ඩතාව ආවරණය කරන ක්‍රියාවලියක්. 2030 වසරේ තිරසර සංවර්ධන ඉලක්ක අතර සාර්ව සෞඛ්‍ය ආවරණය ද ඇතුළත් ව තිබෙනවා.

ඒ ඉලක්කය වෙත යාමේ අරමුණින් 'ආරෝග්‍යා සෞඛ්‍ය සුවතා මධ්‍යස්ථාන' (Arogya Health Wellness Center) ස්ථාපිත කිරීමට වත්මන් ආණ්ඩුව තීරණය කර තිබෙනවා. මේ වැඩසටහනේ දෙවැනි අදියර නොබෝදා (ජනවාරි 24) නියමු ව්‍යාපෘතියක් ලෙස ආරම්භ කෙරුණා. ඒ, දිස්ත්‍රික්ක 21ක ආරෝග්‍යා සෞඛ්‍ය සුවතා මධ්‍යස්ථාන 42ක් ස්ථාපිත කිරීමට ආරම්භයක් ගනිමින්. මේ ව්‍යාපෘතිය සඳහා 2026 අය වැයෙන් වෙන් කර ඇති මුදල රුපියල් මිලියන 1500ක්. ඒ මුදලින් මධ්‍යස්ථාන 250ක් මේ වසරේ ස්ථාපිත කිරීමයි ඉලක්කය. ඊට අමතර ව බිලියන 5ක ලෝක බැංකු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වෙනවා. ඒ යටතේත් ප්‍රාථමික සෞඛ්‍යයට අදාළ ව ප්‍රතිපාදන වෙන් කරන බවයි සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (ප්‍රාථමික සෞඛ්‍ය සේවා), සෞඛ්‍ය පරිපාලනය පිළිබඳ විශේෂඥ වෛද්‍ය කේ. ඩබ්ලිව්. සරත්චන්ද්‍ර කුමාරවංස සඳහන් කරන්නේ. නව ගොඩනැගිල්ලක් සහිත ව නව සුවතා මධ්‍යස්ථාන 25ක් සෑදීමයි එහි සැලසුම. සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කර ඇති සෞඛ්‍ය මධ්‍යස්ථාන 300ක් ද දීප ව්‍යාප්ත ව තිබෙනවා. ඒවා නවීකරණය කර එක් වෛද්‍යවරයෙක්, හෙද නිලධාරිනියක්, සෞඛ්‍ය කාර්ය මණ්ඩලයක් හා පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියක් ඇතුළු ව සියලු දෙනා ඒකරාශී කරමින් එක වහලක් යට ග්‍රාමීය ප්‍රජාවට සෞඛ්‍ය සේවා පහසුකම ආරෝග්‍යා සුවතා මධ්‍යස්ථානයෙන් ලබාදීමටයි සැලසුම් යොදා ඇත්තේ. මෙය වසර 5කින් සම්පූර්ණ වන ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක වෙනවා.

මෙහි පළමු වැනි නියමු ව්‍යාපෘතිය ගාල්ල (මාපලගම), රත්නපුර (ඇත්ඔය), කළුතර (තල්පිටිය), මහනුවර (පොල්ගොල්ලවත්ත) සහ මාතලේ (දන්කන්ද) දිස්ත්‍රික්කවලදී ආරම්භ කළේ සෞඛ්‍ය සම්පන්න ශ්‍රී ලංකාවක් ඇති කිරීමේ අරමුණින්. නව සෞඛ්‍ය ප්‍රතිපත්තිය යටතේ 2030 වසර වන විට ප්‍රාථමික සෞඛ්‍ය මධ්‍යස්ථාන 1000ක සේවාව ක්‍රියාත්මක කිරීමට නියමිත බවත් සෑම දිස්ත්‍රික්කයක ම මධ්‍යස්ථාන 2ක් ස්ථාපිත කරන බවත් එය කළුතර දිස්ත්‍රික්කයෙන් ආරම්භ කරන බවත් ප්‍රාථමික සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා අවධාරණය කළ කරනවා.

ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සේවාව ආරම්භ කර ඇත්තේ 1926 වසරේදී ප්‍රාථමික රෝග නිවාරණ අංශයක් ලෙස කළුතර දිස්ත්‍රික්කයෙන්. මෙරට සෑම පුරවැසියෙකුට ම නිදහස් සෞඛ්‍ය සේවාව ලබාදීමට සැලසුම් ආරම්භ කර ඇත්තේ 1930 වසරේදී. එම වසරේ සිට යම්තාක්දුරට නිදහස් සෞඛ්‍ය සේවාව ක්‍රියාත්මක වෙමින් තිබුණ ද නිසියාකාර ව ඒ සේවාව පුරවැසියන්ට ලැබෙන්නේ 1950 වසරේ සිට. බෝ වන රෝගවලින් මෙරට මිය යන රෝගීන්ගේ සංඛ්‍යාව ඉහළ මට්ටමක පැවතීම, පෝෂණය ගැටලු හා සනීපාරක්ෂක පහසුකම්වල හිඟකම එවකට පැවැති ප්‍රධාන සෞඛ්‍ය ගැටලු වුණා. මේ හේතු නිසා 1930 වසරේ ආරම්භ කළ සෞඛ්‍ය සේවාවේ වැඩි අවධානයක් ලබා දී තිබුණේ රෝග නිවාරණයට සහ මාතෘ ළමා සෞඛ්‍ය කෙරෙහි. ඒ අනුව මෙරට සෞඛ්‍ය සේවාව ආරම්භ කර 2026 වසරට වසර 100ක් සපිරෙනවා.

මුල් ශතවර්ෂවලට සාපේක්ෂ ව වර්තමානය වන විට ශ්‍රී ලංකාව නව සෞඛ්‍ය ගැටලුවලට මුහුණ පා සිටිනවා. විශේෂයෙන් ඒවා අතර ප්‍රමුඛස්ථානය ගන්නේ බෝ නොවන රෝග. බෝ නොවන රෝග හේතුවෙන්

මෙරට ජනගහනයෙන් 83%ක් මිය යනවා. සිදුවන අකල් මරණ ගණන ප්‍රතිශතාත්මක ව 17%-20%ත් අතර ඉහළ අගයකයි පවතින්නේ. වර්තමානයේ තිදෙනෙකුගෙන් එක් අයෙකුට අධි රුධිර පීඩනය, සිව් දෙනෙකුගෙන් එක් අයෙකුට දියවැඩියාව, දළ වශයෙන් වසරකට 60,000කට අංශභාග රෝගය වැළඳෙන බවත් දෛනික ව පිළිකා රෝගීන් 100ක් වාර්තා වෙන බවත් තරුණ ජනගහනයෙන් 20%ක් මානසික අවපීඩනය (Depression) වැනි මානසික රෝගවලට ගොදුරු වන බවත් වයස අවුරුදු 40ට වැඩි ජනගහනයෙන් 20%ක් ඇදුම වැනි දීර්ඝකාලීන ශ්වසන රෝගවල පංගුකාරයන් වන බවත් විශේෂඥ වෛද්‍ය කේ. ඩබ්ලිව්. සරච්චන්ද්‍ර කුමාරවංස අවධාරණය කරනවා.

බෝවන රෝග සියල්ල ඒන්නත්වලින් තුරන් කිරීම, 90%කට ම පුද්ගලික සනීපාරක්ෂාව වර්තමානය වන විට ලැබී තිබීම, අධික මන්දපෝෂණය තුරන් වී ගොස් එය එක් එක් වයස් කාණ්ඩවලට පමණක් සීමා වී තිබීම, 1950 කාලයේ තිබූ වයස අවුරුදු 55 ආයු අපේක්ෂාව වර්තමානය වන විට වයස අවුරුදු 77ක් දක්වා වර්ධනයක් දැක ගත හැකි වීම, එකල මාතෘ මරණ අනුපාතය 100,000:500ක් සහ වර්තමානය වන විට එය 100,000:25ක සීමාව දක්වා වන ලෙස අවම කර ගැනීමට හැකියාව ලැබීම වැනි කාරණා 1930 වසරේ සිට මේ දක්වා රෝග නිවාරණ අංශයට ප්‍රමුඛත්වයක් ලබාදීමෙන් සිදු වූ ජයග්‍රහණ ලෙසයි හඳුනාගත හැක්කේ.

බෝවන රෝග සියල්ල එන්නත්වලින් තුරන් කිරීම, 90%කට ම පුද්ගලික සනීපාරක්ෂාව වර්තමානය වන විට ලැබී තිබීම, අධික මන්දපෝෂණය තුරන් වී ගොස් එය එක් එක් වයස් කාණ්ඩවලට පමණක් සීමා වී තිබීම, 1950 කාලයේ තිබූ වයස අවුරුදු 55 ආයු අපේක්ෂාව වර්තමානය වන විට වයස අවුරුදු 77ක් දක්වා වර්ධනයක් දැක ගත හැකි වීම, එකල මාතෘ මරණ අනුපාතය 100,000:500ක් සහ වර්තමානය වන විට එය 100,000:25ක සීමාව දක්වා වන ලෙස අවම කර ගැනීමට හැකියාව ලැබීම වැනි කාරණා 1930 වසරේ සිට මේ දක්වා රෝග නිවාරණ අංශයට ප්‍රමුඛත්වයක් ලබාදීමෙන් සිදු වූ ජයග්‍රහණ ලෙසයි හඳුනාගත හැක්කේ.

කාලයෙන් කාලයට නවීන තාක්ෂණයත් සමඟ ඉදිරියට ගමන් කිරීමේදී සෞඛ්‍ය සේවාව ද තවදුරටත් පුළුල් විය යුතු බව පෙනී යනවා. ඒ පිළිබඳ අදහස් දක්වන විශේෂඥ වෛද්‍ය කේ. ඩබ්ලිව්. සරත්චන්ද්‍ර කුමාරවංස; "1950 දශකයේ පැවති සෞඛ්‍ය ගැටලු සඳහා සාර්ථක පිළියම් යොදා ඒවා ජයග්‍රහණය කළත් මේ දශකයට උචිත ලෙස අප සැලසුම් සැකසිය යුතුයි. ඒ අනුව 2018 වසරේදී ප්‍රාථමික සෞඛ්‍ය ප්‍රතිපත්තියක් සැකසුවා. එහි අන්තර්ගත වන්නේ ජනගහනයෙන් 5000ක් ආවරණය වන පරිදි පවුලේ වෛද්‍යවරයෙකු හඳුනාගෙන රෝග නිවාරණය සඳහා පහසුකම් සැලසීමට හැකි වන ලෙස ප්‍රාථමික සත්කාරක සේවා සපයන මධ්‍යස්ථාන තවදුරටත් ශක්තිමත් කළ යුතු බව".

දියුණු රටවල ක්‍රියාත්මක GP System (General Practitioner System) යනු ප්‍රදේශයකට වෙන් වූ ප්‍රාථමික සත්කාර වෛද්‍යවරයෙකු හදිසි නොවන අවස්ථාවල සෞඛ්‍ය ගැටලු සඳහා පුළුල් පරාසයක සිට අඛණ්ඩ ව රෝග විනිශ්චය කර ප්‍රතිකාර කිරීම, නිදන්ගත තත්ත්ව කළමනාකරණය, රෝගියාගේ ශාරීරික හා මානසික තත්ත්ව ඇතුළු ව සමස්ත යහපැවැත්ම සලකා බැලීම සහ රෝගීන් විශේෂඥ වෛද්‍යවරුන් වෙත යොමු කිරීම යන ක්‍රියාවලිය. ආරෝග්‍යා සෞඛ්‍ය සුවතා මධ්‍යස්ථාන යනු එවැනි සේවාවක් මෙරට ක්‍රියාත්මක කිරීමක්. විශේෂඥ වෛද්‍ය කේ. ඩබ්ලිව්. සරත්චන්ද්‍ර කුමාරවංශය සඳහන් කරන්නේ එංගලන්තය, ඩෙන්මාර්කය, තායිලන්තය හා ඉන්දියාව ඇතුළු රටවල් 5ක GP ක්‍රමවේද අධ්‍යනය කරමින් සෞඛ්‍ය සුවතා මධ්‍යස්ථාන සංකල්පය සැකසූ බව.

සෑම මධ්‍යස්ථානයකට ම පවුල් වෛද්‍යවරයෙකු, ප්‍රජා සෞඛ්‍ය හෙදියක් සහ සම්බන්ධීකරණ නිලධාරියකු ඇතුළු සෞඛ්‍ය සේවා කණ්ඩායමක් ඇතුළත්. මේ මධ්‍යස්ථාන බෝ නොවන රෝග සඳහා ප්‍රතිකාර සහ උපදේශනය, මානසික සෞඛ්‍යය, වැඩිහිටි ජනගහනය, පුනරුත්ථාපනය සහ සහන සත්කාර, ප්‍රාථමික අක්ෂි, මුඛ සහ මානසික සෞඛ්‍ය සේවා, පෝෂණ උපදේශන සහ මධ්‍යසාර පුනරුත්ථාපන සේවා, තරුණ හා නවයොවුන් සත්කාර සේවා වැනි ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කර සේවා සපයනු ඇති. මෙහි මූලික ඉලක්කය වන්නේ රෝගීන්ට සංකූලතා ඇතිවී රෝහල්ගතවීමට පෙර හඳුනා ගැනීම.

ව්‍යාපෘතියෙහි ප්‍රතිලාභ ලබන්නන් සම්බන්ධයෙන් අදහස් දක්වන විශේෂඥ වෛද්‍ය කේ.ඩබ්ලිව්. සරත්චන්ද්‍ර කුමාරවංස; "රෝගය කලින් හඳුනා ගැනීම, පාලනය කිරීම සඳහා සායන පැවැත්වීම හා පසු විපරම් කිරීම මේ ආරෝග්‍යා සෞඛ්‍ය සුවතා මධ්‍යස්ථාන ඔස්සේ සිදු වෙනවා. මෙහිදී බෝ නොවන රෝග ක්‍රමවත් ව පාලනය, ඒවා වැළඳෙන සංඛ්‍යාව අවම කිරීම, අකල් මරණ සංඛ්‍යාව පහළ යාම, පිළිකා ඇතිවීම සහ පිළිකා රෝගීන් කලින් හඳුනා ගැනීම වැදගත්. වැඩිහිටියන් සක්‍රීය වයස්ගත වීමකට යාම අවශ්‍යයි. ඒ සඳහායි වැඩිහිටි සෞඛ්‍යය හඳුන්වා දෙන්නේ. ආබාධිත ප්‍රජාව පුනරුත්ථාපනය කර රටේ ආර්ථික ක්‍රියාවලියට දායක කරගැනීම, තරුණ ප්‍රජාව මත්ද්‍රව්‍ය භාවිතයෙන් වළක්වා ගැනීම, මානසික රෝග හේතුවෙන් වන සියදිවි නසාගැනීම් අවම කර ගැනීම, විශේෂයෙන් තරුණ ප්‍රජාව අතර පවතින මානසික අවපීඩන තත්ත්වය (Depression) අවම කිරීම සහ ඔවුන්ගේ සෞඛ්‍යය ඉහළ නැංවීම, අක්ෂි අබාධ කලින් හඳුනාගෙන අන්ධභාවය වළක්වා ගැනීම සහ පෝෂණය සම්බන්ධ ගැටලු අඩුකර ගැනීම මේ ව්‍යාපෘතිය ඔස්සේ ලැබෙන අවකාශ. මෙයින් රටේ ආර්ථිකයට වන දායකත්වය වැඩි කර ද්විතීයික සහ තෘතීයික රෝහල්වලට යන වියදම අඩු කරගැනීමට හැකියාව ලැබෙනවා".

මේ අනුව මහජන සෞඛ්‍ය පද්ධතියේ ගුණාත්මකභාවය ඉහළ නැංවීමට සහ සෞඛ්‍ය සේවා අසමානතා අඩු කිරීමට මේ ව්‍යාපෘතිය ඔස්සේ හැකියාව ලැබෙනු ඇති.




# විමුක්තිවාදී නිදහස

**වංගීස සුමනසේකර**

එමීල් බෙන්විනිස්ට් නම් කේන්ද්‍රීය ප්‍රංශ වාග් විද්‍යාඥයාගේ 'Dictionary of Indo-European Concepts and Society" නම් 1969 වසරේ පළ වූ අතිශය බලපෑම්සහගත වාග්විද්‍යාත්මක අධ්‍යයනය මෙහිදී අපට මග පෙන්වීමක් කරනවා. මේ කෘතිය පුරා බෙන්විනිස්ට් උත්සාහ කරන්නේ අපගේ වර්තමානය සකස් වී ඇති සමාජීය සහ ආයතනික වචන මාලාව ඉන්දු-යුරෝපීය භාෂාවල විවිධ ආකාරයෙන් ව්‍යවහාර වී ඇති ආකාරය සහ ඒවා විකාශනය වී ඇති ආකාරය පෙන්වා දීමට.

මෙහිදී අපට වැදගත් වන්නේ 'නිදහස් මිනිසා' යන අර්ථය හිමි eleútheros යන ග්‍රීක වචනයේ සහ 'වහලා' යන අර්ථය ඇති 'doúlos' යන ග්‍රීක වචනයේ විකාශනය ගැන බෙන්විනිස්ට් සිදුකරන පැහැදිලි කිරීම. බෙන්විනිස්ට් විසින් නිරාවරණය කර ගන්නා ලද අනපේක්ෂිත අදහසක් නම් 'eleútheros' සහ එහි ලතින් සමාන පදය වන 'liber' යන වචනවල මුල් අර්ථය වන්නේ 'යමකින් ගැලවීම', 'යමකින් නිදහස් වීම' වැන්නක් නොව 'වාර්ගික කුලකයකට අයිති වීම' යන්න. එයින් හැඟවුම්කරණය කරන්නේ එක්තරා වරප්‍රසාදිත සමාජ කුලකයකට අයිති වීම යන්න. 'නිදහස් මිනිසා' යනු එම සමාජ කුලකයේ උපත ලැබීමට වාසනාවන්ත වන මිනිසා. එයින් අර්ථවත් වන්නේ එම සමාජ කුලකයට අයිති නොවන මිනිසුන් සඳහා නොමැති වරප්‍රසාදවල හිමිකාරිත්වය. එම නිසා ම 'නිදහස්' මිනිසුන් සිටිය හැකි වන්නේ නිදහස අහිමි වූ අනෙකුන්, වහලුන්, දුප්පතුන්, විදේශිකයන්, පරයන්, පිටගම්කාරයන් සිටිනා තැනක පමණයි.

මෙය සිංහල භාෂාවට සම්බන්ධ වන ආකාරය පවා බෙන්විනිස්ට් ඔස්සේ අපට පහසුවෙන් ලකුණු කළ හැකියි. ඒ, 'frei' යන ජර්මන් වචනයේ සහ 'free' යන ඉංග්‍රීසි වචනයේ මුල් ඉන්දු-යුරෝපීය ආකෘතිය ලෙස 'priyos' යන්න ගත හැකි වනවා කියා බෙන්විනිස්ට් සිදුකරන පැහැදිලි කිරීම සමඟ. බෙන්විනිස්ට් පැහැදිලි කරන ආකාරයට 'priya' යන සංස්කෘත වචනය බිඳී එන්නේ ද මෙයින්. 'ප්‍රිය' යන සිංහල වචනයේ නිරුක්තිය ලෙස ගත හැකි මේ වචනයේ අර්ථය වන්නේ 'අප කැමති', 'අප ඇසුරු කිරීමට කැමැත්ත ඇති' වැනි අර්ථයක් බව අප දන්නා කරුණක්. අප ඇසුරු කිරීමට කැමති වන්නේ, අපට 'ප්‍රිය' වන්නේ අප අයත් සමාජ කුලකයේ මිනිසුන්. වඩාත් සරල ලෙස ප්‍රියයන් යනු 'අපේ කට්ටිය'. ප්‍රියයන්ගෙන් වෙන්වීම දුකක් වන්නේ එම නිසා. 'ප්‍රිය' යන සිංහල වචනය සහ 'free' යන ඉංග්‍රීසි වචනය අතර සම්බන්ධය මෙයින් පැහැදිලි වෙනවා. එම සම්බන්ධය වන්නේ අපට හුරුපුරුදු, තෝරා ගත්, වරප්‍රසාදිත සමාජ කුලයකට අයත් වන යන්න. 'නිදහස' යනු ඓතිහාසික ව, තෝරා ගත් සුළු පිරිසකට අයත් වීමේ වරප්‍රසාදය. ලිබරල් සමාජය යනු ප්‍රියයන්ගේ සමාගම.

මේ අර්ථයෙන් ලිබරල්වාදය යනු නිදහස යන අදහසේ අව්‍යාජ ප්‍රකාශනයක් ලෙස අපට සත්‍ය වශයෙන් ම සැලකිය හැකියි. එහිදී නිදහස් මිනිසුන් යන්නට අයත් නොවන්නන් සඳහා සිය වරප්‍රසාද දරුණු




අප සැමදාමත් හදිසියේදී එකිනෙකාට උපකාර කරගන්නා සාමුහික හැඟීමක් ඇති ප්‍රජාවක්. මේ දුෂ්කර මොහොතේදී අප අත්දුටුවේ ද එයයි. මෙවර ශ්‍රී ලංකාවේ නිදහස් දින සැමරුම අලුත් බලාපොරොත්තුවක් ගෙන එන්නේ ඒ නිසා. සත්‍ය වශයෙන් ම විමුක්තිවාදී නිදහස් ජාතියක අනාගත සැමරුමක් පිළිබඳ බලාපොරොත්තුවක් අද අපට තිබෙනවා. එම නිසා සත්‍ය වශයෙන් ම අලුත් නිදහස් දිනය වෙනුවෙන් යෝජනා කරන්න තිබෙන්නේ ද ඒ ඉපැරණි සටන් පාඨය මිස අන් දෙයක් නොවෙයි. නිදහස, සමානාත්මතාව සහ සහෝදරත්වය !.

ලෙස අභිමි වීම කිසිසේත් පරස්පරයක් ලෙස සැලකීමට නොහැකියි. නිදහස යනු ම මෙවැනි සමාරම්භක බෙදීමක් මත පදනම් වන්නක්.

එක්වර ම හුදු වචන සෙල්ලමක් ලෙස පෙනී ගිය ද මෙය බැලූබැල්මට පරස්පර විරෝධී කියා සිතෙන ඓතිහාසික අත්දැකීමක් තේරුම් ගැනීමට අපට මග පාදනවා. එම අත්දැකීම වන්නේ ඉංග්‍රීසි, නෙදර්ලන්ත සහ ඇමරිකානු විප්ලවවලින් පසුව මානව ඉතිහාසයේ කිසිදා නොතිබුණු ආකාරයේ වහල් සේවයක් ආරම්භ වීම. මේ රටවල් පැරණි රාජාණ්ඩුවල පාලනයෙන් නිදහස් වීම නිසා සිදුවන්නේ එම සමාජවල මිනිසුන් 'නිදහස්' වීම නොවෙයි. ඒ වෙනුවට එහිදී සත්‍ය වශයෙන් ම සිදුවන්නේ එවැනි සමාජයෙන් ඍජු වහල් සේවය වේගයෙන් වැඩි වීම. නිදර්ශනයක් ලෙස වර්ෂ 1700 වන විට 330,000ක් ලෙස පැවති ඇමරිකාවේ වහල් ජනගහනය වසර 1800 වන විට මිලියන තුනක් පමණ දක්වා වර්ධනය වන අතර 1850 දශකය වන විට මිලියන 06ක් දක්වා වර්ධනය වෙනවා. උක් වගාව සඳහා මහා පරිමාණ වහල් සේවයක් ඇති කිරීම ආරම්භ කරන්නේ නෙදර්ලන්ත ජාතිකයන්. එහෙත් 18 වැනි සියවසේ මැදභාගය වන විට වහල් වෙළෙඳාමේ ප්‍රමුඛස්ථානය නෙදර්ලන්තයෙන් මහා බ්‍රිතාන්‍යය අතට හුවමාරු වන්නේ 878,000ක වැඩි ම වහලුන් සංඛ්‍යාවක් සහිත රාජ්‍යය ලෙස. පොදුවේ ගත්විට මේ රටවල් තුන ම වහල් සේවයේ සහ වහල් වෙළෙඳාමේ ගෝලීය ප්‍රමුඛයන්.

වසර ගණනක් පෙබරවාරි 04 දින අප සමරන ලද 'නිදහස' තේරුම් ගත යුතු නිශ්චිත ඓතිහාසික ප්‍රවේශය මෙයයි. 1948 වසරේ සිට සෑම වසරක ම ලංකාවේ රාජ්‍ය පාලකයන් දිනා ගත් උතුම් නිදහසක් පිළිබඳ ව අපට කතා පවත්වා තිබෙනවා. එම නිදහස දිනා ගැනීමේ 'සටනට' නායකත්වය දුන් 'ජාතික වීරයන්' ගැන කියා තිබෙනවා. එහෙත් එම වීරයන් විසින් දිනවා දෙනු ලැබූ නිදහස් ලංකාවේ සමස්ත ඉතිහාසය ම පිරී තිබෙන්නේ බිහිසුණු අත්දැකීම්වලින්. දශක තුනකට වැඩි සිවිල් යුද්ධයකට අප මුහුණ දුන්නා. දකුණේ තරුණයන් නායකත්වය දුන් සන්නද්ධ නැගී සිටීම් දෙකක් අත්දැක්කා. නිදහස් රටේ ජනයා තළා පෙළා සිය සිතැඟි පරිදි රට පාලනය කළ දේශපාලන පන්තියක් දුටුවා. අවසානයේදී ඔවුන් අපට ඉතිරි කර දුන්නේ දූෂිත, පිරිහුණු, අසාර්ථක රාජ්‍ය යන්ත්‍රයක් සහ බංකොලොත් ආර්ථිකයක්.

නිදහස කිසිදා එහි ම අර්ථයෙන් යහපතක් නියෝජනය කරන්නේ නැහැ. නිදහස සත්‍ය වශයෙන් ම විමුක්තිවාදී වන්නේ එය සමානාත්මතාව සහ සහෝදරත්වය සමඟ එක් වූ විට. මේ තිබෙන්නේ ප්‍රංශ විප්ලවයේ ඓතිහාසික සටන් පාඨය කියා අප දන්නවා. දේශපාලන විශ්වීයත්වය ප්‍රංශ විප්ලවයෙන් ආරම්භ වූවා කියා කියන්නේ මේ නිසා.

මෙවර අප සාම්ප්‍රදායික ජාතික නිදහස් දිනය සමරන නිශ්චිත සන්දර්භය ගෙන එන්නේ මේ ආකාරයේ රැඩිකල් නිදහසක් පිළිබඳ බලාපොරොත්තුවක්. මින් අදහස් කරන්නේ දිට්වා සුළි කුණාටුවට පසුව මෙරට ජනයා පෙන්වූ සාමුහිකත්වයයි. ජාතියක් වශයෙන් අප ආඩම්බර විය යුතු එක් චරිත ලක්ෂණයක් වන්නේ මේ සාමුහිකත්වය. අප සැමදාමත් හදිසියේදී එකිනෙකාට උපකාර කරගන්නා සාමුහික හැඟීමක් ඇති ප්‍රජාවක්. මේ දුෂ්කර මොහොතේදී අප අත්දුටුවේ ද එයයි.

මෙවර ශ්‍රී ලංකාවේ නිදහස් දින සැමරුම අලුත් බලාපොරොත්තුවක් ගෙන එන්නේ ඒ නිසා. සත්‍ය වශයෙන් ම විමුක්තිවාදී නිදහස් ජාතියක අනාගත සැමරුමක් පිළිබඳ බලාපොරොත්තුවක් අද අපට තිබෙනවා. එම නිසා සත්‍ය වශයෙන් ම අලුත් නිදහස් දිනය වෙනුවෙන් යෝජනා කරන්න තිබෙන්නේ ද ඒ ඉපැරණි සටන් පාඨය මිස අන් දෙයක් නොවෙයි. නිදහස, සමානාත්මතාව සහ සහෝදරත්වය !.

# ලෝක දේශපාලනයේ ආර්ථික ඵල





ජ්‍යෙෂ්ඨ මහාචාර්ය
**ප්‍රසන්න පෙරේරා**
අංශාධිපති
ආර්ථික හා සංඛ්‍යාන විද්‍යා
දෙපාර්තමේන්තුව
පේරාදෙණිය විශ්වවිද්‍යාලය

**ප්‍රශ්නය**

**ලෝක දේශපාලනයේ වෙනස්කම් සහ පවතින දේශපාලන අර්බුද ගෝලීය ආර්ථිකයට බලපාන්නේ කෙසේ ද?**

**පිළිතුර**

වර්තමාන භූ-දේශපාලන තත්ත්වය විවිධාකාරයෙන් ලෝක ආර්ථිකයට බලපානවා. පලස්තීන-ඊශ්‍රායල, යුක්රේන රුසියානු යුද්ධය, ඇමෙරිකා එක්සත් ජනපද ජනාධිපතිවරයාගේ හදිසි තීරණ, ඉරානයේ පවතින දේශපාලන අර්බුදය, වෙනිසියුලාව, සුඩානය, ඉතියෝපියාව-එරිත්‍රියාව, මාලි සහ බුර්කිනා ෆාසෝ, සිරියාව, ඊශ්‍රායලය සහ එක්සත් ජනපදය එදිරි ව ඉරානය සහ හූතිවරු, මියන්මාරය, ඇෆ්ගනිස්ථානය-පාකිස්තානය, තායිලන්තය-වියට්නාමය, ඇමෙරිකාව-ග්‍රීන්ලන්තය ආශ්‍රිත ව යුරෝපා සංගමය ආදී වශයෙන් ලෝක දේශපාලනයේ අර්බුද පවතිනවා.

පලස්තීන-ඊශ්‍රායල අර්බුදය මැද පෙරදිග අස්ථාවර කරමින් තෙල් මිල උච්චාවචනයක් නිර්මාණය කර තිබෙනවා. සූවස් ඇල හරහා ගමන් කරන තීරණාත්මක නාවික ගමන් මාර්ගයට බාධා කරමින් සිටිනවා. රතු මුහුදේ නැව් ගමනාගමනයට එරෙහි මෑතකාලීන හූතී ප්‍රහාර වැඩිවීම නිසා භාණ්ඩ ප්‍රවාහන පිරිවැය වැඩි වී ඇත්තේ සියයට 200-300කින් පමණ. මේ නිසා වර්තමානයේ ගෝලීය උද්ධමනයක් ද නිර්මාණය වෙමින් තිබෙනවා.

රුසියානු-යුක්රේන යුද්ධය ලෝක බලශක්ති හා ආහාර සැපයුම් දාම සහ ගෝලීය ආයෝජන පිළිබඳ ඇති විශ්වසනීයත්වයයි කඩාකප්පල් කර තිබෙන්නේ. ලෝක වෙළෙඳපොළේ තිරිඟු හා පොහොර මිල සැලකිය යුතු ලෙස ඉහළ යෑමකට මේ තත්ත්වය හේතු වුණා. වෙළෙඳාම මෙන් ම නිමැවුම් කඩාකප්පල් වීම නිසා ගෝලීය දළ දේශීය නිෂ්පාදිතය සියයට එකකින් (1%) පමණ, එනම් ඇමරිකානු ඩොලර් ට්‍රිලියන 1.5කින් පහළ යා හැකි යැයි පුරෝකථනය කර තිබෙනවා. නිරීක්ෂණය වන්නේ සංවර්ධනය වෙමින් පවතින රටවල ආහාර අනාරක්ෂිතතාව වැඩි කරමින්, ලෝක ව්‍යාප්ත උද්ධමනයට මේ වාතාවරණය පදනම සපයමින් සිටින බවක්. යුරෝපීය ආර්ථිකය බලශක්ති අර්බුදවලට මුහුණදෙමින්, රුසියානු ගෑස්වලින් මිදීමට මිල අධික විකල්ප බලශක්ති ප්‍රභව සඳහා මාරු වීමට උත්සාහ ගන්නවා.

ජනාධිපති ට්‍රම්ප්ගේ හදිසි ප්‍රතිපත්ති තීරණ ඇතිකර තිබෙන්නේ යෝජිත තීරුබදු සහ වෙළෙඳ සීමා ඇතුළු ව ජාත්‍යන්තර වෙළෙඳපොළ අවිනිශ්චිතතාවක්. ඔහුගේ 'පළමු ව ඇමරිකාව' මූලික කරගත් ප්‍රවේශය පවතින වෙළෙඳ සහ ආයෝජන ගිවිසුම්වලට තර්ජනයක්. තීරුබදු සහ වෙළෙඳ ප්‍රතිපත්තිවලින් පහළ දමා තිබෙනවා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ගෝලීය වර්ධන ප්‍රක්ෂේපණ සියයට 0.4-0.5කින් පමණ. එක්සත් ජනපදය දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය අඩු කර තිබෙනවා. ගෝලීය මිල මට්ටම් ඉහළ නංවා ඇති අතර සැපයුම් දාම කඩාකප්පල් කරමින් ගෝලීය වෙළෙඳ මෙන් ම ගෝලීය ආයෝජන ප්‍රවාහ අඩපණ කර තිබෙනවා.

ඉරානයේ දේශපාලන අස්ථාවරත්වය ඇද දමා තිබෙන්නේ මැද පෙරදිග අවිනිශ්චිතතාව උග්‍ර තත්ත්වයකට. හෝමුස් සමුද්‍ර සන්ධිය හරහා ගමන් කරන ලෝක තෙල් සැපයුමෙන් සියයට 20කට පමණ බාධා ඇති කර තිබෙනවා. මෙය තෙල් මත යැපෙන ආර්ථිකයකට දරුණු ලෙස බලපාවි. ගෝලීය ආර්ථික ක්‍රියාකාරකම් මන්දගාමී කරාවි. උද්ධමන පීඩනය තීව්‍ර කරාවි. මේ වන විටත් ඉරානයේ දළ දේශීය නිෂ්පාදිත වර්ධනය ශූන්‍යයට ආසන්න වී තිබෙනවා. වාර්තා වන්නේ සියයට 43 -48 අතර මට්ටමක උද්ධමනයක්. ඉරානයේ ඇතිවන මේ තත්ත්වය ගෝලීය ආර්ථිකයට නරක ප්‍රතිවිපාක ඇති කරමින් පිටාර ගලා යා හැකියි.

මේ සියලු තත්ත්ව සැලකිල්ලට ගනිමිනුයි ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ ලෝක බැංකුව ගෝලීය ආර්ථික වෘද්ධි වේගය පුරෝකථන ඉතා පහළ මට්ටමක තබාගෙන තිබෙන්නේ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල 2026 සඳහා ලෝක ආර්ථික වර්ධනය සියයට 3.3ක් සහ 2027 සඳහා සියයට 3.2ක් පමණ වනු ඇතැයි පුරෝකථනය කරනවා. ලෝක බැංකුව පුරෝකථනය කරන්නේ 2026 සඳහා සියයට 2.6ක් සහ 2027 සඳහා සියයට 2.7ක් ලෙසින්. මේ ආයතන ගෝලීය ආර්ථික වර්ධනය අඩුවෙන් පුරෝකථනය කරන්නේ පවතින භූ-දේශපාලන හැලහැප්පීම් නිසා.

**ප්‍රශ්නය**

**ඓතිහාසික වශයෙන් ලෝක දේශපාලන ආර්ථික වටපිටාව ශ්‍රී ලංකා ආර්ථිකයට බලපෑම් කළ ආකාරය විමසුමට ලක්කළහොත්?**

**පිළිතුර**

නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ආර්ථිකය ලෝක භූ-දේශපාලන හා ආර්ථික වෙනස්කම් හැසිරීම් අනුව හැඩ ගැසෙන ආකාරයක් පෙනෙනවා. 1970 දශකයේ තෙල් අර්බුදය ශ්‍රී ලංකා ආර්ථිකයට දරුණු ලෙස බලපෑම් කළා. ගෙවුම් ශේෂ අර්බුදය තීව්‍ර කිරීමට මෙය හේතු වුණා. 1977 වසරේදී ආර්ථික ලිහිල්කරණයට බල කෙරුණා. සමාජවාදී විධානගත ආර්ථික පද්ධතියකින් මිදී වෙළෙඳපොළ ඉලක්ක කරගත් ආර්ථික පද්ධතියකට ගමන් කිරීමටයි මේ තත්ත්වය මග පෑදුවේ.

දිගින් දිගට ම ඉරානයත් සමඟ වෙළෙඳාම් කරගෙන ගියහොත් සහ ඇමරිකාව ඊට ඉදිරි ව සියයට 25ක තීරු බද්දක් පැනවුවහොත් ඉරානය සමඟ දැනට වෙළෙඳාමේ නියුක්ත නොමැති බංගලි දේශය, වියට්නාමය වැනි රටවලට සාපේක්ෂ ව වාසිසහගත තත්ත්වයක් උදාවෙනවා. එනම් අපගේ අපනයන වෙළෙඳපොළ ඇහිරී යනවා. මෙය බැරෑරුම් තත්ත්වයක්. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ සිදුකරගෙන ඇති එකඟතා අනුවත් අපට වාර්ෂික ව සියයට 8-10 ප්‍රමාණයකට අපනයන වර්ධනයක් පවත්වාගත යුතු වෙනවා. ට්‍රම්ප්ගේ තීරු බද්ද අපගේ ආර්ථික ගමන් මඟට තීරණාත්මක ව බලපෑම් කළ හැකියි.

සීතල යුද්ධ කාලපරිච්ඡේදයේ ශ්‍රී ලංකාව බටහිර හා නැගෙනහිර කඳවුරු අතර සැරිසරමින් දෙපාර්ශ්වයෙන් ම ආධාර ලබා ගත්තා. 1991 වසරේදී සීතල යුද්ධය අවසන් වීමත් සමඟ අපට ලැබුණු භූ-දේශපාලන ආධාර ප්‍රවාහ අඩු වුණා. ජාත්‍යන්තර මූල්‍ය ආයතන මත වැඩි යැපීමක් සහ ආර්ථික ප්‍රතිපත්ති ව්‍යුහාත්මක ගැලපුම් වැඩසටහන්වලින් ප්‍රතිව්‍යුහගත කිරීමකට ලක්වුණා.

2008 වසරේ ඇති වූ ලෝක මූල්‍ය අර්බුදය හේතුවෙන් මෙරට විදේශ ආයෝජන, ප්‍රේෂණ, සංචාරක ඉපැයුම් සහ අපනයන ආදායම් පහළ ගියා. මෑතකදී ඇති වූ කොවිඩ් 19 වසංගතය සංචාරක ඉපයුම් සහ විදේශීය ප්‍රේෂණ කඩාකප්පල් කරමින් ආර්ථික අර්බුදය 2022 වසර වන විට උග්‍ර කළා. අප අමතක කළ යුතු නැහැ ආර්ථිකය ගත් ණය ගෙවාගත්ත නොහැකි ව බංකොලොත් වීමට මේ බාහිර කම්පන ද බලපෑ බව.

**ප්‍රශ්නය**

**ශ්‍රී ලංකාව, ඇමරිකාව හා ඉරානය සමඟ ගනුදෙනු කරන නිසා ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් මෑතකදී ගත් තීරණ ශ්‍රී ලංකාවේ අපනයන ආර්ථිකයට කුමන ආකාරයෙන් බලපෑම් කරාවි ද?**

**පිළිතුර**

ජනාධිපති ට්‍රම්ප් විසින් 2026 ජනවාරි 13 දින ඉරානය සමඟ ව්‍යාපාර කරන සියලු ම රටවලට සියයට 25ක තීරුබද්දක් පැනවීමේ ඉඩකඩක් ඇති බව ප්‍රකාශ කළා. මේ රටවල් දෙක ම සමඟ වෙළෙඳ සබඳතා පවත්වාගෙන යන ශ්‍රී ලංකාවට දැන් මුහුණ දීමට සිදු ව ඇත්තේ උභතෝකෝටිකයකට.

එක්සත් ජනපදය යනු ශ්‍රී ලංකාවේ විශාලතම අපනයන ගමනාන්තය. ඇමරිකාව සමග අපගේ ද්විපාර්ශ්වික වෙළෙඳාම ඩොලර් බිලියන 03-04ක් වෙනවා. වැඩිපුර ම අපනයනය කරන්නේ ඇඟලුම්. ශ්‍රී ලංකාව ඉරානයට අපනයන කරන්නේ ආසන්න වශයෙන් ඩොලර් මිලියන 65-70 අතර ප්‍රමාණයක්. තේ අපනයනය එහිදී ප්‍රමුඛ වෙනවා.

දිගින් දිගට ම ඉරානයත් සමඟ වෙළෙඳාම් කරගෙන ගියහොත් සහ ඇමරිකාව ඊට ඉදිරි ව සියයට 25ක තීරු බද්දක් පැනවුවහොත් ඉරානය සමඟ දැනට වෙළෙඳාමේ නියුක්ත නොමැති බංගලි දේශය, වියට්නාමය වැනි රටවලට සාපේක්ෂ ව වාසිසහගත තත්ත්වයක් උදාවෙනවා. එනම් අපගේ අපනයන වෙළෙඳපොළ ඇහිරී යනවා. මෙය බැරෑරුම් තත්ත්වයක්. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ සිදුකරගෙන ඇති එකඟතා අනුවත් අපට වාර්ෂික ව සියයට 8-10 ප්‍රමාණයකට අපනයන වර්ධනයක් පවත්වාගත යුතු වෙනවා. ට්‍රම්ප්ගේ තීරු බද්ද අපගේ ආර්ථික ගමන් මඟට තීරණාත්මක ව බලපෑම් කළ හැකියි. ඇමරිකානු තීරු බදු වළක්වා ගැනීම සඳහා ශ්‍රී ලංකාව ඉරාන වෙළෙඳාම නතර කළහොත්, එවිට ඩොලර් මිලියන 65-70ක අපනයන ආදායමක් කැප කළ යුතු වෙනවා මෙන් ම වඩා අඩු පිරිවැයකින් තෙල් ආනයනය කර ගැනීමට නොහැකි වෙනවා. මෙතැනදී සිදු වෙන්නේ එක් වෙළෙඳපොළක් රැකගන්නට යාමේදී අනෙක් වෙළෙඳපොළ අනිවාර්යයෙන් ම කැප කිරීමට සිදුවීම. එනම් ආර්ථික විද්‍යාවට අනුව තේරීම පිළිබඳ මූලික ගැටලුවට රටක් විදිහට අපට මුහුණදීමට සිදු වෙනවා.

යම් හෙයකින් ඉරාන ගනුදෙනුවලින් ඉවත් වීමක් වෙනවානම් ඉරානය සමඟ එළඹ ඇති ගිවිසුම්වලට ගෞරව කරමින් තමා එයින් ඉවත් විය යුත්තේ. එසේ නොමැති ව ඒකපාර්ශ්වීය ව ඇමරිකාව කියන නිසා ඉවත් වීම නොකළ යුතුයි. ඉරානය සමඟ විනිවිදභාවයකින් ක්‍රියාකරමින් ඔවුන්ට ඒත්තු ගැන්විය යුතුයි දේශපාලනට වඩා අපගේ ආර්ථික අවශ්‍යතාවලට ප්‍රමුඛතාව දිය යුතු බව. ඇමරිකාව සියයට 25ක තීරු බද්දක් පැනවුවහොත් ශ්‍රී ලංකාවට වාර්ෂික ව ඩොලර් මිලියන 450-600ක අපනයන ආදායමක් මෙන් ම විදේශ විනිමය ඉපැයීම් අඩුවීමට ඉඩ ඇති බවත් රැකියා අවස්ථා 45,000-60,000කට මෙය තර්ජනයක් විය හැකි බවත් අවබෝධ

කරගත යුතුයි. ශ්‍රී ලංකාව ගැටුම්කාරී හෝ දැඩි ලෙස නීතිමය ප්‍රවේශයකට වඩා අවදානම් අවම කිරීමේ හෝ උපාය මාර්ග යකයක් අනුගමනය කළ යුතු වෙනවා. ඒ නිසා ආණ්ඩුව ක්‍රියා කළ යුතු වන්නේ සමබර රාජ්‍යතාන්ත්‍රිකභාවයකින්. අනාගත අවදානම් අඩුකර ගැනීම සඳහා යුරෝපානු සංගමය, ඉන්දියාව සහ චීනය දෙසට අපගේ වෙළඳපොළ මෙන් ම අපනයන විවිධාංගීකරණය කරගැනීමේ වැදගත්කම මෙහිදී ඉස්මතු වෙනවා.

**ප්‍රශ්නය**

**වර්තමානයේ ශ්‍රී ලංකාවට පවතින සුවිශේෂී අභියෝගයක් වන්නේ අපනයන ආදායම ඉහළ මට්ටමක පවත්වා ගැනීම සහ නිල විදේශ සංචිත ඉහළ මට්ටමක පවත්වා ගැනීම. මේ සඳහා ඉදිරියේදී පවතින අභියෝග පිළිබඳ ඔබේ අදහස කුමක් ද? ඒවා ජය ගැනීම සඳහා ඔබ යෝජනා කරන විසඳුම් මොනවා ද?**

**පිළිතුර**

ප්‍රතිපත්ති සම්පාදකයන් මේ අවස්ථාවේදී ප්‍රමුඛතාව දිය යුතු මූලික ම ආර්ථික උපායමාර්ග දෙක වන්නේ අපනයන ආදායම් ඉහළ නංවා ගනිමින් විදේශ සංචිත වැඩිකර ගැනීමට ක්‍රියා කිරීම. ඒ මතයි අපගේ අනාගත ණය ගෙවීමේ හැකියාව රඳාපවතින්නේත්. එතැනදී ට්‍රම්ප්ගේ සියයට 25ක අතිරේක තීරු බද්ද පිළිබඳ අභියෝගය අප හමුවේ තිබෙනවා. විදේශ සංචිත මාස 5-7ක ප්‍රමාණයක් ආනයනය සඳහා භාවිත කළ හැකි ආකාරයට ගොඩනැගීම ද කළ යුත්තක්. ණය තිරසරභාවය පවත්වා ගැනීම සඳහා දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස වාර්ෂික ව දළ මූල්‍යයන අවශ්‍යතාව සියයට 13ක වැනි අගයක පවත්වාගත යුතු වෙනවා. 2032 වර්ෂය පමණ වන විට සමස්ත ණය ධාරිතාව දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සියයට 95 වැනි අගයක පවත්වා ගත යුතු වෙනවා.

භූ දේශපාලනය විසින් ගෝලීය සැපයුම් ජාල, උද්ධමන, වෙළෙඳපොළ ආදී සියල්ල පිළිබඳ අවිනිශ්චිතතාවක් මතු කරනු ලබමින් සිටින වකවානුවකයි අප සිටින්නේ. මේ තමයි අභියෝග.

මේ අභියෝග ජයගැනීමට උපායමාර්ගික විසඳුම් අවශ්‍යයි. අපනයන වෙළෙඳපොළ පමණක් නොවෙයි අපනයනත් විවිධාංගීකරණය විය යුතුයි. ඉහළ එකතු කළ අගයක් සහිත අපනයන සඳහා ප්‍රවේශ විය යුතු වෙනවා. සීමිත අගය එකතු කිරීමක් සහිත ඇඟලුම් සහ භාණ්ඩවල සංකේන්ද්‍රණය වී ඇති පටු අපනයන පදනමෙන් ක්‍රමානුකූල ව අප ඉවත් විය යුතුයි. උදාහරණයක් ලෙස අගය එකතු කළ කෘෂිකර්මාන්තයට ප්‍රමුඛතාව දීම වැදගත්.

තොරතුරු තාක්ෂණ අංශය සහ නිදහස් සේවා අපනයන අංශ ද අවධාරණය කළ යුතු වෙනවා. තොරතුරු තාක්ෂණ සේවා (IT services) අපනයන සහ නිදහස් වෘත්තික (Freelancing) අංශය විශාල විදේශ විනිමය විභවතාවක් සහිත අංශ. මේ ක්ෂේත්‍රය මුහුණදෙන ප්‍රධාන අභියෝග කිහිපයක් තිබෙනවා. ඉහළ තත්ත්වයේ තාක්ෂණික පුහුණුවලත් ශ්‍රම බලකායක හිඟය, අධිවේගී අන්තර්ජාල ආවරණයේ සීමාව, ඩිජිටල් ගෙවීම් පද්ධතිවල අඩුපාඩු සහ ගෝලීය තරගකාරිත්වය මේ අතර ප්‍රධාන අභියෝග.

මේ අභියෝග විසඳීම සඳහා තාක්ෂණ අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම, තාක්ෂණ උද්‍යානවල සංවර්ධනය, නිදහස් සේවා සපයන්නන් (freelancers) සඳහා බැංකු පහසුකම් වැඩිදියුණු කිරීම සහ තාක්ෂණ ආශ්‍රිත ආයෝජන සඳහා බදු නිදහස සහ දිරි ගැන්වීම් අවශ්‍යයි. විශේෂයෙන් මෘදුකාංග සංවර්ධනය (software development), ව්‍යාපාර ක්‍රියාවලි බාහිරකරණය (BPO), ඩිජිටල් අලෙවිකරණය (digital marketing) සහ කෘත්‍රිම බුද්ධිය (Ai)/ Machine Learning වැනි අධි-තාක්ෂණික ක්ෂේත්‍රවලට ප්‍රමුඛතාව දීමෙන් ඉහළ ඩොලර් ආදායමක් උපයාගත හැකියි.

අත්‍යවශ්‍ය නොවන ආනයන සීමා සීමා කිරීම ද වැදගත්. විචක්ෂණශීලී විනිමය අනුපාත ප්‍රතිපත්තිය සහ අඩු වෙළෙඳ පිරිවැයකින් අපනයන තරගකාරිත්වය ශක්තිමත් කිරීමට ක්‍රියා කළ යුතු වෙනවා.

වෙළෙඳ හවුල්කරුවන් සමඟ සාකච්ඡා කරමින් ක්ෂණික රාජ්‍යතාන්ත්‍රික ක්‍රියාමාර්ග ද ගත හැකියි. විශේෂයෙන් දිට්වා සුළි කුණාටුවෙන් විනාශ වූ යටිතල පහසුකම් ගොඩනගමින්, සංචාරක ගමනාන්ත ප්‍රති-ගොඩනැංවීමේ ක්‍රියාවලිය වේගවත් කළ යුතුයි. විදේශ ආයෝජනවලට යොමුවීම ද වැදගත්. එහෙත් මෑතකාලීන ව විදේශ ආයෝජන ලංකාවට ඇද ගැනීමට අප අපොහොසත් වී තිබෙනවා. ඒ පිළිබඳ ආණ්ඩුව විශේෂ අවධානයක් යොමු කිරීම අවශ්‍යතාවක්.

සාකච්ඡා කළේ
**දීප්ත කුමාර බටගොඩ**





# තාක්ෂණයේ භීෂණය

**සුජානි සෙව්වන්දි විජේසුන්දර**

පසුගිය ආපදා සමයේ මහජනතාව නොමඟ යවන ආකාරයෙන් දුස් තොරතුරු ප්‍රචාරණයට සහ ඒවා සත්‍ය බව පෙන්වීමට කෘත්‍රිම බුද්ධිය (Artificial Intelligence-AI) ඇසුරෙන් නිර්මාණය කරන ලද වීඩියෝ යොදා ගත් අවස්ථා සමාජයේ මහත් ආන්දෝලනයක් ඇති කළ බව නොරහසක්. රටක් වඩාත් අසීරු අවස්ථාවක පවතින විට මහජන කැලඹීම් ඇති කරවන මෙවැනි වැරදි තොරතුරු ප්‍රචාරණය සමාජීය වශයෙන් විශාල හානියක්. 2025.11.29 දිනැති ව අංක 2464/32 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට්පත්‍රයෙන් 2025 අංක 01 දරන හදිසි අවස්ථා (විශේෂ විධිවිධාන හා බලතල) නියෝග ජනාධිපතිවරයා විසින් ප්‍රකාශයට පත් කරනු ලැබුවේ ද මෙවැනි පසුබිමක.

පොලිස් මාධ්‍ය ප්‍රකාශක එෆ්. කේ. වුට්ලර් සඳහන් කරන්නේ මේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ අංක 20 සහ 21 වගන්ති අනුව හදිසි අපද තත්ත්වය පිළිබඳ මහජනයා බිය ගැන්විය හැකි, කැලඹිය හැකි ආකාරයේ කිසිදු කටකතාවක් හෝ අසත්‍ය ප්‍රකාශනයක් හෝ කට වචනයෙන්, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, ස්වයංක්‍රීය පද්ධති හෝ කෘත්‍රිම බුද්ධිය හෝ යම් ලිඛිත, විද්‍යුත්, ඩිජිටල් හෝ වෙනත් යම් ආකාරයක මාධ්‍යයක් ඔස්සේ සන්නිවේදනය, ප්‍රචාරය, පළ කිරීම සහ නිර්මාණය හෝ පැතිරවීම සම්බන්ධ ව නීතිය ක්‍රියාත්මක කළ හැකි බව. මෙවැනි ක්‍රියාවකින් මහජනතාව කැලඹීමකට, යම් බිය වැද්දවීමකට ලක් වුවහොත් ඒ පිළිබඳ මහාධිකරණ නඩුවකදී විභාග කර අනතුරු ව ජීවිතාන්තය දක්වා සිර දඬුවම් නියම කළ හැකි බවත් ඔහු පවසනවා.

නීතිය එලෙස ක්‍රියාත්මක කළ හැකි වුවත් මේ ව්‍යාජ නිර්මාණ හඳුනා ගැනීම වඩාත් අසීරු වීම ගැටලුසහගත තත්ත්වයක්. මාධ්‍ය සාක්ෂරතාව හා තාක්ෂණික සාක්ෂරතාව අඩු අවස්ථාවක පුද්ගලයකු මෙවැනි සැලසුම්සහගත අපහාසයකට ලක්වුවහොත් එහි නිවැරදි බවට සනාථ කිරීම පහසු නැහැ. මේ නිසා මෙවැනි අවස්ථාවක නීතියේ පිළිසරණ වඩාත් පිළිගත හැකි හා නවීන තාක්ෂණික සනාථ කිරීම්වලින් සන්නද්ධ වීම අත්‍යවශ්‍ය වෙනවා. 'තාක්ෂණයෙන් තොර වීම' යන්න මේ ගැටලු සඳහා පිළියමක් වන්නේ නැහැ. මෙවැනි අවස්ථාවලදී සමාජ දැනුවත්භාවයකින් ක්‍රියා කිරීමයි කළ යුතු වන්නේ.

සමාජ මාධ්‍යයේ කුඩා තිර රසවින්දන හුරුවට පෙර ශ්‍රව්‍ය දෘශ්‍ය ප්‍රයෝග ලෙස යොදා ගැනුණේ සිනමාව හා රූපවාහිනිය. යථාර්ථ ලෝක සීමා ඉක්මවා තිරය මත පෙන්විය හැකි දේ පුළුල් කිරීමට සහ කතන්දර කීමේ කලාව ශක්තිමත් කිරීමට සිනමාවේ විශේෂ ප්‍රයෝග භාවිත වුණා. සිනමාවට අනන්‍ය වූ මේ සංවේදී සහ දෘශ්‍යමය උපක්‍රමික බලය දැන් ළඟා වී ඇත්තේ සමාජ මාධ්‍ය වෙත. මෑතකදී එහි ප්‍රබලතම ජනප්‍රියත්වය AI විසින් ජනනය කරන ලද වීඩියෝ හා ඡායාරූප ආදිය හිමිකරගෙන තිබෙනවා.

කෘත්‍රිම බුද්ධිය යනු මිනිසාට සමාන ලෙස ක්‍රියා කළ හැකි පරිගණක ක්‍රියාවලියක්. එය එක් ක්ෂේත්‍රයකට නොව විද්‍යාව, කලාව, සාමාන්‍ය මනුෂ්‍ය ක්‍රියාකාරකම් ආදිය වෙත සෘජු බලපෑමක් කරමින් ඉදිරියට ගමන් කරමින් තිබෙනවා.

සමාජ මාධ්‍ය පරිශීලකයන්ට Ai තාක්ෂණයෙන් නිර්මිත වීඩියෝපට, ඡායාරූප අලුත් නැහැ. තැඹිලි පාට පූසෙකු විවිධ විනෝදාත්මක ක්‍රියාවල නිරත වන සජීවිකරණ වීඩියෝපට ලොව ජනප්‍රියයි. ලෝක නායකයන්ගේ හා ජනප්‍රිය පුද්ගලයන්ගේ කතා හා හැසිරීම් උපහාසයට ලක්කරමින් නිර්මිත වීඩියෝපට එහිදී දක්නට පුළුවන්. සිංහල භාෂාවෙන් සකසන ලද පැරණි කතා යළි ප්‍රතිනිර්මාණය කිරීම ආදී රසවත් විනෝදාත්මක වීඩියෝ ද ඒ අතර වනවා.

එහෙත් මේ විනෝදාත්මක රැල්ල මානව සමාජයේ යහපැවැත්මට, සමාජීය බැඳීම්වලට කරන බලපෑම යහපත් නැහැ. එසේ වන්නේ මේ වීඩියෝ සහ ඡායාරූපවල අසභ්‍ය නිර්මාණ, පෞද්ගලිකත්වයට හානිවන ආකාරයේ නිර්මාණ, බුද්ධිමය දේපළ සොරාගැනීම්, මහජනතාව හිතා මතා නොමඟ යැවීම්, මහජන කැලඹීම් ඇතිකරන පුවත් මැවීම් අන්තර්ගත වන නිසා.

AI මත පදනම් වූ ඡායාරූප සහ වීඩියෝ නිර්මාණ ක්‍රියාවලිය සිදු වන්නේ ව්‍යුහගත ක්‍රමවේදයක් අනුගමනය කරමින්. ඒ සඳහා අවශ්‍ය වන්නේ අදහසක් පමණයි. පළමු ව නිර්මාණකරු තමන්ට අවශ්‍ය ඡායාරූප හෝ වීඩියෝව හෝ නිර්මාණය විය යුතු ආකාරය පිළිබඳ ව අදාළ AI නිර්මාණ සිදු කරන වේදිකා (Generative AI

Platforms) වෙතට සවිස්තරාත්මක විධානය (Prompt) ලබා දෙනවා. විවිධ සමාගම් විසින් සකස් කරන ලද මුදල් ගෙවා සේවාව ලබා ගත යුතු මෙවැනි ඡායාරූප හා වීඩියෝ නිර්මාණය කර දෙන වේදිකා හා මෙවලම් අන්තර්ජාලයේ තිබෙනවා. Gemini, Flow, Kling වැනි වේදිකා ඒ අතර ජනප්‍රියයි. විධානය (Prompt) සකස් කර මේ වේදිකා වෙත ලබා දීමෙන් පසු අවසන් නිර්මාණය සැකසෙන්නේ ස්වයංක්‍රීය ව. AI වේදිකා (AI Platform) සහ මිනිස් නිර්මාණශීලීත්වය හා සබඳතාව රඳා පවතින්නේ මේ විධානය (Prompt) නිසි අයුරින් ලිවීමෙන් පමණක් බවත් අවධානයට ගත යුතු කරුණක්.

සාමාන්‍ය තරුණ නිර්මාණකරුවන් වෙත කෘත්‍රිම බුද්ධියෙන් ජනනය කෙරෙන මේ ඡායාරූප හා වීඩියෝ ප්‍රචලිත වන්නට ප්‍රධානතම හේතු කිහිපයක් හඳුනා ගන්නට පුළුවන්. ඉන් ප්‍රධාන වන්නේ මේ නිර්මාණ කිරීම සඳහා පූර්ව කුසලතාවක් හෝ දැනුමක් හෝ එතරම් අවැසි නොවීම. පරිගණක හා මෙවලම් භාවිත කළ හැකි මට්ටමේ දැනුමක් සහ අදාළ මෙවලම සඳහා විධානය (Prompt) කිරීමට අවැසි භාෂා දැනුමක් ඇත්නම් වීඩියෝ හෝ ඡායාරූප හෝ අත්හදා බැලීම කළ හැකියි. මේ නිර්මාණය කරන වේදිකා (Platforms) බහුතරයක් නිර්මාණ සඳහා අවස්ථාව ලබා දෙන්නේ කෙටි කාලයකට නොමිලයේ. යම් කාලයක් හෝ නිර්මාණ කිහිපයක් කිරීමෙන් අනතුරු ව සුළු මුදලක් ගෙවා මේ පහසුකම ලබා ගැනීමට අවස්ථාව සැලසෙනවා. ඇතැම් විසිතුරු ආකාරයේ ඡායාරූප සඳහා අවශ්‍ය විධානය (Prompt) නිතර අන්තර්ජාලයේ සංසරණය වීම නිසාත් මෙය පහසු මෙවලමක් බවට පත් ව තිබෙනවා.

තමන්ගේ ම ඡායාරූපයක් වෙනස් පසුතලයක්, වෙනස් ශරීරයක විසිතුරු ලෙස නිර්මාණය කර ගැනීම මේ අතරින් අතිශයින් ජනප්‍රිය ක්‍රමවේදයක්. මෙහිදී අදාළ වේදිකා (Platforms) වෙත තමන්ගේ ඡායාරූප ලබා දිය යුතුයි. අන්තර්ජාලයේ සැරිසරන විටෙක සිනාමාත්මක ලෙසින් විවිධ ඇඳුම් සහිත, පසුබිම් සහිත අලංකාර ඡායාරූප නිර්මාණය කර ඇති විධාන (Prompt) හමුවෙනවා. එහිදී google gemini වැනි පහසුවෙන් පරිහරණ කළ හැකි මෙවලමක් වඩාත් ජනප්‍රියයි. එහෙත් එසේ උඩුගත කරන (upload) ඡායාරූපවල සිටින්නන්ගේ පෞද්ගලිකත්වය සහ ඒවා නැවත භාවිතාව පිළිබඳ ඇත්තේ ඉතා අවදානම් තත්වයක් බවත් පිළිගත යුතුයි. කොරියානු සෝන්ග්සිල් සයිබර් විශ්වවිද්‍යාලයේ මහාචාර්ය එරික් පාක් පවසන්නේ AI වේදිකාවකට පුද්ගලික ඡායාරූපයක් උඩුගත කිරීම සම්පූර්ණයෙන් ම ආරක්ෂිත නොවන බව. අදහස් දක්වන මහාචාර්ය එරික් පාක්; "ඡායාරූපයක් උඩුගත කළ පසු රූපය ගබඩා කරන, නැවත භාවිත කරන, වෙනත් දත්ත සමඟ ඒකාබද්ධ කරන ආකාරය පිළිබඳ පාලනය පරිශීලකයන්ගෙන් අහිමි විය හැකියි. විශේෂයෙන් නියාමනය නොකළ වේදිකාවල ගැඹුරු බොරු (deep fake) භාවිත,

මාධ්‍ය සාක්ෂරතාව හා තාක්ෂණික සාක්ෂරතාව අඩු අවස්ථාවක පුද්ගලයකු සැලසුම්සහගත අපහාසයකට ලක්වුවහොත් එහි නිවැරදි බවට සනාථ කිරීම පහසු නැහැ. මේ නිසා මෙවැනි අවස්ථාවක නීතියේ පිළිසරණ වඩාත් පිළිගත හැකි හා නවීන තාක්ෂණික සනාථ කිරීම්වලින් සන්නද්ධ වීම අත්‍යවශ්‍ය වෙනවා. 'තාක්ෂණයෙන් තොර වීම' යන්න මේ ගැටලු සඳහා පිළියමක් වන්නේ නැහැ. මෙවැනි අවස්ථාවලදී සමාජ දැනුවත්භාවයකින් ක්‍රියා කිරීමයි කළ යුතු වන්නේ.




අනන්‍යතාවට සහ කීර්ති නාමයට හානි කිරීම ඇතුළු අනිසි භාවිත තිබෙන නිසා එහි සැබෑ අවදානමක් තිබෙනවා. මේ දත්තවල ආරක්ෂාව බොහෝදුරට රඳා පවතින්නේ එම වීඩියෝ නිර්මාණය කරන මෙවලමේ/ වේදිකාවේ රහස්‍යතා ප්‍රතිපත්ති, දත්ත ආරක්ෂණ ප්‍රමිති සහ නීතිමය අධීක්ෂණය මත. සාමාන්‍යයෙන් සංවේදී රූප උඩුගත කිරීමෙන් වැළකී සිටිය යුතු අතර ම අප ප්‍රවේශම් විය යුතුයි."

AI වීඩියෝ හා ඡායාරූපකරණයේ ගැඹුරු බොරු (deep fake) යන්න නිරතුරු කතාබහට ලක්වන්නක්. deep fake වීඩියෝ නිර්මාණ යනු සැබෑ මිනිසුන්ගේ මුහුණු, කටහඬ, චලන යථාර්ථයෙන් ම අනුකරණය සඳහා AI ආකෘති විසින් නිර්මාණය කරන ලද්දක්. deep fake ඡායාරූප යනු තවත් අයෙකුගේ මුහුණක් වෙනත් ශරීරයකට සම්බන්ධකොට කෙරෙන රූප සංස්කරණයක්. සිනමා නිර්මාණවලදී වෙනත් අයෙකුගේ මුහුණක් තවත් අයෙකුගේ මුහුණක් වෙත සංස්කරණය කරමින් අපූර්වත්වයක් ගොඩනගන අවස්ථා පටලපට යුගයේ සිට ම දක්නට ලැබුණා. මේ තාක්ෂණය කලාත්මක ප්‍රවේශයක් ලෙස සිනමාවේ දක්නට ලැබුණත් මේ වනවිට AI හේතුවෙන් එය සරල ක්‍රියාවලියක් සහ පැතිරුණ භාවිතයක් බවටත් පත් ව තිබෙනවා. ජනප්‍රිය නළු නිළියන්ගේ, දේශපාලනඥයන්ගේ මුහුණු වෙනත් පුද්ගලයන්ගේ මුහුණු වෙත සංස්කරණය කරමින් මහජනයා නොමඟ යැවීමත් අදාළ චරිතයට ඉන් හානියක් සිදුවීමත් සිදු වන අයහපත් සමාජීය බලපෑමක්.

2024 වසරේ ඉන්දීය නිළි රශ්මිකා මන්දානාගේ රුව වෙනත් කාන්තාවකගේ ශරීරයකට සංස්කරණය කරමින් සමාජ මාධ්‍යවල සංසරණය වූ වීඩියෝපටය සමාජයේ අති කලේ ඉමහත් කැලඹීමක්. එහිදී අදාළ සංස්කරණ කර සමාජ මාධ්‍ය වෙත යොමු කළ පුද්ගලයන් අත්අඩංගුවට ගත්තේ ඉන්දියානු අපරාධ නීතිය යටතේ. මෙලෙස නීතියේ මැදිහත් වීම සෑම රටක ම බලාත්මක කිරීමට අවැසි පරිසරයක් නිර්මාණය වී තිබීම ඉතා වැදගත්. එසේ ම සමාජීය වශයෙන් මේ සඳහා ආරක්ෂාව අත්‍යවශ්‍ය යුගයකයි අප සිටින්නේ.



ඉරානයේ විරෝධතා ආරම්භ වූයේ 2025 දෙසැම්බර් මාසයේදී. ඒ, ඉරාන රියාල්වල වටිනාකම ඇමරිකා ඩොලරයට සාපේක්ෂ ව තියුණු ලෙස පහත වැටීම හේතුවෙන්. එහි බලපෑම නිසා කඩ හිමියන් ටෙහෙරාන් අගනුවර වීදි බැස විරෝධතා එල්ල කළා. ඩොලරයක් සඳහා ඉරාන රියාල් මිලියන 1.47 ඉක්මවා මුදලක් ගෙවීමට ඔවුන්ට සිදු වුණා. උද්ධමනයේ වැඩිවීම ආදී කරුණු පදනම් කරගනිමින් ආරම්භ වූ මේ විරෝධතා දේශපාලන

# ගිනියම් වූ මැදපෙරදිග

වෙනසක් ඉල්ලීම දක්වා වර්ධනය වුණා. ඉරානයේ ආධ්‍යාත්මික නායක **Ayatollah Ali Khamenei**ට ද විරෝධතාකරුවන් දැඩි ලෙස විරෝධය පළ කර තිබෙනවා. මෙහිදී අවම වශයෙන් නගර 186ක විරෝධතා සංවිධාන කෙරුණා. එහිදී ආරක්ෂක අංශ සමඟ ඇති වූ ගැටුම්වලින් 6000කට වැඩි පිරිසක් මියගොස් ඇති බව මාධ්‍ය වාර්තා කරනවා. 26000ක පමණ පිරිසක් අත්අඩංගුවට ගෙන තිබෙනවා. 5800ක් තුවාල ලබා ඇති බවත් 12000ක පමණ පිරිසක් මියගොස් ඇති බවත් තහවුරු නොකළ වාර්තාවල සඳහන්.

නෝර්වේ පදනම් කරගත් ඉරාන මානව හිමිකම් සංවිධානවලට අනුව මියගිය අය අතර වයස අවුරුදු 18ට දහ අඩු ළමයින් ද සිටිනවා. බීබීසී මෙන් ම අනෙකුත් බොහෝ ප්‍රවෘත්ති ආයතනවලට ඉරානයේ සිට තොරතුරු වාර්තා කිරීමට බාධා එලල වී ඇති බව සඳහන්.

1990 සිට 2000 වසර දක්වා කාලයේ ඉරාන ආර්ථිකය ඉහළ මට්ටමක පැවතියත් එම තත්ත්වය වෙනස් වූයේ ඉන් අනතුරු ව ලෝක බලවතුන් සම්බාධක පැනවීමත් සමඟ. 1979 විප්ලවයෙන් බලයෙන් පහ කළ ඉරාන අවසන් Reza Shah රජුගේ පුත්‍රයා වන Mohammad Reza Pahlavi ඉරාන ජනතාවගෙන් ඉල්ලා සිටියේ පවතින තත්ත්වයට එරෙහි ව විරෝධතා පවත්වන ලෙස. ඉරාන ජනතාවට උපකාර කරන ලෙසත් ඔහු ඇමරිකා ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප්ගෙන් ඉල්ලීමක් කළා. Reza Pahlavi මේ වන විට ජීවත්වන්නේ ඇමරිකාවේ.

Wall Street ජර්නලය පෙන්වා දෙන ආකාරයට ඇමරිකා ජනාධිපතිට ඉරානයට එරෙහි ව ගත හැකි විකල්ප ගණනාවක් තිබෙනවා. සම්බාධක පැනවීම, හමුදා මෙහෙයුම් සිදුකිරීම, සයිබර් අවි භාවිතය ඒ අතර වෙනවා. විරෝධතා ව්‍යාප්ත වීම වැළැක්වීම සඳහා අන්තර්ජාල ප්‍රවේශ අහිමි කිරීමට බලධාරීන් පියවර ගෙන ඇතත් මෙය මානව හිමිකම් සංවිධානවල අදාළ වගන්ති උල්ලංඝනය කිරීමක් ලෙස පෙන්වා දිය හැකියි.

ඉරානය සමඟ වෙළෙඳාම් කරන රටවලට සියයට 25ක තීරුබදු පනවන බවයි ඇමරිකා ජනාධිපතිවරයා ප්‍රකාශ කළේ. ඉරානය සමඟ වෙළෙඳාම් කරන 100කට වැඩි රටවල් අතරින් ඔවුන්ගේ ප්‍රධාන අපනයන හවුල්කරු වන්නේ චීනය. 2025 වසරේ ඔක්තෝබර් මාසය දක්වා කාලයේ චීනය ඉරානයෙන් ඩොලර් මිලියන 14කට වඩා නිෂ්පාදන මිලදීගෙන තිබෙනවා. චීනයට පසුව ඉරාකය එහි විශාලතම වෙළෙඳ ගනුදෙනුකරුවා. එක්සත් අරාබි එමීර් රාජ්‍යය, තුර්කිය, ඉන්දියාව, රුසියාව ඇතුළු රටවල් ඔවුන්ගේ අනෙක් වෙළෙඳ හවුල්කරුවන්.

2019 වසරේ සිට ඇමරිකාව ඉරානයට විවිධ සම්බාධක පනවා තිබෙනවා. ඉරාන විප්ලවවාදී ආරක්ෂක බලකාය ත්‍රස්තවාදී සංවිධානයක් ලෙස නම් කර ඇති අතර වානේ, ඇලුමිනියම් හා තඹ වැනි ද්‍රව්‍යවලට ද සම්බාධක පනවා තිබෙනවා. ලෝක බැංකු දත්ත අනුව ඉරානයේ ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය 2012 වසරේදී ඩොලර් 8000කට වඩා වැඩි වූ අතර 2024 වසරේදී එය ඩොලර් 5000 පමණ දක්වා අඩු වුණා. තෙල් අපනයනය සහ ගෝලීය මූල්‍ය ප්‍රවේශයට ඇති අවස්ථා



**චන්දන මාරසිංහ**

අවම වීම ද ඊට හේතුවක්. 2012 වසරේදී ඉරානය දිනකට තෙල් බැරල් මිලියන 2.2ක් අපනයනය කළත් 2023 වසරේදී එය අඩු වී තිබෙනවා ලක්ෂ 04 දක්වා. මේ අනුව සම්බාධක හේතුවෙන් ඉරානයේ අපනයනවලින් වැඩි ප්‍රමාණයක් අවහිර කර තිබෙන අතර උද්ධමනය වැඩි වීමටත් ආයෝජන දුර්වල වීමටත් එය හේතු වී තිබෙනවා. එසේ ම ඉරානයට නව ගුවන් යානා මිල දී ගැනීමට නොහැකි වීමටත් බලපා තිබෙන්නේ මේ සම්බාධක. ඒ අනුව ඉරානයේ පවතින්නේ සම්බාධක ආර්ථිකයක්.

මෙය රටක දූෂණය ඉහළ යාමට ද හේතුවක්. ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයේ ඉරානයේ ඉතිහාසය හා දේශපාලනය පිළිබඳ මහාචාර්යවරියක වන **Maryam** Alemzadeh අල් ජසීරා පුවත් සේවයට සඳහන් කළේ සම්බාධක ඉරානයට දැඩි බලපෑමක් කර ඇති අතර ඉරාන ප්‍රභූ පැළැන්තිය ඒවායින් ප්‍රතිලාභ ලබා ඇති බව. ජර්මනියේ Marburg විශ්වවිද්‍යාලය පෙන්වා දුන්නේ 2012 වසරේ සිට ඉරානයේ මධ්‍යම පාන්තිකයන් මේ සම්බාධක නිසා දැඩි ලෙස පීඩනයකට ලක් ව ඇති බව. රියාල්වල අගය බිඳවැටීම ප්‍රධාන ලෙස ම බලපා ඇත්තේ මධ්‍යම පාන්තිකයන්ට. ඒ, ඇමරිකාව ප්‍රමුඛ ව පනවා ඇති සම්බාධක නිසා ස්ථාවර වැටුප් ලබන කාණ්ඩවලට බරපතළ බලපෑම් එල්ල වී ඇති බැවින්. 1979 වසරේදී ඇමරිකා හිතවාදී ෂා පාලනය පෙරළා නව පාලනය බලයට පත්වීමත් සමඟ වරින් වර මේ සම්බාධක පැනවීම සිදු ව තිබෙනවා. ඉරානයේ ඖෂධ මිල ගණන් ඉහළ යාමට ද මෙය හේතුවක්.

> ඉරානයේ මිලියන 92ක් පමණ වන ජනගහනයෙන් වැඩි පිරිසක් ජීවන වියදම හේතුවෙන් අරගලයකට මැදි ව සිටිනවා. ඉරානයේ උත්තරීතර නායකයා දැඩි අනතුරු ඇඟවීමක් නිකුත් කරමින් සඳහන් කළේ ඉස්ලාමීය ජනරජය විනාශකාරී ක්‍රියා හමුවේ පසුබට නොවන බව. ටෙහෙරානයේ දේපළ පිළිබඳ සඳහන් කරමින් ඔහු පෙන්වා දුන්නේ ඇමරිකා ජනාධිපතිවරයා සතුටු කිරීම සඳහා විරෝධතාකරුවන් තමන්ගේ ම දේපළවලට හානි කරන බව.

ඉරානයේ මිලියන 92ක් පමණ වන ජනගහනයෙන් වැඩි පිරිසක් ජීවන වියදම හේතුවෙන් අරගලයකට මැදි ව සිටිනවා. ඉරානයේ උත්තරීතර නායකයා දැඩි අනතුරු ඇඟවීමක් නිකුත් කරමින් සඳහන් කළේ ඉස්ලාමීය ජනරජය විනාශකාරී ක්‍රියා හමුවේ පසුබට නොවන බව. ටෙහෙරානයේ දේපළ පිළිබඳ සඳහන් කරමින් ඔහු පෙන්වා දුන්නේ ඇමරිකා ජනාධිපතිවරයා සතුටු කිරීම සඳහා විරෝධතාකරුවන් තමන්ගේ ම දේපළවලට හානි කරන බව. ආධ්‍යාත්මික නායකයා ධුරයෙන් ඉවත් කළ යුතු බවත් විරෝධතාකරුවන් සඳහන් කර තිබෙනවා. මේ විරෝධතා මැඩ පැවැත්වීමට කැරලි මර්දන පොලිසියට අමතර ව සිවිල් ඇඳුමින් සැරසුණු පැරා මිලිටරි බලකායක් යෙදවීමටත් ඉරාන රජය පියවර ගත්තා. ඉරාන ආරක්ෂක ප්‍රතිපත්ති පිළිබඳ අවසන් පාලනය රඳා පවතින්නේ ජනාධිපතිවරයා වෙත නොව එරට උත්තරීතර නායකයාට.

විප්ලවයක් සාර්ථක වීම සඳහා බලපාන කොන්දේසි කිහිපයක් තිබෙනවා. 1979 වසරින් පසු ඉරානය බරපතළ ම විරෝධතාවකට මුහුණ දී තිබෙන්නේ මේ අවස්ථාවේ. මෙහිදී එක් කොන්දේසියක් වන්නේ ආතතියකින් පිරී ගිය ජනතාවගේ ඒකරාශී වීමක්. 1979 වසරේදී පුළුල් දෘෂ්ටියකින් ආරම්භ වූ ඉරාන දේශපාලන කඳවුර මේ වන විට එසේ පුළුල් දෘෂ්ටියක් නොමැති ව පටු මාවතකට පටු සීමාවක සිට ගමන් කරන ආකාරය දැකගත හැකියි. එය ප්‍රභූ පැළැන්තියේ විරසකයට ද හේතුවක්. දේශපාලන, සමාජ හා ආර්ථික කාරණා හේතුවෙන් මතුවූ ගැටලු මෙන් ම පාලන ක්‍රමය වෙනස් කිරීමට අවශ්‍ය ජාත්‍යන්තර පරිසරයක් නිර්මාණය වීමත් එම කොන්දේසි අතරට ගැනෙනවා. එහි පෙරමුණ ගෙන තිබෙන්නේ ඇමරිකාව.



ආධ්‍යාත්මික නායක
**Ayatollah Ali Khamenei**

මේ කොන්දේසි සම්පූර්ණ කළ ද ඉරාන රජය බිඳ නොවැටී තැබීමට බලපාන ප්‍රධාන සාධකය වන්නේ එරට ආරක්ෂක

ඉරානයට මේ විරෝධතා අලුත් දෙයක් නොවෙයි. 2022 වසරේදී ද මෙවැනි විරෝධතා ඇති වුණා. ජනතාවට දැනෙන ප්‍රතිසංස්කරණ නොකළහොත් සහ ආර්ථිකයට සහනයක් නොලැබුණහොත් යළි යළිත් ඉරානයේ විරෝධතා මතු විය හැකියි.



අංශ විසින් පාලන තන්ත්‍රය ආරක්ෂා කරනු ලැබීම. මෙවැනි පසුබිමක ඉරානයට එල්ල වන බලපෑම් උග්‍ර වී තිබෙනවා. විරෝධතාකරුවන් ඝාතනය කළහොත් දැඩි ප්‍රතිවිපාක විඳීමට සිදුවන බවයි ඇමරිකා ජනාධිපති ට්‍රම්ප් තර්ජනය කර ඇත්තේ. ඊට ප්‍රතිචාර දක්වමින් ඉරානය සඳහන් කළේ විරෝධතාකරුවන් ඝාතනය නොකරන බව. ඉරානයේ පාලන තන්ත්‍රයට ඇති තවත් වාසියක් වන්නේ විරෝධතාකරුවන් අතර නායකත්වයක් නොමැති වීම. Reza Pahlavi ඒ සඳහා සූදානමින් පසුවුව ද ඔහුගේ ඉතිහාසය හා ඇමරිකාව මෙන් ම ඊශ්‍රායලය ඇතුළු රටවල් සමඟ ඇති සමීප සබඳතා හේතුවෙන් එය සීමා සහිත වී තිබෙනවා. ටියුනීසියාව වැනි රටක පාලකයන්ට බලය අත්හැරීමට සිදු වූයේ හමුදාවේ සහාය විරෝධතාකරුවන්ට ලැබුණු බැවින්. 2011 වසරේදී එම වෙනස සිදු වුණා. එහෙත් ඉරානයේ මෙතෙක් එවැනි තත්ත්වයක් දැක ගන්නට නැහැ. ඉරානයට එරෙහි ව ක්‍රියාත්මක කළ හැකි මෙහෙයුමකදී දිගු දුර මිසයිල ප්‍රහාර, සයිබර් මෙහෙයුම් සහ මනෝවිද්‍යාත්මක ප්‍රහාර සම්බන්ධයෙන් ඇමරිකාව අවධානය යොමු කර ඇති බවයි scbs වාර්තා සඳහන් කළේ. ඉරාන විදේශ අමාත්‍යවරයා අල් ජසීරා වෙත ප්‍රකාශ කර තිබෙන්නේ ඉරානය රාජ්‍යතාන්ත්‍රික කටයුතු සඳහා පමණක් නොව ඇමරිකාව වෙනුවෙන් මිලිටරි විකල්ප සොයා බැලීමට ද සූදානම් බව. ඒ අතරට ඔවුන් පෙන්වා දුන්නේ මේ විරෝධතා පිටුපස විදෙස් රාජ්‍යයක් පවතින බව. බ්‍රිතාන්‍ය විදේශ ලේකම්වරයා එරට සිටින තානාපතිවරයා කැඳවා දැනුම් දුන්නේ ඉරාන විරෝධතාකරුවන් ඝාතනය නොකළ යුතු බව. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කාර්යාලය කියා සිටියේ විරෝධතාකරුවන්ට එරෙහි ප්‍රචණ්ඩ ක්‍රියා නතර කළ යුතු බව. කෙසේ වෙතත් ඇමරිකාව ඉරාන ආධ්‍යාත්මික නායකයා වෙත දැඩි අවධානයක් යොමු කර ඇති අතර ඉරාන බලධාරින් පෙන්වා දෙන්නේ ආධ්‍යාත්මික නායකයාට ප්‍රහාරයක් එල්ල කළහොත් ඊට දැඩි ප්‍රතිචාර දක්වන බව. ඉරානයේ විරෝධතා අතරතුර ප්‍රචාරක පුවරුවල දක්නට ලැබුණු save the **Persian** nation යන ප්‍රකාශය සමාජ මාධ්‍ය ඔස්සේ විශාල ප්‍රසිද්ධියක් ලබා තිබුණා. එය ඊශ්‍රායල හෝ බටහිර රාජ්‍යයක් හෝ විසින් සිදු කරනු ලැබූ බවට සාධක තිබෙනවා. අල් ජසීරා විශ්ලේෂණයකින් හෙළි ව තිබෙන්නේ එය පරිශීලිකයන් මිලියන 18කට පමණ ළඟා වී ඇති බව. කෙසේ වෙතත් මුල් අන්තර්ගතය පරිශීලකයන් 170 ඉක්මවා නැහැ. එය සමාජ ආර්ථික දුක් ගැනවිලි ඉදිරිපත් කිරීමකට වඩා නොසන්සුන්තාව ඇති කිරීම සඳහා යෙදූ මනෝ විශ්ලේෂණාත්මක ප්‍රකාශයක්. Reza Pahlavi එක ම විසඳුම ලෙස දක්වන වාක්‍යය ඊශ්‍රායල සමාජ මාධ්‍ය ගිණුම්වල ප්‍රකාශයට පත් වී තිබෙනවා. ඉරාන රජයේ පීඩනකාරී ඉස්ලාමීය පාලනයක් ලෙස විග්‍රහ කිරීම ද ඇතැම් ප්‍රකාශවලින් සිදු කර තිබෙනවා. ඒ අනුව උත්සාහ දරා තිබෙන්නේ ආර්ථික හෝ සමාජ කරුණුවලින් බැහැර ආගමික කරුණක් බවට විරෝධතා පරිවර්තනය කිරීමට. ඉරානයෙන් පිටත සිටින ඇතැම් පාර්ශ්ව ඉරාන විරෝධතාවලට අවශ්‍ය අමුද්‍රව්‍ය සපයා තිබෙනවා.

ඇමරිකාව සහ බ්‍රිතාන්‍යය කටාර්වල හමුදා කඳවුරුවල සිටින පිරිස් අඩු කර තිබෙනවා. ඉරානයට ප්‍රහාරයක් එල්ල වුවහොත් මැදපෙරදිග ඇති ඇමරිකා හමුදා කඳවුරුවලට පහර දෙන බවයි ඉරාන බලධාරින් ප්‍රකාශ කර ඇත්තේ. ඇමරිකාවට අවශ්‍යනම් ඉරානයට එරෙහි ප්‍රහාර විවිධ ආකාරයෙන් ක්‍රියාත්මක කළ හැකියි. මීට පෙර ද ඉරානයට බෝම්බ හෙළීමෙන් ඒ බව තහවුරු වී තිබෙනවා. කෙසේ වෙතත් ඉරානයට එරෙහි ප්‍රහාරයකදී ඇමරිකාවේ සහායට ඊශ්‍රායලය පැමිණිය හැකියි. එහෙත් සවුදි අරාබිය, කටාර්, ඕමානය වැනි රටවල් රාජ්‍යතාන්ත්‍රික ක්‍රමවේද සඳහා බලපෑම් එල්ල කර තිබෙනවා. ගල්ෆ් කලාපයේ සහාය නොමැති ව සිදු කළ හැකි වන්නේ දුර සිට ක්‍රියාත්මක කළ හැකි මිලිටරි මෙහෙයුම්. ගුවන් මෙහෙයුම් ද ඊට අයත්. ඉරානයේ ආරක්ෂක මධ්‍යස්ථානවලට එරෙහි ව කෲස් මිසයිල භාවිත කළ හැකි වුවත් එයින් ඇමරිකාවේ මැදපෙරදිග හමුදා කඳවුරුවලට තර්ජනයක් මතුවිය හැකියි. දකුණු චීන මුහුදේ තිබූ ඇමරිකාවේ ඒබ්‍රහම් ලින්කන් නෞකාව පිහිටීම වෙනස් කරමින් යාත්‍රා කර තිබෙනවා. එසේ ම ඊශ්‍රායලය ද ගුවන් ආරක්ෂක ජාලය සීරුවෙන් තැබීමටයි කටයුතු කළේ.

ඉරානයට මේ විරෝධතා අලුත් දෙයක් නොවෙයි. 2022 වසරේදී ද මෙවැනි විරෝධතා ඇති වුණා. ජනතාවට දැනෙන ප්‍රතිසංස්කරණ නොකළහොත් සහ ආර්ථිකයට සහනයක් නොලැබුණහොත් යළි යළිත් ඉරානයේ විරෝධතා මතු විය හැකියි. එසේ වන්නේ Reza Pahlavi වැනි නායකත්වය අපේක්ෂා කරන පුද්ගලයන් සහ ඇමරිකාව මෙන් ම ඊශ්‍රායලය වැනි රටවල ක්‍රියාකාරිත්වය හේතුවෙන්. ඉරානයට රජයක් නිර්මාණය කළ හැකි ප්‍රබල විපක්ෂයක් ද මේ වන විට දැක ගත නොහැකි වුවත් සිවිල් ජනතාවගේ අයිතිවාසිකම් සුරැකීම මෙන් ම ඔවුන්ට යහපත් ලෙස ජීවත්වීමට අවශ්‍ය පරිසරයක් සකස් නොකළහොත් නැවතත් යම් ආකාරයක විරෝධතාවක් කුමන හෝ අවස්ථාවක මතු විය හැකියි.



# තෙල් සරු රටේ බලවතා නෙත ගැටේ

සුගත්ප්‍රිය කුලතුංග ආරච්චි

තෙල් සරු රටක් වන වෙනිසියුලාවේ රාජ්‍ය නායකයා පැහැර ගනිමින් (2026 ජනවාරි 03 දින) ඇමරිකා එක්සත් ජනපදය සිදු කළ හදිසි මෙහෙයුම ලෝකයේ ම අවධානයට ලක් වුණා. නීත්‍යනුකූල ව හා ප්‍රජාතන්ත්‍රවාදී ව පත් වූ රාජ්‍ය නායකයකු එලෙස පැහැර ගැනීම බොහෝ රටවල් මෙන් ම ඇමරිකාව ද තදින් විවේචනයට කළ බව නොරහසක්.

අත්අඩංගුවට ගත් නිකොලස් මදුරෝ සහ ඔහුගේ බිරිඳ සිලියා ෆ්ලෝරස් ඇමරිකාවේ වඩාත් ම කුප්‍රකට බන්ධනාගාරයක් වන නිව්යෝර්ක්හි බෘක්ලින්, මෙට්‍රොපොලිටන් රැඳවුම් මධ්‍යස්ථානය වෙත ගෙන ගියා. ඔවුන් දෙදෙනාට එරෙහි අධිචෝදනා පත්‍රයට මත්ද්‍රව්‍ය ත්‍රස්තවාදය, මත්ද්‍රව්‍ය ත්‍රස්තවාදයට කුමන්ත්‍රණය කිරීම, මත්ද්‍රව්‍ය ජාවාරම, මුදල් විශුද්ධිකරණය සහ දූෂණ චෝදනා ඇතුළත් ව තිබුණා. ඒ අනුව පැවති පළමු නඩු විභාගයේදී, ඔවුන් දෙදෙනා තමන් සිය රටෙන් බලහත්කාරයෙන් පැහැරගෙන ගිය බවට චෝදනා කළ අතර ම තමන්ට එරෙහි ව ඇමරිකාව නඟා ඇති චෝදනාවලට වරදකරුවන් නොවන බව ප්‍රකාශ කළා. තමන් තවමත් රටේ නායකයා බවයි මදුරෝ උසාවියේදී පැවසුවේ. මේ අතරතුර වෙනිසියුලාවේ අන්තර්කාලීන නායකයා ලෙස සහ මදුරෝගේ දිගුකාලීන උප ජනාධිපති ලෙස ක්‍රියා කළ ඩෙල්සි රොඩ්‍රිගස් එරට ජනාධිපතිවරයා ලෙස දිවුරුම් දුන්නා.

එරට තෙල් සම්පත වෙනිසියුලාවේ සහ ඇමරිකාවේ ජනතාවගේ යහපත උදෙසා

වෙනිසියුලාව යනු තෙල් බැරල් බිලියන 300ක පමණ සම්පතක් හිමි සරුසාර තෙල් නිවහනක්. එය ගෝලීය තෙල් සැපයුමෙන් 20%ක් පමණ වන අතර එක්සත් ජනපදය සතු ව ඇති තෙල් ප්‍රමාණය මෙන් හතර ගුණයක්. එරට සතු තෙල් සම්පත ගැන හොඳම පැහැදිලි කිරීම වන්නේ රටේ ඉතිරි ව ඇති තෙල් ප්‍රමාණය තවත් වසර 3,540කට පමණ සෑහෙන බවට ඇති ඇස්තමේන්තුව.

පාලනය කරන බව ට්‍රම්ප් ප්‍රසිද්ධියේ ම ප්‍රකාශ කරන්නට යෙදීම අන්තර්ජාතික කරළියේ තවත් කැලඹීමකට හේතුවක් බවට පත් ව තිබුණා. මදුරෝ පැහැර ගැනීමෙන් පසු ට්‍රම්ප් කියා සිටියේ එක්සත් ජනපදය දැන් වෙනිසියුලාවේ තෙල් අංශය පාලනය කරන බවත් රටේ දැවැන්ත තෙල් සංචිත අත්පත් කර ගැනීම ජාතියට සහ එහි නායකයාට එරෙහි ඔහුගේ මිලිටරි ප්‍රහාරයේ ප්‍රධාන ඉලක්කයක් බවත්. වෙනිසියුලාවේ තෙල් නිෂ්පාදනය, පිරිපහදු කිරීම සහ ගෝලීය බෙදා හැරීම පාලනය එදා ජනාධිපති ට්‍රම්ප් දුන් පොරොන්දුවේ කොටසක්. එයින් නොනැවතී වෙනිසියුලානු තෙල් රැගත් නැව් 6ක් පවරා ගැනීමටත් ඇමරිකාව ක්‍රියා කළා.

වෙනිසියුලාව යනු තෙල් බැරල් බිලියන 300ක පමණ සම්පතක් හිමි සරුසාර තෙල් නිවහනක්. එය ගෝලීය තෙල් සැපයුමෙන් 20%ක් පමණ වන අතර එක්සත් ජනපදය සතු ව ඇති තෙල් ප්‍රමාණය මෙන් හතර ගුණයක්. එරට සතු තෙල් සම්පත ගැන හොඳම පැහැදිලි කිරීම වන්නේ රටේ ඉතිරි ව ඇති තෙල් ප්‍රමාණය තවත් වසර 3,540කට පමණ සෑහෙන බවට ඇති ඇස්තමේන්තුව.

දෙවැනි ලෝක යුද්ධයේ පරිමාණයෙන් තවත් ලෝක ගැටුමක් ඇතිවීම වැළැක්වීම සඳහා සැලසුම් කරන ලද 1945 ඔක්තෝම්බර් මාසයේදී අත්සන් කරන ලද එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියේ නියමයන් ලෝකය කැලඹූ ඇමරිකන් මෙහෙයුමෙන් එක්සත් ජනපදය උල්ලංඝනය කර ඇති බවට බොහෝ විශේෂඥයන් අදහස් දක්වා තිබුණා. මේ ගිවිසුමේ කේන්ද්‍රීය විධිවිධානයක් ලෙස එහි 2(4) වගන්තිය හැඳින්වෙනවා. එයට අනුව "රාජ්‍යයන් වෙනත් රටවලට එරෙහි ව හමුදා බලය භාවිත කිරීමෙන් වැළකී සිටිය යුතු අතර ඔවුන්ගේ ස්වෛරීභාවයට ගරු කළ යුතුයි". සියරාලියොන්හි එක්සත් ජාතීන්ගේ යුද අපරාධ අධිකරණයේ හිටපු සභාපතිවරයෙකු වන ජෙෆ්රි රොබට්සන්

(කේසී) පැවසුවේ වෙනිසියුලාවට සිදු කළ ප්‍රහාරය එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියේ 2(4) වගන්තියට පටහැනි බවක්. "ඇත්ත කතාවනම් ඇමරිකාව එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය උල්ලංඝනය කර ඇති බවයි," ඔහු පැවසුවා.

කිංග්ස්ටන් විශ්වවිද්‍යාලයේ ජාත්‍යන්තර නීතිය පිළිබඳ මහාචාර්යවරයෙකු වන එල්විරා ඩොමින්ගුස්-රෙඩොන්ඩෝ මේ මෙහෙයුම විස්තර කළේ "ආක්‍රමණශීලී අපරාධයක් සහ වෙනත් රටකට එරෙහි ව නීති විරෝධී ලෙස බලය යෙදවීමක්" ලෙසින්. ජාත්‍යන්තර නීතිය පිළිබඳ මහාචාර්යවරියක් සහ උසස් නීති අධ්‍යයන ආයතනයේ ජෝර්ජ් සහකාර පර්යේෂණ සගයකු වන සුසන් බ්‍රෝ පෙන්වා දී තිබුණේ එක්සත් ජනපදයට එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයෙන් යෝජනාවක් තිබෙනම් හෝ ආත්මාරක්ෂාව සඳහා ක්‍රියා කරන්නේනම් පමණක් මේ ප්‍රහාරය නීත්‍යානුකූල යැයි සැලකිය හැකි ව තිබූ බව. "එම දෙඅංශයෙන් ම ඇමරිකාවට පක්ෂ ව කිසිදු සාක්ෂියක් නැහැ" යැයි බ්‍රෝ පෙන්වා දුන්නා. ආරක්ෂක මණ්ඩලයේ ආරම්භක සහ නිෂේධ බලය හිමි රටක් ලෙස ඇමරිකාවේ මේ හැසිරීම ලෝක දේශපාලනය සහ රාජ්‍යතාන්ත්‍රික ආචාරධර්ම උඩු යටිකුරු කිරීමට සමත් වනු ඇති බවයි ඔවුන් පෙන්වා දෙන්නේ.

සෙසු ලෝකයේ ප්‍රතිචාර එසේ වෙද්දී ට්‍රම්ප් සිය මෙහෙයුම ගැන උදම්ඇනුවා පමණක් නොව වෙනත් රටවල් කිහිපයකට ද ආක්‍රමණික තර්ජන නොයෙකුත් ආකාරයෙන් එල්ල කළා. මේ රටවල් සියල්ල ගැන සලකා බැලිමේදී කැපී පෙනෙන පොදු සාධක වන්නේ ඔවුන් පාරම්පරික ව ම ඇමරිකානු ප්‍රතිපත්ති හිස් මුදුනින් පිළිනොගත් රටවල් වනවාටත් වඩා ඒ සෑම රටක් ම ස්වාභාවික සම්පත්වලින් පිරිපුන් ඒ නිසා ම ධනවත් විමේ භාග්‍යයලත් ස්වාධීන රාජ්‍ය වීම.

ජාතික ආරක්ෂාව පිළිබඳ දෘෂ්ටි කෝණයෙන් බලන විට "ග්‍රීන්ලන්තය අවශ්‍යයි" යනුවෙන් ඔහු කියා තිබුණා. ඩෙන්මාර්කයට අයත් මේ රාජ්‍යය ස්මාර්ට් ජංගම දුරකතන, විදුලි වාහන සහ යුධෝපකරණ නිෂ්පාදනය සඳහා තීරණාත්මක වන පෘථිවියේ පවතින දුර්ලභ ඛනිජ වර්ගවලින් පොහොසත් රටක්. වෙනිසියුලාවේ බටහිර කලාපයට ආසන්න කොලොම්බියාව තෙල් සංචිතවලින් සරුසාර මෙන් ම ලොව ප්‍රධාන පෙළේ රන්, රිදී, දියමන්ති, ප්ලැටිනම් සහ ගල් අඟුරු නිෂ්පාදකයෙක්. එරට වාමාංශික මුහුණුවර නිසා ම කාලයක සිට එදිරිවාදිකම් පවතින අතර ට්‍රම්ප් කොලොම්බියාව මත් වෙළෙඳාමේ කේන්ද්‍රස්ථානයක් හැටියට හඳුන්වන්නේ ඔහු වෙනිසුවෙලාවට චෝදනා කළ ආකාරයට ම. දැනටමත් රජයට එරෙහි මහා පරිමාණ ජනතා විරෝධතා පවතින ඉරානය ට්‍රම්ප්ගේ විවේචනයට ලක්වූ තවත් රටක්.

අපනයනය ඉලක්ක කරගත් ආර්ථිකයක් සහිත ව ශීඝ්‍රයෙන් දියුණුවන නවීන කාර්මික සහ සේවා අංශ පවතින මෙක්සිකෝව ලෝකයේ විශාලතම රිදී නිෂ්පාදකයා, 9 වැනි විශාලතම රන් නිෂ්පාදකයා, 8 වැනි විශාලතම තඹ නිෂ්පාදකයා, 5 වැනි විශාලතම ඊයම් නිෂ්පාදකයා, 6 වැනි විශාලතම සින්ක් නිෂ්පාදකයා, 5 වැනි විශාලතම මොලිබ්ඩිනම් නිෂ්පාදකයා, ලොව විශාලතම රසදිය නිෂ්පාදකයා මෙන් ම බිස්මත්, මැංගනීස්, පොස්පේට් සහ ලිතියම් නිෂ්පාදකයා ද වනවා. සියල්ලට ම වඩා රතු රටක් වන මෙය යුරේනියම් කැණීම සඳහා ද ප්‍රසිද්ධයි. නිකල්, කොබෝල්ට්, සීනි, දුම්කොළ, ධීවර කර්මාන්තය නිසා ප්‍රමුඛත්වය ගන්නා කියුබාව ද ට්‍රම්ප්ගේ අවධානයට ලක් වූ රටක්. ඒ අතර දකුණු ආසියාවේ ප්‍රබලයෙකු සහ නැගී එන ලෝක ආර්ථිකයක් විමත් විනය හා සම්බන්ධ කලාපීය බලවතෙකු විමත් සියල්ලට ම වඩා රුසියානු තෙල් මිලදී ගන්නා හිතවතෙකු විමත් යන කාරණා හේතුවෙන් ට්‍රම්ප් ඉන්දියාවට ද අනතුරු අඟවා තිබුණා.




ට්‍රම්ප්ගේ වෙනිසියුලාවේ ආක්‍රමණයට හේතු ලෙස ඔහු දක්වන රාජ්‍ය ආරක්ෂාව, ලෝක මත්ද්‍රව්‍ය ත්‍රස්තවාදය වැළැක්වීම වැනි කාරණා ගැන සැක මතුකරන්නට සමත් හැසිරීම් කිහිපයක් ද ලෝකයේ සෙසු ජාතීන්ගේ අවධානය දිනා ගත්තා. එය ඇරැඹුණේ ප්‍රහාරය සමඟ ම ට්‍රම්ප් සිය X මාධ්‍ය ජාලයේ තැබූ සටහනකින්. ඔහු නිවේදනය කර තිබුණේ වෙනිසියුලාව තෙල් බැරල් මිලියන 30ත් 50ත් අතර ගණනක් ඇමරිකාවට භාර දිය යුතු බවක්. මේ තෙල් එහි වෙළෙඳපොළ මිලට විකුණන අතර එම මුදල් ඇමරිකා එක්සත් ජනපදයේ ජනාධිපති ලෙස තමන් විසින් පාලනය කරන බවත් එය වෙනිසියුලාවේ සහ එක්සත් ජනපදයේ ජනතාවට ප්‍රතිලාභ සැලසීම සඳහා භාවිත කරන බවත් මේ සැලැස්ම වහා ම ක්‍රියාත්මක කරන ලෙස තමන් සිය බලශක්ති ලේකම් ක්‍රිස් රයිට්ගෙන් ඉල්ලා සිටින බවත් එය ගබඩා නැව්වලින් ගෙන ගොස් එක්සත් ජනපදයේ ගොඩබෑමේ තටාක වෙත ම ගෙන එනු ඇති බවත් ඔහු කියා තිබුණා.

වෙනිසියුලාවේ මෙන් ම වෙනත් රටවල ද ට්‍රම්ප්ට පක්ෂ ව මෙන් ම එරෙහි ව විරෝධතා දියත් ව තිබෙනවා. වඩාත් ම අපූරු කාරණාව වූයේ 2025 නොබෙල් සාම ත්‍යාගය හිමිකර ගැනිමේ අදහසින් සිටි ට්‍රම්ප්ට එය චක්‍රාකාර ව හිමි වීම. ඒ, සිය ප්‍රතිවාදියා වන නිකොලස් මදුරෝ බලයෙන් පහ කිරීම අගය කරමින් එහි හිමිකාරිය වන වෙනිසියුවෙලාවේ විපක්ෂ නායිකා මාරියා කොරිනා මචාඩෝ වෙතින්. වෙනිසියුලාවේ ජනාධිපති නිකොලස් මදුරෝ පැහැරගෙන ගිය විට ට්‍රම්ප් විසින් ඇය ව වෙනිසියුලාවේ නව නායිකාව ලෙස පිළිගනු ඇතැයි ඇගේ ආධාරකරුවන් බලාපොරොත්තු වුවත් එය සිදු වුණේ නැහැ. මේ කැරට් 18 සම්මානය ඇය ට්‍රම්ප් වෙත ලබා දෙන්නේ ඒ අතරතුර. ට්‍රම්ප්ගේ මෙහෙයුමේ ඇති ප්‍රජාතාන්ත්‍රවාදී බව පිළිබඳ කතාබහ කෙරෙහි ලෝකයේ ම අවධානය යොමු ව තිබෙන මොහොතක වෙනිසියුලාවේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් ප්‍රවර්ධනය සඳහා මචාඩෝඩ හිමි වූ නොබෙල් පදක්කම ඇය ට්‍රම්ප්ට ලබාදීම අපූරුවක්.



# ජුන්ටාව රජ වන ලකුණු

**නිහාල් පීරිස්**

නොබෝදා මියන්මාරයේ පැවති මහා මැතිවරණය ජාත්‍යන්තර දේශපාලන ක්ෂේත්‍රයේ විශාල අවධානයක් දිනා ගත්තා. ඒ, එරට ජනප්‍රිය නායිකා අවුන් සාන් සූ කීගේ ආණ්ඩුව මෙයට වසර කිහිපයකට පෙර කුමන්ත්‍රණයකින් පෙරළා දමා හමුදාව බලය ඇල්ලීමෙන් පසු පවත්වන ලද පළමු වැනි මැතිවරණය වීම නිසා.

එම හමුදා කුමන්ත්‍රණය සිදු වුණේ 2021 වසරේ. ඒ, 2020 වසරේ පැවති මහා මැතිවරණයකින් විශිෂ්ට ජයග්‍රහණයක් ලබා අවුන් සාන් සූ කී සහ ඇගේ ජාතික ප්‍රජාතන්ත්‍රවාදී ලීගය ආණ්ඩුවක් පිහිටුවා තිබූ පසුබිමක. එම මැතිවරණය පැවැත්වුණේ 2020 නොවැම්බර් මාසයේ. එහෙත් 2021 පෙබරවාරි මාසයේ හමුදා කුමන්ත්‍රණය සිදු වුණා. එයින් පසු බිහි වූ හමුදා ආණ්ඩුවට චීනය, රුසියාව වැනි රටවල සහයෝගය ලැබුණා. මෙවැනි පාර්ශ්ව අවුන් සාන් සූ කී සහ ඇගේ පක්ෂය සැලකුවේ බටහිර බලවතුන්ට හිතවත් පාර්ශ්ව හැටියට. නව මහා මැතිවරණය පැවැත්වුණේ වසර 05ක හමුදා පාලනයකින් පසුව. මේ මැතිවරණය ගැන බොහෝ දෙනාගේ අවධානය යොමුවන්නට ඉහත කී පසුබිම හේතුවක් වුණා.

මැතිවරණය පැවැත්වුණේ අදියර තුනක් යටතේ. පළමු වැනි අදියර 2025 දෙසැම්බර් 28 දින පවත්වන ලද අතර දෙ වැනි සහ තුන් වැනි අදියර පිළිවෙළින් ජනවාරි 11 සහ 25 යන දිනවල පැවැත්වුණා. මෙය බොහෝ පාර්ශ්වවල විවේචනයට ලක් වූ මැතිවරණයක්. දේශීය වශයෙන් මෙන් ම ජාත්‍යන්තරයෙන් ද විවේචන ඉදිරිපත් වුණා. ඔවුන් පැවසුවේ මැතිවරණය හුදෙක් ප්‍රෝඩාවක් පමණක් බව. එය එරට ක්‍රියාත්මක වන හමුදා පාලනයට නීත්‍යානුකූලභාවයක් සහ ව්‍යාජ ප්‍රජාතන්ත්‍රවාදී මුහුණුවරක් ලබා දීම සඳහා පැවැත්වූ ප්‍රෝඩාකාරී මැතිවරණයක් බවට බොහෝ විවේචන එල්ල වුණා.

එක්සත් ජාතීන්ගේ සංවිධානය, ආසියාන් සංවිධානය, යුරෝපා සංගමය ආදී පාර්ශ්ව ද මැතිවරණය විවේචනයට ලක් කළා. මැතිවරණය පැවැත්වුණේ හමුදා පාලනයට එරෙහි විරුද්ධ පක්ෂ විවිධාකාරයෙන් මර්දනය කර අකර්මණ්‍ය කර තිබූ පසුබිමක. හමුදාව බලය ඇල්ලීමට කලින් පැවති මැතිවරණවලදී විශිෂ්ට ජයග්‍රහණ වාර්තා කළ, රටේ ජනප්‍රිය ම පක්ෂය ලෙස සැලකිය හැකි අවුන් සාන් සූ කීගේ ජාතික ප්‍රජාතන්ත්‍රවාදී ලීගයට ද මැතිවරණයට තරග කිරීමට ඉඩ ලැබුණේ නැහැ. ඒ, හමුදාවේ පාලනය යටතේ පවතින මැතිවරණ කොමිසම විසින් 2023 වසරේ එම පක්ෂය විසුරුවා හරිනු ලැබූ නිසා.

සූ කීගේ පක්ෂය විසුරුවා හැරීමට පසුබිම් වූ තත්ත්වය විමසා බැලීමත් මෙහිදී වැදගත්. 2023 ජනවාරි මාසයේ හමුදා ජුන්ටාව දේශපාලන පක්ෂ ලියාපදිංචි කිරීම පිළිබඳ නව නීතියක් ගෙන ආවා. තිබෙන දේශපාලන පක්ෂත් මේ අනුව අලුතෙන් ලියාපදිංචි විය යුතු වුණා. මෙහිදී මේ පක්ෂ සපුරාලිය යුතු කොන්දේසිත්

> 2023 ජනවාරි මාසයේ හමුදා ජුන්ටාව දේශපාලන පක්ෂ ලියාපදිංචි කිරීම පිළිබඳ නව නීතියක් ගෙන ආවා. තිබෙන දේශපාලන පක්ෂත් මේ අනුව අලුතෙන් ලියාපදිංචි විය යුතු වුණා. මෙහිදී මේ පක්ෂ සපුරාලිය යුතු කොන්දේසිත් ප්‍රකාශයට පත් වුණා. හමුදාව විසින් හඳුන්වා දෙන ලද ව්‍යවස්ථාව පිළිගැනීම, හමුදාව හඳුන්වා දුන් මැතිවරණ ක්‍රමය පිළිගැනීම වැනි කොන්දේසි ද ඒ අතර තිබුණා.

ප්‍රකාශයට පත් වුණා. හමුදාව විසින් හඳුන්වා දෙන ලද ව්‍යවස්ථාව පිළිගැනීම, හමුදාව හඳුන්වා දුන් මැතිවරණ ක්‍රමය පිළිගැනීම වැනි කොන්දේසි ද ඒ අතර තිබුණා. දින 60ක් ඇතුළත ලියාපදිංචි විය යුතු බවත් ප්‍රකාශයට පත් වුණා. එසේ නොවුණහොත් පක්ෂ විසුරුවා හරින බවයි මැතිවරණ කොමිසම දැනුම් දුන්නේ. මේ කොන්දේසි යටතේ ලියාපදිංචි වීමට සූ කීගේ ජාතික ප්‍රජාතන්ත්‍රවාදී ලීගය ඇතුළු ඇතැම් පක්ෂ කැමැත්ත දැක්වූයේ නැහැ.

ඔවුන් පැවසුවේ මේ කොන්දේසි යටතේ ලියාපදිංචි වීම හමුදා කුමන්ත්‍රණය පිළිගැනීමක් හා සමාන බව. නව කොන්දේසි යටතේ පවත්වන කිසිදු මැතිවරණයකින් මියන්මාර ජනතාවගේ සැබෑ කැමැත්ත පිළිබිඹු නොවනු ඇති බවටත් ඔවුන් තර්ක කළා.

මේ අනුව පක්ෂ ලියාපදිංචි නොවුණු නිසා ඒවා විසුරුවා හැරුණා. හමුදා ජුන්ටාව නව නීතියක් ගෙන ආවේ ම මේ පක්ෂ අපහසුතාවට පත් කිරීමේ සහ ඒවා විසුරුවා හැරීමට මාර්ගයක් පාදා ගැනීමේ අරමුණෙන් බවයි පෙනුණේ. 2023 මාර්තු 28 දින ජාතික ප්‍රජාතන්ත්‍රවාදී ලීගය විසුරුවා හැරුණා.

නොබෝද මහා මැතිවරණය පැවැත්වුණේ බොහෝ විරුද්ධ පක්ෂ නායකයන් සහ සාමාජිකයන් ද විවිධ හේතු මත අත්අඩංගුවට ගෙන සිරගත කර ඇති පසුබිමක. නිදසුනක් ලෙස අවුන් සාන් සූ කී ද හමුදා කුමන්ත්‍රණයෙන් පසු අත්අඩංගුවට ගැනුණු අතර විවිධ චෝදනා යටතේ නඩු පවරා සිර දඬුවම් දෙනු ලැබුවා. මෙතෙක් සමස්තයක් ලෙස ඇයට වසර 27ක පමණ සිර දඬුවම් නියම වී තිබෙනවා. බොහෝ පාර්ශ්ව පෙන්වා දෙන්නේ සූ කීට එරෙහි ව එල්ල කළ චෝදනා ඇය දේශපාලන කරළියෙන් ඉවත් කිරීමේ අරමුණෙන් එල්ල කළ ඒවා බව. මේ සියලු තත්ත්ව යටතේ ජනප්‍රිය, ප්‍රබල පක්ෂවලටත් අපේක්ෂකයන්ටත් මහා මැතිවරණයට ඉදිරිපත් වීමේ හැකියාවක් තිබුණේ නැහැ.

මෙවර මැතිවරණය නිදහස් සහ සාධාරණ මැතිවරණයක් නොව ප්‍රෝඩාවක් පමණක් බවට චෝදනා එල්ල වන්නේ මෙවැනි පසුබිමක. රටේ ඇතැම් ප්‍රදේශවල ඡන්ද විමසීම් පැවැත්වුණේත් නැහැ. ඒ, එම ප්‍රදේශවල ක්‍රියාත්මක විවිධ සන්නද්ධ



අවුන් සාන් සූ කී




ජනරාල් මින් අවුන් හ්ලයිං

නොබෝදා මහා මැතිවරණය පැවැත්වුණේ බොහෝ විරුද්ධ පක්ෂ නායකයන් සහ සාමාජිකයන් ද විවිධ හේතු මත අත්අඩංගුවට ගෙන සිරගත කර ඇති පසුබිමක. නිදසුනක් ලෙස අවුන් සාන් සූ කී ද හමුදා කුමන්ත්‍රණයෙන් පසු අත්අඩංගුවට ගැනුණු අතර විවිධ චෝදනා යටතේ නඩු පවරා සිර දඬුවම් දෙනු ලැබුවා. මෙතෙක් සමස්තයක් ලෙස ඇයට වසර 27ක පමණ සිර දඬුවම් නියම වී තිබෙනවා.

කණ්ඩායම් සහ හමුදාව අතර ගැටුම් පවතින නිසා. මේ ප්‍රදේශවල පවතින දුර්වල ආරක්ෂක තත්ත්වය නිසා ඡන්ද විමසීම් පැවැත්වුණේ නැහැ. ඇතැම් සන්නද්ධ කණ්ඩායම් හමුදා පාලනයට විරුද්ධ ව සටන් කරන කණ්ඩායම් වන අතර තවත් සමහර කණ්ඩායම් විවිධ ප්‍රදේශ සඳහා ස්වයංපාලන අයිතීන් දිනාගැනීමට සටන් කරන ජන වාර්ගික කණ්ඩායම්.

මියන්මාරයේ පරිපාලන කොට්ඨාස අතරින් 20%ක පමණ ඡන්ද විමසීම් පැවැත්වුණේ නැහැ. දේශපාලන පක්ෂ 06ක් පමණ ජාතික මට්ටමින් මැතිවරණයට තරග කර තිබුණා. තවත් පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම් 51ක් ප්‍රාදේශීය මට්ටමින් තරග කිරීමට ඉදිරිපත් ව තිබූ බවත් වාර්තා වෙනවා. අවුන් සාන් සූ කීගේ ජාතික ප්‍රජාතන්ත්‍රවාදී ලීගය වැනි ජනප්‍රිය පක්ෂ තරග නොකළ පසුබිමක මැතිවරණයේදී තරග කළ ප්‍රධාන ම පක්ෂය වූයේ යූනියන් සහයෝගිතා සහ සංවර්ධන පක්ෂය. මෙය හමුදාවේ පක්ෂයක් ලෙස හැඳින්වුවත් වරදක් නැහැ. එය හමුදාව විසින් හමුදාවේ අවශ්‍යතා වෙනුවෙන් පිහිටුවන ලද පක්ෂයක් හැටියටයි සැලකෙන්නේ.

මේ සටහන ලියන අවස්ථාව වන විට මැතිවරණයේ අවසන් නිල ප්‍රතිඵල ප්‍රකාශයට පත් ව තිබුණේ නැහැ. එහෙත් ඒ වෙද්දී නිකුත් වී තිබූ ප්‍රතිඵලවලින් පෙනී ගියේ යූනියන් සහයෝගිතා සහ සංවර්ධන පක්ෂය පහසු ජයක් හිමි කරගනු ඇති බව. සූ කීගේ පක්ෂය විශාල ජයග්‍රහණයක් වාර්තා කළ 2020 මැතිවරණයේදී යූනියන් සහයෝගිතා සහ සංවර්ධන පක්ෂය ජයග්‍රහණය කළේ සමස්ත ආසන සංඛ්‍යාවෙන් 6%ක සංඛ්‍යාවක් පමණයි. මැතිවරණය පවත්වා මාස දෙකක් ඇතුළත පාර්ලිමේන්තුව රැස්වීමට නියමිත ව තිබෙනවා. එහිදී මන්ත්‍රීවරුන්ගේ ඡන්දයෙන් ජනාධිපතිවරයකු පත්කර ගැනෙනු ඇති. 2021 හමුදා කුමන්ත්‍රණයට නායකත්වය දුන් ජනරාල් මින් අවුන් හ්ලයිං එම ධුරයට පත් වනු ඇති බවයි විශ්වාස කෙරෙන්නේ. පසුගිය කාලයේ තාවකාලික ජනාධිපති ලෙස කටයුතු කළේත් ඔහු. මැතිවරණය නිදහස් සහ සාධාරණ මැතිවරණයක් නොවූ බවට එල්ල වන චෝදනා හමුදා ජුන්ටාව ප්‍රතික්ෂේප කරනවා.



# මානව ප්‍රාග්ධනයේ හැරවුම

**ධනුෂ්ක හර්ෂණ වික්‍රමරත්න**

නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අවශ්‍යතාවට ජනමතයක් පැවතියේ දිගුකාලයක සිට. වත්මන් ආණ්ඩුව ඒ සඳහා දීර්ඝකාලීන අධ්‍යයනයකින් පසුව ප්‍රවේශයක් ලබා තිබෙනවා. මේ ඔස්සේ ලාංකික ජාතියේ වත්මන් හා අනාගත දරුවන් උදෙසා පුළුල්, ගැඹුරු සමාජ පරිවර්තනයක් ද කළ යුතු වෙනවා. වර්තමානයේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවට නැංවීම සම්බන්ධයෙන් යම් උණුසුම් සංවාදයක් ද පවතින හෙයින් මෙවර දෙසතිය කවරයේ කතාබහ වෙන් වන්නේ එවැනි ප්‍රතිසංස්කරණවල අවශ්‍යතාව හා එයින් සිදු වන සමාජ පරිවර්තනයේ සාධනීය පැතිකඩ විමසා බැලීමට.

### සමාජ සංවර්ධනයට අනුගත ශික්ෂණය

මානව සමාජය ඉදිරියට ගමන් කරන්නේ නිෂ්පාදනයේ වර්ධනය සමග. නිෂ්පාදනය වර්ධනය සඳහා නිෂ්පාදන බලවේග නම් ද්‍රව්‍යමය සාධකය අත්‍යවශ්‍ය වෙනවා. දියුණු කරන ලද මානව ශ්‍රමය, අමුද්‍රව්‍ය, යන්ත්‍රසූත්‍ර, බලශක්තිය වැනි දේ මෙයට අයත්. මෙහි ජීවමය මූලධාතුව මිනිසා. මෙතැනින් මිනිසා ඉවත් කළ පසු නිෂ්පාදනයක් නැහැ. නිෂ්පාදනය යන්නෙහි අවශ්‍යතාවක් ද නැහැ. එසේනම් තවදුරටත් සමාජය යන්න ද පවතින්නක් නැහැ. අනෙක් අතට නිෂ්පාදන බලවේගවල සජීව නොවන ද්‍රව්‍යමය සාධක ඉවත් කළ විට මිනිසා නම් සමාජමය නොවන හුදු සත්ත්වයෙකු පමණයි ඉතිරි වන්නේ.

ඒ නිසා අධ්‍යාපනය යනු සමාජ සංවර්ධන ක්‍රියාවලියේ නිෂ්පාදන බලවේගවල වර්ධනයට අනුරූපී ශ්‍රමිකයෙකු දක්වා ද එයට අනුරූපී සමාජ සම්බන්ධතා ක්‍රමයක මනාව හැසිරෙන්නෙකු වශයෙන් ද මිනිසා ශික්ෂණය කිරීම. එහිදී ඔහු තාක්ෂණ අවබෝධයෙන් ඉදිරියෙන් සිටින්නෙකු විය යුතු අතර ම යහපත් සමාජ සම්බන්ධතා ක්‍රමයක බැඳුණු සාමූහික මිනිසෙකු ද විය යුතුයි. මුල් ම අවධියේ මිනිසා ඉගෙන ගත්තේ අත්දැකීම් සහ අත්විඳීම් සහිත වැඩිහිටියන්ගෙන්. එහි වැඩි පාර්ශ්වය වන්නේ ප්‍රායෝගික ස්වයං අධ්‍යයනය. එහි සාපේක්ෂ ව උපදේශනය අඩු අතර අධ්‍යාපනය පාරම්පරික දැනුම පුරුදු කරන ක්‍රමයක් වුණා. මිනිසාගේ අත්දැකීම් පුළුල් හා සංකීර්ණ වෙද්දී අධ්‍යාපනය සංවිධානාත්මක කරන්නටයි සිදුවුණේ. ඒ අනුව ගුරුකුල ද පසුව සංවිධිත පාසැල් ද බිහි වුණා. 'ඉස්කෝලය' යන්න ග්‍රීක අර්ථය අනුව හැඳින්වෙන්නේ 'ශ්‍රමයට පසු විවේකය' යනුවෙන්. ශ්‍රමයට පසු විවේකය යනු මිනිසා නින්දට වැටීම නොවෙයි. තවත් ශ්‍රමික සමූහයක් හා විවේකී ව සම්බන්ධතා පැවැත්වීම. එහිදී ඔවුන් අත්විඳීම්, අත්දැකීම් හුවමාරු කළ යුතු අතර ඒ අනුව මිනිසා ශ්‍රමය හා තාක්ෂණය පිළිබඳ දැනුම ද ශ්‍රම පුහුණුවට අදාළ මඟපෙන්වීම ද ලබා දෙනවා. ඒ නිසා අධ්‍යාපනය යන්න ශ්‍රම ක්‍රියාවලිය හා නිරන්තර බැඳෙන්නක්.

> සියල්ල මනාව සුදානම් කර කිසිදු අඩුපාඩුවක් නොවන සේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සිදුවිය යුතු යැයි කෙනෙකු පැවසිය හැකියි. එය යථාර්ථයෙන් පලා යන සිහිනයක් පමණයි. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යනු මනෝරාජික ව සපුරාලිය හැකි සමාජ කාර්යයක් නොවෙයි. අප එය ඇරඹිය යුතුයි. එහෙත් එය ඇරඹිය යුත්තේ පවතින දෙයින් මිස අවසානයේ පැවැතිය යුතු අප බලාපොරොත්තු වන තත්ත්වයෙන් නොවෙයි.

### සමාජ පරිවර්තනයකට අධ්‍යාපන ප්‍රතිසංස්කරණ

ජනතාව විවිධ දේශපාලන ව්‍යාපාර අත්හදා බලමින් ඉල්ලා සිටියේ ක්‍රමයේ වෙනසක්. යම් කල් ඉකුත් වූ සමාජ ක්‍රමයක් එහි අත්තිවාරමෙන් ම වෙනස් කිරීම සමාජ පරිවර්තනයයි. සමාජ පරිවර්තනයකදී එයට හිතවාදී සමාජ ප්‍රතිසංස්කරණ අවශ්‍ය වෙනවා. ඒ නිසා අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සකස් විය යුත්තේ සමාජ පරිවර්තනයකට හිතකර ලෙස සහ යහපත් සංවර්ධිත සමාජ සම්බන්ධතා හෙවත් මානව ශ්‍රම සම්බන්ධතා ගොඩනංවන දිශාවට. මේ නිසා ප්‍රගතිශීලී අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යනු දැනුම දීම සහ දැනුම පරීක්ෂා කිරීමෙන් ඔබ්බට ගිය දියුණු මානව ශ්‍රමයක්

ද දියුණු මානව සමාජ සම්බන්ධතා ද ගොඩනැංවීමට තාර්කික ව හුරුකරන ක්‍රියාවලියක්. සියල්ල මනාව සූදානම් කර කිසිදු අඩුපාඩුවක් නොවන සේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සිදුවිය යුතු යැයි කෙනෙකු පැවැසිය හැකියි. එය යථාර්ථයෙන් පලා යන සිහිනයක් පමණයි. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යනු මනෝරාජික ව සපුරාලිය හැකි සමාජ කාර්යයක් නොවෙයි. අප එය ඇරඹිය යුතුයි. එහෙත් එය ඇරඹිය යුත්තේ පවතින දෙයින් මිස අවසානයේ පැවැතිය යුතු අප බලාපොරොත්තු වන තත්ත්වයෙන් නොවෙයි. දියඹ සිට ගොඩබිමට පිවිසෙන ඕනෑ ම අයෙකු වෙරළට පා තැබිය යුතුමයි. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගොඩනැඟෙන්නේ කුලුනු 05ක් මත. ඒවා පවතින තත්ත්වයෙන් ඉහළට එසවිය යුතු නව පාදමක් සකස් කරනවා.

### විෂය මාලා නිර්දේශ සංවර්ධනය

විෂය මාලා සංවර්ධනය අධ්‍යාපන විශේෂඥයන් සතු කාර්යයක්. එහිදී අධ්‍යාපන මනෝවිද්‍යාව ද ඇසුරු කළ යුතු වෙනවා. මෙහිදී වැදගත් ම කාර්යය වන්නේ අධ්‍යාපන විශේෂඥයන් අධ්‍යාපන ප්‍රතිපත්ති සකස් කළ දෘෂ්ටිමය පදනම හෙවත් දැක්ම වටහා ගැනීම. නැවත ද ආචීර්ණකල්පිත ව ගතානුගතික දෘෂ්ටි මත සිර කළ චින්තනයක් සහිත විශේෂඥයන් එයට බාධාවක් වනු ඇති. එහෙත් පවතින යථාර්ථයේ සිට නොබිය ව ප්‍රතිසංස්කරණයට පා තැබිය යුතුයි.

### මානව සම්පත් සංවර්ධනය

සමස්ත අධ්‍යාපන ප්‍රතිසංස්කරණයේ මූලික අවශ්‍යතාව වන්නේ මානව සම්පත සංවර්ධනය. ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය සහ එහි අධ්‍යාපනය පවත්වා ගැනීම සඳහා අවශ්‍ය උපදේශකයන්, පුහුණුකරුවන් සහ විෂය භාර ගුරුවරුන් පුහුණු කර සූදානම් කිරීම මෙහි අරමුණ වෙනවා. එය අප කළ යුත්තේ ද වෙනත් ක්‍රමයකට අනුගත ව කලක් වැඩ කළ, පුරුද්ද සහිත යම් ක්‍රමයකට ඇබ්බැහි වූ නිලධාරීන් හා කාර්ය මණ්ඩල සමඟ. එයට අදාළ පිරිස තෝරා ගැනීමේදී ආකල්පමය වශයෙන් හෝ දේශපාලන වශයෙන් හෝ මේ වෙනස්වීමට විරුද්ධ පිරිස් පවා ඇතුළත් විය හැකියි. එහිදී කඩාකප්පල් කිරීම්, ජනතාව නොමඟ යවනසුලු කුමන්ත්‍රණ පැවැතිය හැකියි. පටන් ගත යුත්තේ ම මේ අභියෝග බලාපොරොත්තුවෙන් සහ දැනට අපට ලැබී ඇති තත්ත්වයේ සිට.

### යටිතල පහසුකම් සංවර්ධනය හා අධ්‍යාපන පරිපාලන ප්‍රතිසංස්කරණ

මේ කාරණය එළඹෙන්නේ සමාජ විෂමතාව තුරන් කිරීම යන්න අරමුණු කරගෙන. සම්පත් හිඟකම යනු සමාජ විෂමතාවේ ප්‍රතිඵලයක්. එය සම්පත් බෙදීයාමේ විෂමතාව පැවති සහ වෙනස්වීම ඉරණමකොට පවතින යල්පැන ගිය සමාජ ක්‍රමයේ දායාදයක්. විෂමතා හේතුවෙන් ඉගෙනුම ලබන දරුවාට සාධාරණ අවස්ථා අහිමි වන අතර ඔහුගේ අධ්‍යාපන වර්ධන වේගයට එය බාධා කරනවා. අනෙක් අතට සම්පත් හිඟකම නිසා නිලධාරිවාදය හෙවත් වරප්‍රසාද අරමුණුකොට බලය යොදා ගන්නා තත්ත්වය පැරැණි සමාජ ඇබ්බැහියක් ලෙස ඉස්මතු වෙනවා. එය ප්‍රගතිශීලී පරිවර්තනයකට බාධා කරන උප සංස්කෘතියක් නිර්මාණය කරනවා. ඒ නිසා පියවරෙන් පියවර එම තත්ත්ව පරාජය කරමින් සම්පත් අවශ්‍යතා සාධාරණ ව දරුවන් වෙත ලැබිය යුතුයි. එය එක්වර පරාජය කළ නොහැකි, උපායමාර්ගික ආර්ථික මෙහෙයුමකින් සැලසුම් සහගත ව පරාජය කළ යුත්තක්.

විෂමතා හේතුවෙන් ඉගෙනුම ලබන දරුවාට සාධාරණ අවස්ථා අහිමි වන අතර ඔහුගේ අධ්‍යාපන වර්ධන වේගයට එය බාධා කරනවා. අනෙක් අතට සම්පත් හිඟකම නිසා නිලධාරීවාදය හෙවත් වරප්‍රසාද අරමුණුකොට බලය යොදා ගන්නා තත්ත්වය පැරැණි සමාජ ඇබ්බැහියක් ලෙස ඉස්මතු වෙනවා. එය ප්‍රගතිශීලී පරිවර්තනයකට බාධා කරන උප සංස්කෘතියක් නිර්මාණය කරනවා. ඒ නිසා පියවරෙන් පියවර එම තත්ත්ව පරාජය කරමින් සම්පත් අවශ්‍යතා සාධාරණ ව දරුවන් වෙත ලැබිය යුතුයි. එය එක්වර පරාජය කළ නොහැකි, උපායමාර්ගික ආර්ථික මෙහෙයුමකින් සැලසුම් සහගත ව පරාජය කළ යුත්තක්.





**තක්සේරුව සහ ඇගයීම**

දරුවා ලබන අධ්‍යාපනයේ ඵලදායී බව, කාර්යක්ෂම බව, ප්‍රායෝගික බව තක්සේරුකොට ඇගයිය යුතුයි. ඒ සඳහා විභාග කේන්ද්‍රීය නොවන අධ්‍යාපනයකදී භාවිත වන ඇගැයීම් උපකරණ භාවිත විය යුතුයි. එය සාධාරණ සහ සමාජ ප්‍රගමනය මිම්ම කර ගත්තක් විය යුතුයි. එය දරුවාගේ ඉදිරිපත්වීමක් මිස ගුරුවරයාගේ බලහත්කාරයක් නොවිය යුතුයි. එය දරුවා අධ්‍යාපනයට ආකර්ෂණය කරන්නක් විය යුතුයි.

**මහජන දැනුවත්භාවය සහ ප්‍රවර්ධනය**

අධ්‍යාපන ප්‍රතිසංස්කරණයේ ආරක්ෂකයා වන්නේ දැනුවත් ජනතාව. මහජන දැනුවත් කිරීම වැදගත් වන්නේ ඔවුන්ට මේ ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය හොඳින් වැටහීම එම ක්‍රියාවලියට පහසුවක් වන නිසා. එසේ අවබෝධයලත් ජනතාව මෙහි ආරක්ෂකයන් වන නිසා. ඒ ඔස්සේ ජනතාවට විරුද්ධ මත දරන්නන් සමඟ බුද්ධිමය අරගලයකට පිවිසිය හැකි නිසා. එය එක් මෙහෙයුමකින් සම්පූර්ණ කළ නොහැකියි. එය ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියට සමාන්තර වූවක්. මෙය ඉතා දුෂ්කර සංකීර්ණ මෙහෙයුමක්. සියල්ල අවසානයට ම අවබෝධ කර දී පසුව ප්‍රතිසංස්කරණය ඇරඹිය නොහැකියි. ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය යනු නැවත නැවත සමාලෝචනය කරමින්, නැවත නැවත නිවැරැදි කරමින් යා යුතු සරල රේඛාවක් නොවන මාවතක්.

> අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට එරෙහිවීමේ දේශපාලනය සුලබ කතාබහක්. මෙහිදී සිදු වන්නේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ විරෝධී අවිද්‍යාත්මක වෛරී ප්‍රහාර එල්ල වීම. ඒවා මිනිසුන්ගේ නොදැනුවත්භාවය සංවිධිත දේශපාලනය විසින් අවභාවිත කරනු ලැබීමක්. සැබවින් ම ගතානුගතික ජනතා ද්‍රෝහි දේශපාලනය සමාජය යහපත් හා දියුණු දිශාවට වර්ධනය වනවාට කැමැති නැහැ. ඔවුන්ට අවශ්‍ය වන්නේ ඔවුන්ගේ ඇබ්බැහිය වූ යල්පැන ගිය සමාජ භාවිතාවක් හා දූෂිත ජීවන රටාවක් නඩත්තුව සඳහා පවතින ක්‍රමය රැකගැනීම. ඒ නිසා අධ්‍යාපන ප්‍රතිසංස්කරණ විරෝධය හමුවේ නිරුවත් වන්නේ මේ ගතානුගතික විපක්ෂ දේශපාලන යථාර්ථය.

**ප්‍රතිසංස්කරණ ක්‍රියාවට නැංවීම**

මේ වන විට ආණ්ඩුව අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල විෂය මාලා සංවර්ධනය යන කුලුන ඉදිකිරීම යම් ප්‍රමාදයකට ලක්කොට තිබෙනවා. ඒ, ජනතාව දැනුවත් කිරීමේ කුලුන ඉදිකිරීම තව ශක්තිමත් ව කළ යුතු යැයි හැඟුණ නිසා. අනවබෝධයේ සිට දේශපාලනික ව විවේචනයට ලක් වූ සංකල්පයක් බලහත්කාරයෙන් ස්ථාපිත කිරීම දිගුකාලීන ව අවාසි ගෙන දෙන්නක්. එබැවින් කාලය හා ඉවසීම ද විරෝධයෙන් කලබල නොවී මුහුණදීමේ ගුණය ද වැදගත්. මෙහිදී දේශපාලනික ව එල්ල වූ චෝදනාවල අඩංගු සත්‍යය විමසා බැලීම වැදගත්.

සමලිංගිකත්වය යනු ප්‍රවර්ධනය කළ හැක්කක් නොවන බව නොදන්නා සමාජයකට අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අත්‍යවශ්‍ය බව පිළිබඳ ව වෙන ම තර්ක කළ යුතු නැහැ. සමලිංගිකත්වය යම් ජීවවිද්‍යාත්මක විශේෂතා මත වන පෙළඹුමක්. සමාජයේ එවැනි පිරිස් සිටින්නේ ඉතා අඩු ප්‍රතිශතයක්. සමලිංගිකත්වය යනු සමාජ බහුතරය නොවෙයි. එහෙත් ඔවුන් රටක පුරවැසියන්. ඔවුන් දරුවන් බිහි නොකළ ද දරුවන් කෙරෙහි බැඳීම් නොමැති නරුමයන් ද නොවෙයි. එම මිනිස් කාණ්ඩය වෙනුවෙන් පෙනී සිටීම අපරාධයක් නොවෙයි. එහෙත් සමලිංගික තෝරා ගැනීමකට රුචිකත්වය නොමැති පුද්ගලයන් අධ්‍යාපනයකින් ඒ වෙත පොලඹවා සමලිංගික ප්‍රජාව වර්ධනය කරන්නට බැහැ. සමලිංගික හා විෂමලිංගික රුචිකත්ව දෙක ම සහිත පිරිස් ද සිටිනවා. ඒ නිසා අවශ්‍යතාවක් තිබුණත් සමලිංගිකත්වය කිසිවකුට අධ්‍යාපනයෙන් ප්‍රවර්ධනය කළ නොහැකියි. එවැනි ප්‍රජාවක් කෙරෙහි වන සමාජ අසාධාරණකම් කෙරෙහි සහකම්පනය ඇති කරගත හැකි දියුණු මනසක් සහිත මිනිසුන් ගොඩනැඟීමට අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට හැකියාව තිබෙනවා.

විෂය මාලාවෙන් ඉතිහාසය ඉවත් කිරීම සම්බන්ධයෙන් ද කතාබහ තිබෙනවා. මෙයින් අදහස් වන්නේ ඉතිහාසය අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල නැති බව නොව 'ඔවුන්ට අවශ්‍ය තැනින් පමණක් ගෙන' ඉතිහාසය උගන්වන්නේ

නැති බව. 'ඉගැන්විය යුත්තේ රෝදයේ ඉතිහාසය නොව අනෙකක් ය' යන්න පැවැසීමේ තිබෙන්නේ එම අදහසයි. සමාජයක් සංවර්ධනය වන බව නොදන්නා ගතානුගතික චින්තකයන් ලෝකය ඉදිරියට යනවාට එරෙහිවයි ක්‍රියා කරන්නේ. සැබවින් ම විශ්වය ප්‍රසාරණයේ ආරම්භයේ සිට ම ඉතිහාසය උගන්වන්නේනම් සියලු අවිද්‍යා ද සියලු මිත්‍යා ද පරාජය වනු ඇති. එසේ ඉගෙනගත් පමණින් ද එය එසේ වන්නේ නැහැ. ඒ සඳහා තාර්කික අධ්‍යයන භාවිතයක් හුරු කළ යුතුයි. අවශ්‍ය කටපාඩම් යන්ත්‍ර නොව තාර්කික චින්තන ප්‍රභව. එයට උදවු කරන අධ්‍යාපනයක්. ඉගැන්විය යුත්තේ ද්‍රව්‍ය සංවර්ධනයේ ඉතිහාසය, සමාජ සංවර්ධනයේ ඉතිහාසය හා මානව චින්තනයේ ඉතිහාසය.

ප්‍රතිසංස්කරණ, සංස්කෘතිය විනාශ කරනවා ද? යන්නත් සංවාදයට ලක්වූවක්. මිනිසා මෙතෙක් එක්රැස් කරගත් ආධ්‍යාත්මික හා භෞතික වටිනාකම් සමස්තය සංස්කෘතිය ලෙස ගැනෙනවා. ඒ නිසා සමාජ සංවර්ධනයේ මට්ටමට සංස්කෘතිය සමානුපාතික විය යුතුයි. එසේ නොවන, පසුබසින සංස්කෘතියකට සංස්කෘතික පිරිහීම යැයි පවසනවා. නිශ්චිත සමාජ මට්ටමක වන සංස්කෘතික ලක්ෂණ යළි වර්ධිත සමාජ මට්ටමකදී නව සංස්කෘතියක් බවටයි පත් වන්නේ. දේශගුණික සාධක හා සමාජ සංවර්ධනයේ තමන් දරන ස්ථානය අනුව සංස්කෘතියේ පැති ද්විත්වයක් තිබෙනවා. භෞතික හා ආධ්‍යාත්මික පාර්ශ්ව දෙකකින් සමන්විත සංස්කෘතිය, විචිත්‍රත්වය සහිත පොදු මානව ප්‍රපංචයක්. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලින් සිදුවන්නේ මේ විචිත්‍රත්වයෙන් තෘප්තිමත් මානව චින්තනය සහිත දරුවකු ගොඩනැගීම. ඒ නිසා අධ්‍යාපන ප්‍රතිසංස්කරණ විසින් සංස්කෘතිය වනසනු ලබනවා නොව සංස්කෘතිය පිළිබඳ අවබෝධය පුළුල් කිරීමට අධ්‍යාපන ප්‍රතිසංස්කරණ දයක වීමයි සිදු වන්නේ.

දේශගුණික සාධක හා සමාජ සංවර්ධනයේ තමන් දරන ස්ථානය අනුව සංස්කෘතියේ පැති ද්විත්වයක් තිබෙනවා. භෞතික හා ආධ්‍යාත්මික පාර්ශ්ව දෙකකින් සමන්විත සංස්කෘතිය, විචිත්‍රත්වය සහිත පොදු මානව ප්‍රපංචයක්. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලින් සිදුවන්නේ මේ විචිත්‍රත්වයෙන් තෘප්තිමත් මානව චින්තනය සහිත දරුවකු ගොඩනැගීම. ඒ නිසා අධ්‍යාපන ප්‍රතිසංස්කරණ විසින් සංස්කෘතිය වනසනු ලබනවා නොව සංස්කෘතිය පිළිබඳ අවබෝධය පුළුල් කිරීමට අධ්‍යාපන ප්‍රතිසංස්කරණ දායක වීමයි සිදු වන්නේ.

අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට එරෙහිවීමේ දේශපාලනය සුලබ කතාබහක්. මෙහිදී සිදු වන්නේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ විරෝධී අවිද්‍යාත්මක වෛරී ප්‍රහාර එල්ල වීම. ඒවා මිනිසුන්ගේ නොදැනුවත්භාවය සංවිධිත දේශපාලනය විසින් අවභාවිත කරනු ලැබීමක්. සැබවින් ම ගතානුගතික ජනතා ද්‍රෝහි දේශපාලනය සමාජය යහපත් හා දියුණු දිශාවට වර්ධනය වනවාට කැමැති නැහැ. ඔවුන්ට අවශ්‍ය වන්නේ ඔවුන්ගේ ඇබ්බැහිය වූ යල්පැන ගිය සමාජ භාවිතාවක් හා දූෂිත ජීවන රටාවක් නඩත්තුව සඳහා පවතින ක්‍රමය රැකගැනීම. ඒ නිසා අධ්‍යාපන ප්‍රතිසංස්කරණ විරෝධය හමුවේ නිරුවත් වන්නේ මේ ගතානුගතික විපක්ෂ දේශපාලන යථාර්ථය. මෙය ප්‍රභූ පංතිය හා නිර්ප්‍රභූ පංතිය අතර වන පංති ගැටුම ප්‍රකාශ වීමක්. ප්‍රගතිශීලීත්වය හා ප්‍රතිගාමීත්වය අතර අරගලයක්. සංවාදයට ඇහුම්කන්දෙමින්, විරෝධය පරාජය කරමින් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ නම් සමාජ පරිවර්තනයේ සම්පූර්ණ කළ යුතු කොන්දේසි ඉටු කිරීම ප්‍රගතිශීලී සමාජ දේශපාලන ව්‍යාපාරයක හා ප්‍රගතිශීලි ජනතාවගේ සමාජ වගකීමක්.



**නාලක කළුවැව**
ලේකම්
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අවශ්‍යතාව මෑතකාලයේ කෙටිකාලීන ව ඇති වූවක් නෙවෙයි. දීර්ඝකාලීන ව දශක ගණනාවක් පුරා අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගැන සාකච්ඡාව පැවතුණා. දැනට පවතින අධ්‍යාපන අධ්‍යාපන ක්‍රමයේ තිබෙන විභාග කේන්ද්‍රීය ඇගයීම් රටාව හා විෂය නිර්දේශවල පවත්නා සංකීර්ණ බව දරුවන් කෙරෙහි ඇති කරන විවිධ පීඩන තත්ත්ව පිළිබඳ අවධානය යොමු වීමේ ප්‍රතිඵලයක් ලෙසයි නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමට පියවර ගැනුණේ. විශේෂයෙන් පවතින අධ්‍යාපන ක්‍රමයේ විභාග පාදක ව උසස් ප්‍රතිඵල ලබන, විශ්වවිද්‍යාල ප්‍රවේශය ලබන දරුවන් හැර අනෙක් දරුවන්ගේ අනාගත සුරක්ෂිතාව තහවුරු වෙනවා



# පීඩනයෙන් තොර අධ්‍යාපනයක්

ද? යන්න පිළිබඳ නිරන්තරයෙන් ම ප්‍රශ්න කෙරුණා. ඒ තත්ත්වයට පිළියමක් වශයෙනුයි අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සිදු කළ යුතුයි යන යෝජනාව ඉදිරිපත් වුණේ.

දරුවන් වෙත එල්ල වී ඇති පීඩනය අඩු කිරීම මෙන් ම  පාසල් පද්ධතියට ඇතුළු වන සියලු ම දරුවන් විභාග ක්‍රමයෙන් සමත් හෝ අසමත් හෝ වීම සහ එතැනින් ඔබ්බට ගොස් සමාජයේ ජීවත්වීමට අවශ්‍ය කුසලතාවන්ගෙන් සපිරි දරුවන් බිහිකිරීමත් මෙහි අරමුණක්.

අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියක් යනු දීර්ඝකාලීන ක්‍රියාවලියක්. එය කඩිනමින්, ක්ෂණික ව සිදු කරන්නට බැහැ. මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියේ ආරම්භය පටන් ගන්නේ 2018 වර්ෂයේ සිට. විවිධ යෝජනා අනුව විවිධ ආණ්ඩු යටතේ මේ ක්‍රියාවලිය අඛණ්ඩ ව ක්‍රියාත්මක වුණා. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියට දායක වන්නේ ඒ හා සබැඳි ආයතන මිස පුද්ගලයන් හෝ දේශපාලඥයන් හෝ නොවෙයි. එහිදී ප්‍රධාන වශයෙන් ම මීට අදාළ ප්‍රමුඛ වගකීම පැවරී තිබෙන්නේ ජාතික අධ්‍යාපන ආයතනයට. කවුරුන් විසින් ක්‍රියාත්මක කළත් අඛණ්ඩ ව විෂය නිර්දේශ සැකසීම සිදු කරන්නේ ජාතික අධ්‍යාපන ආයතනය. නමුත් රජයක ප්‍රතිපත්ති සමඟ එම අධ්‍යාපන

> අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් සියලු ම මාධ්‍ය ආයතන, මාධ්‍ය ආයතන ප්‍රධානීන් දැනුවත් කළා. ඊට අදාළ සංකල්ප පත්‍රිකාව ප්‍රකාශයට පත් කළා. වෘත්තීය සංගම්වලට මේ පිළිබඳ ව දැනුවත් කිරීම සිදු කළා. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම සඳහා දැනටමත් ගුරුවරුන් 150,000කට ආසන්න පිරිසක් පුහුණු කර අවසන්. මීට අදාළ බොහෝ පාර්ශ්ව දැනුවත් කර අවසන්. තවදුරටත් පුළුල් වශයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් අප ක්‍රියාත්මක කරනවා.

ප්‍රතිසංස්කරණ ගැළපීමක් සිදු කළ යුතුයි. එම ගැළපීම සිදුකරමින් තමයි වත්මන් ආණ්ඩුව අධ්‍යාපන ප්‍රතිසංස්කරණය ක්‍රියාවට නැංවූයේ.

නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ මානව සම්පත් සංවර්ධනය, විෂය මාලා සංවර්ධනය, යටිතල පහසුකම් සංවර්ධනය හා අධ්‍යාපන පරිපාලන ප්‍රතිසංස්කරණ, තක්සේරුව සහ ඇගයීම, මහජන දැනුවත් කිරීම සහ ප්‍රවර්ධනය යනුවෙන්  කුලුනු 05ක් පවතින බව ප්‍රතිපත්තිමය වශයෙන් පිළිගන්නා කරුණක්. නමුත් එක ම මොහොතක, එක ම අවස්ථාවක මේ කුලුනු 05 ගොඩනැංවිය යුතුයි යන්න ප්‍රායෝගික ව බලාපොරොත්තු වන්නේ නැහැ. ඒ ඒ අවස්ථානුකූල ව ප්‍රමුඛතාව ලබා දිය යුත්තේ කුමකටදැයි යන්න ප්‍රායෝගික ව තීරණය කළ යුතුයි. මේ අවස්ථාවේදී අප ප්‍රමුඛතාව ලබා දී තිබෙන්නේ විෂය මාලා සංවර්ධනය සහ මානව සම්පත් සංවර්ධනය කෙරෙහි. ඊට අමතර ව අනෙකුත් කුලුනු සංවර්ධනය කිරීම සම්බන්ධයෙනුත් අවධානය යොමු කරමින් තිබෙනවා. නිදසුනක් ලෙස අධ්‍යාපන පරිපාලන ප්‍රතිසංස්කරණ කළ යුත්තේ ඊළඟ අවස්ථාවේදී.

06 වැනි ශ්‍රේණියේ ඉංග්‍රීසි භාෂා මොඩියුලය සම්බන්ධයෙන් පැන නැඟුණු ගැටලුව පිළිබඳ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය අභ්‍යන්තර පරීක්ෂණයක් පවත්වමින් තිබෙනවා. ඊට අදාළ මූලික පරීක්ෂණය ප්‍රකාර ව නිකුත් කරන ලද අතුරු වාර්තාවෙන් ඉදිරිපත් කරන ලද නිර්දේශ මේ වන විටත් ක්‍රියාත්මක කර අවසන්. අවසාන වාර්තාව ලැබුණු පසු ඒ පිළිබඳ තවදුරටත් පියවර ගන්නවා. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙනුත් පරීක්ෂණයක් පැවැත්වෙමින් තිබෙනවා.

06 වැනි ශ්‍රේණියට අධ්‍යාපන ප්‍රතිසංස්කරණ 2026 වසරේ සිට ක්‍රියාත්මක කිරීම අත්හිටුවීමේ තීරණය අමාත්‍ය මණ්ඩලය විසින් ගන්නා ලද්දක්. ඊට විවිධ හේතු සාධක බලපෑවා. මීට විෂයගත වූ දරුවන්ට අවාසියක් නොවන ආකාරයට මේ සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමටයි අප උත්සාහ කරන්නේ.

අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් සියලු ම මාධ්‍ය ආයතන, මාධ්‍ය ආයතන ප්‍රධානීන් දැනුවත් කළා. ඊට අදාළ



සංකල්ප පත්‍රිකාව ප්‍රකාශයට පත් කළා. වෘත්තීය සංගම්වලට මේ පිළිබඳ ව දැනුවත් කිරීම සිදු කළා. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම සඳහා දැනටමත් ගුරුවරුන් 150,000කට ආසන්න පිරිසක් පුහුණු කර අවසන්. මීට අදාළ බොහෝ පාර්ශ්ව දැනුවත් කර අවසන්. තවදුරටත් පුළුල් වශයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් අප ක්‍රියාත්මක කරනවා.

ඕනෑ ම ක්ෂේත්‍රයක, වසර ගණනාවක් පැවති ක්‍රමවේදයක යම් වෙනසක් සිදු කිරීම ලෙහෙසි පහසු නැහැ. පවත්නා ක්‍රමවේදයේ විවිධ අරමුණු පෙරදැරි ව ඊට අනුගත වූ පිරිසක් සිටිනවා. දැනට පවතින අධ්‍යාපන ක්‍රමය 100%ක් ම දෝෂ සහගත හෝ නරක බව අප කියන්නේ නැහැ. එම අධ්‍යාපන ක්‍රමයේත් ඉතා සාධනීය ලක්ෂණ තිබෙනවා. නමුත් මීට එහා ගිය අධ්‍යාපන ක්‍රමයකුයි නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලින් අප හඳුන්වා දෙන්නේ. පසුගිය දශක ගණනාවකට ම ලංකාවේ නොවුණු දෙයක් නිසා මෙය නුහුරු දෙයක් වෙනවා සමාජයට. ඒ වෙනසට අනුගත වීම පහසු නැහැ. මේ ප්‍රතිසංස්කරණ සමස්ත පද්ධතියට ම සිදුකරන වෙනසක්. ඒ නිසයි රජය තීරණය කළේ ප්‍රතිසංස්කරණ සූදානම් කර තිබුණත් මෙවැනි වෙනසක් සිදු කරන විට මීට වඩා දැනුවත් විය යුතු බව හා ක්‍රමවත් විය යුතු බව. ඒ නිසයි අමාත්‍ය මණ්ඩලය තීරණය කළේ මේ ප්‍රතිසංස්කරණ තවත් වසරකට කල් දැමීමට. වඩාත් පුළුල් ව දැනුවත් කරමින් මේ වැඩපිළිවෙළ ක්‍රියාවට නැංවීමට අපට දැන් තවත් කාලයක් තිබෙනවා.

කෙසේ කළත් මේ සඳහා 100%ක් සමාජයේ එකඟතාවක් ඇති නොවන බව අප පිළිගත යුතු කාරණයක්. ඕනෑ ම දෙයක යහපත, අයහපත දෙක ම තිබෙනවා. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක වීමේදීත් ධනාත්මක සහ ඍණාත්මක ලක්ෂණ දෙක ම තිබෙන්න පුළුවන්. 100%ක් හොඳම ක්‍රමයක් හෝ 100%ක් නරක ක්‍රමයක් කියලා දෙයක් නැහැ. අධ්‍යාපන ක්‍රමයත් ඒ වගේමයි.

**නිරෝෂි දොඹගහගේ**



# සංකල්පනාත්මක වෙනසක්

ආචාර්ය
**ගීතිකා ධර්මසිංහ**
ටොරොන්ටෝ විශ්වවිද්‍යාලය
කැනඩාව

රටක් සිය රාජ්‍යයේ ව්‍යුහාත්මක වෙනසක් සිදු කිරීමේදී සලකා බලන මූලික අංගයක් ලෙස අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හඳුන්වා දෙන්නට පුළුවන්. පශ්චාත් නිදහස් ලංකාවේ අවුරුදු 70කට වැඩි කාලයකට පසුවයි ජනතාව ව්‍යුහාත්මක වෙනසක් අපේක්ෂාවෙන් වත්මන් ආණ්ඩුවට සිය සහමතිය පළ කළේ. ඒ නිසා ජනතා අරගලයෙන් ගොඩ නැගූ අලුත් සමාජ සම්මුතියක අවශ්‍යතාව පිළිබඳ අදහස සහ ඒ වෙනුවෙන් අවශ්‍ය රාජ්‍ය පුරවැසියා බිහි කිරීම මේ ආණ්ඩුව සිය ප්‍රථම කාර්ය ලෙස හඳුනාගනිමින් ඒ සඳහා අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සිය මාධ්‍යය ලෙස තෝරාගෙන තිබුණා. එහෙත් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සිදු කිරීමේදී පැන නගින ගැටලු නිවැරදි ව හඳුනාගෙන ඒවාට සාර්ථක ව මුහුණදීම මෙහිදී ඉතා වැදගත් වෙනවා.

උන්නතිකාමී, රැල්ලට දුවන තරගකාරී මිනිසෙකු වෙනුවට පොදු මිනිසකු නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය සාධකයක් ලෙසින් ද අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හඳුනාගත හැකියි. විචාරාත්මක චින්තනය, විශේෂයෙන් ආචාරධාර්මික තර්කනය, නිර්මාණාත්මක චින්තනය, තනි ප්‍රකාශන ශක්තිය ආදිය දියුණු කළ හැකි ප්‍රතිසංස්කරණ අපට අවශ්‍ය වෙනවා. ඒ අනුව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සිදු කිරීමේදී ඉතාමත් සැලසුම් සහගත ව නිසි ක්‍රමවේදයක් ඔස්සේ ඒවා සිදු කිරීමටයි රජයක් පියවර ගත යුත්තේ.

අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ඔස්සේ බලාපොරොත්තු වන සංකල්පනාත්මක වෙනස ඇති කිරීම සඳහා රජයකට තම රටේ පුරවැසියා කවුරුන් ද? යන්න පිළිබඳවත් මනා අවබෝධයක් තිබිය යුතුයි. මෙවැනි අතිශය සංකීර්ණ වැදගත්කමකින් යුක්ත කාර්යයක් ඉටුකිරීමේදී ජාතික අධ්‍යාපන ආයතනය වැනි දීර්ඝකාලීන ව ඒකාකාරී රටාවකට ක්‍රියාත්මක වූ ආයතනික ව්‍යුහයක් සාර්ථක වේ යැයි සිතමින් රජය තැබූ විශ්වාසය මේ වන විට බිඳ වැටී තිබෙනවා.

විෂය මාලා සංවර්ධන ක්‍රියාවලියේ ආන්දෝලනයට හා විවේචනයට ලක් වූ කරුණු සලකා බැලීමේදී ඒ බව පැහැදිලියි. ඔවුන්ගේ මේ නොසැලකිල්ල සහ මෙහි බරපතළකම පිළිබඳ ව නොතේරීම නිසා සිදු වුණේ ඔවුන් මත ජනතා විශ්වාසය බිඳ වැටීම. අධ්‍යාපන අමාත්‍යතුමිය නොවෙයි ප්‍රතිසංස්කරණවල



අන්තර්ගතය සකස් කරන්නේ. ජාතික අධ්‍යාපන ආයතනය තිබෙන්නේ එවැනි අත්‍යවශ්‍ය කාරණා සඳහා. අන්තර්ගතය නිර්මාණය කළේ දශක ගණනාවක් රාජ්‍ය සේවයේ නියුතු ගුරුවරු බව විශේෂයෙන් ප්‍රතිසංස්කරණ සඳහා පැමිණි විවේචකයන් නොදැන සිටි කාරණයක්. එම ගුරුවරු අමාත්‍යතුමිය විසින් පත් කළ පිරිසක් නොවෙයි.

මෙහිදී තමා විසින් සිදු කරන ලද කාර්යය සම්බන්ධයෙන් තිබිය යුතු වගවීම ප්‍රතිසංස්කරණ අන්තර්ගතය සැකසීමේ ක්‍රියාවලියේ තිබුණා ද? යන්න පිළිබඳ සැක මතුවන අවස්ථා තිබෙනවා. යතුරු ලියන දෝෂවල සිට විෂය මාලාවේ පෞද්ගලික වෙබ් අඩවි පිළිබඳ සඳහන් කිරීම, දරුවන්ගේ පෞද්ගලික දත්ත අන්තර්ජාලයට ඇතුළත් කිරීම වැනි ක්‍රියාවලි හඳුන්වා දීම සාර්ථක ක්‍රමවේදයක් නොවෙයි.

ඒ අනුව උද්ගත වී ඇති තත්ත්වය පිළිබඳ විසඳුම් සොයා ගැනීමේදී රජය වඩා දැනුවත් කතිකාවක් ගොඩනැගීම සඳහා පියවර ගත යුතුයි. ඒ සඳහා අවශ්‍ය පහසුකම් රජය සතු ව පවතිනවා. විශේෂයෙන් ඊට අවශ්‍ය වන පිරිස් බලය මෙහිදී ඉතා වැදගත්. මේ කාර්යයට දායක කර ගත හැකි සම්පත්දායකයන්, විශ්වවිද්‍යාල කථිකාචාර්ය ප්‍රජාවේ සිට ගුරු වෘත්තිය සමිති, අධ්‍යාපනවේදීන්, දෙමාපියන් සහ ගුරුවරුන්ගේ සහයෝගයෙන් සියලු පාර්ශ්ව ඒකරාශී කරගෙන වඩාත් පුළුල් කතිකාවක් මේ සම්බන්ධයෙන් ගොඩනඟා ගත යුතුයි. මෙහිදී රජයට කිසිවක් අහිමි වෙන්නේ නැහැ ජනතාව සමඟ සිට ගැනීමෙන්. ඒ, ජනතා ආණ්ඩුවක් යන ජනතා විශ්වාසය පවතින නිසා. ඒ නිසා ජනතාව විශ්වාස කරමින් මේ ප්‍රතිසංස්කරණ ඉදිරියට රැගෙන යා යුතුයි. ඔවුන් සමඟ ඔවුන්ට ඉදිරියෙනුත් තැබිය හැකි ලෝක දැක්මක් සම්බන්ධයෙන් සංකල්පනාත්මක වෙනසක් සහිත ව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ නිර්මාණය කර ගැනීම වටිනවා.

**නිරෝෂි දොඹගහගේ**

# අධ්‍යාපන විද්‍යාවෙන් විසඳුම්

රටක් වෙනස් කිරීම සඳහා සුදුසු ම සහ පහසු ම ක්‍රමය අධ්‍යාපනය බවයි ලෝකයේ පිළිගැනීම. ඒ බව පර්යේෂණවලිනුත් සනාථ කර තිබෙනවා. අධ්‍යාපන වියදම ආයෝජනයක්. අධ්‍යාපනය වෙනුවෙන් මේ මොහොතේදී ඩොලරයක් වියදම් කළහොත් තව අවුරුදු කිහිපයකින් එහි ප්‍රතිලාභය



ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
**චින්තක චන්ද්‍රකුමාර**
අධ්‍යාපන මනෝවිද්‍යා අධ්‍යයන අංශය,
අධ්‍යාපන පීඨය
කොළඹ විශ්වවිද්‍යාලය

සරල ව කිවහොත් කෘත්‍රිම බුද්ධියේ සංවර්ධනයත් සමඟ ඉදිරියේදී රැකියා ක්ෂේත්‍ර දහස් ගණනක් ලෝකයෙන් තුරන් වී යනවා. එවිට 2026 වර්ෂයේ පළමු වැනි ශ්‍රේණියට ඇතුළත් වන දරුවා 2030 වර්ෂය පමණ වන විට පුරවැසියෙකු විදිහට සමාජගත විය යුතුයි. ඒ වන විට ලෝකයේ පවතින තත්ත්වය පුරෝකථනය අපහසුයි. එලෙස පුරෝකථනය කළ නොහැකි සමාජයට උචිත පුරවැසියෙකු බිහි කිරීමයි අද දවසේ අධ්‍යාපනයේ මූලික අභිප්‍රාය වෙන්නේ.

ඩොලර් කිහිප ගුණයකින් වැඩි වී රටට ලැබෙනවා. ඒ නිසා අධ්‍යාපනය රටක දියුණුවට අත්‍යවශ්‍ය ම සාධකයක්.

අධ්‍යාපනය පිළිබඳ ලෝකයේ තිබෙන මතයක් නම් සෑම ප්‍රශ්නයකට තිබෙන එක ම විසඳුම අධ්‍යාපනය නොවුණත් ඕනෑ ම ප්‍රශ්නයකට තිබෙන ප්‍රධාන විසඳුමක් වන්නේ අධ්‍යාපනයයි යන කාරණය. උදාහරණයක් විදිහට ගත්තොත් දුප්පත්කම, මත්ද්‍රව්‍ය, දූෂණ, මංකොල්ලකෑම් යනාදී සෑම ගැටලුවකට ම එක ම විසඳුම අධ්‍යාපනය නොවුණත් අධ්‍යාපනයෙන් ඒ සියල්ලට ම ප්‍රබල විසඳුමක් ලබා දෙන්න පුළුවන්.

වර්තමාන ලෝකය ඉතා ශීඝ්‍රයෙන් වෙනස් වෙනවා. මේ වෙනස් වීමත් සමඟයි අප අධ්‍යාපනයේ මේ වෙනස අපේක්ෂා කරන්නේ. වර්තමාන පිළිගැනීම වන්නේ අධ්‍යාපනයෙන් බිහි කළ යුත්තේ පෙර අත්නොවිඳි තත්ත්ව සඳහා මුහුණ දිය හැකි පුරවැසියෙකු බව. සරල ව කිවහොත් කෘත්‍රිම බුද්ධියේ සංවර්ධනයත් සමඟ ඉදිරියේදී රැකියා ක්ෂේත්‍ර දහස් ගණනක් ලෝකයෙන් තුරන් වී යනවා. එවිට 2026 වර්ෂයේ පළමු වැනි ශ්‍රේණියට ඇතුළත් වන දරුවා 2030 වර්ෂය පමණ වන විට පුරවැසියෙකු විදිහට සමාජගත විය යුතුයි. ඒ වන විට ලෝකයේ පවතින තත්ත්වය පුරෝකථනය අපහසුයි. එලෙස පුරෝකථනය කළ නොහැකි සමාජයට උචිත පුරවැසියෙකු බිහි කිරීමයි අද දවසේ අධ්‍යාපනයේ මූලික අභිප්‍රාය වෙන්නේ.

මෙහිදී ක්ෂේත්‍ර දෙකක් ගැන අවධානය යොමු කළ යුතුයි. පුද්ගලයෙකු විදිහට දරුවන්ගේ පෞද්ගලික ජීවිතයට එදිනෙදා අවශ්‍ය නිපුණතා එක් ක්ෂේත්‍රයක්. නිපුණතා යනු දැනුම නෙවෙයි. තාක්ෂණයේ දියුණුවත් සමඟ දැනුම ඕනෑ ම මොහොතක ලබා ගත හැකියි. ඒ දැනුම උචිත පරිදි යොදා ගත හැකි පුරවැසියෙකුයි අවශ්‍ය වෙන්නේ. අනාගතයේදී අපට අවශ්‍ය වෙන්නේ

වෘත්තීය ජීවිතයට අවශ්‍ය නිපුණතා වගේ ම පෞද්ගලික ජීවිතයට අවශ්‍ය නිපුණතා සියල්ලෙන් සපිරි අයෙක්. මෙය කුරුල්ලෙකුගේ පියාපත් දෙකක් වැනියි. ඕනෑ ම පුද්ගලයෙකුට සාමාන්‍ය පෞද්ගලික ජීවිතයක් තිබෙනවා. සමාජ ජීවිතයක් තියෙනවා. සමාජ ජීවිතයේ රැකියාව, සමාජ සම්බන්ධකම් ආදී සියල්ලෙන් සමබර පෞරුෂයක් සහිත ව ජීවත් වීමටනම් දැනුමෙන් ඔබ්බට යන නිපුණතා අවශ්‍යයයි.

වර්තමාන අධ්‍යාපන ක්‍රමයේ ප්‍රධාන ගැටලු දෙකක් හඳුනාගත හැකියි. අධ්‍යයන පීඩනය (Academic stress) එක් ගැටලුවක්. මෙය දරුවන්ට පමණක් නොවෙයි ගුරුවරුන්ට හා දෙමාපියන්ටත් තිබෙනවා. මේ තත්ත්වය වහා ම වෙනස් කළ යුතුයි. ඒ නිසා අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අවශ්‍යයි. දෙවැනි ගැටලුව වන්නේ ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ බොහෝ දෙනාගේ අවධානය යොමු නොවන ඇගයීම් ක්‍රියාවලිය. නොගැළපෙන ඇගයුම් ක්‍රියාවලියකුයි මෙරට අධ්‍යාපන ක්‍රමයේ තිබෙන්නේ. උදාහරණයක් විදිහට ලෝකයේ පිළිගැනීම වන්නේ ප්‍රාථමික සිසුන් සඳහා අසුන්ගත ලිඛිත පරීක්ෂණ (paper and pencil tests) නොපැවැත්විය යුතුයි යන්න. එහෙත් ශ්‍රී ලංකාවේ 05 වැනි ශ්‍රේණියේ දරුවන්ට ශිෂ්‍යත්වය ලෙසින් ප්‍රමුඛ විභාගයක් පැවැත්වෙනවා. එවිට මේ තත්ත්වය සමාජ විද්‍යාත්මක ව මෙන් ම මනෝ විද්‍යාත්මක ව දරුවාට බලපානවා. ආර්ථික වශයෙන් සමස්ත පවුලට ම බලපානවා. දැනට ශ්‍රී ලංකාවේ තිබෙන්නේ ඉතා හොඳ ප්‍රාථමික විෂය මාලාවක්. එහෙත් ඒ හා සමපාත නොවන තරග විභාගයක් හඳුන්වා දී ඊට ප්‍රමුඛත්වයක් ලබාදීමෙන් සැබෑ ලෙස ප්‍රාථමික විෂය මාලාව සාර්ථක ව ක්‍රියාත්මක වන්නේ නැහැ. මේ හේතු නිසා අනිවාර්යෙන් ම ශ්‍රී ලංකාවට අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අවශ්‍යයි.

මගේ පෞද්ගලික විශ්වාසය නම් ශ්‍රී ලංකාව වැනි රටක ආණ්ඩුවක් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ඇති කරන්න ගන්නා තීරණය සියදිවි හානි කරගන්න කරන උත්සාහයක් හා සමානයි. අප කුමක් කිව්වත් කොයිතරම් නිවැරදි ව ගුණාත්මක ව සිදු කළත් ඕනෑ තරම් විවේචන ඒ සඳහා පවතින්නට පුළුවන්. ඒ අනුව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සිදු කිරීම පෞද්ගලික ව රජයකට ඉතා ම අවාසිසහගත වූවක්. මෙය දිනක ක්‍රියාවලියක් නොවෙයි. 2019 වසරේ සිට පැවති සියලු ආණ්ඩු මේ ප්‍රතිසංස්කරණ ඉදිරියට රැගෙනවිත් තිබෙනවා.

අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සම්බන්ධ ව ඇතිවූ ගැටලුසහගත තත්ත්වයට ප්‍රධාන ම හේතුව ලෙස මා දකින්නේ අධ්‍යාපන විද්‍යාව අනුව ක්‍රියා නොකිරීම. අධ්‍යාපන විද්‍යාව අනුව යම් අධ්‍යාපන ප්‍රතිසංස්කරණයක් කළ යුත්තේ කෙසේ ද? යන්න පියවරෙන් පියවර පැහැදිලි ව දැකගත හැකියි. මේ ප්‍රතිසංස්කරණ සිදු කරන්නේ ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්. එහෙත් ඔවුන් සර්වඥ නැහැ. වැරදි වෙන්න පුළුවන්. නැවත සුපරීක්ෂාකාරී ව විමර්ශනයට ලක් කිරීමේ ක්‍රියාවලියක් සිදු වීම ඉතා වැදගත්.

අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සම්බන්ධ ව ඇතිවූ ගැටලුසහගත තත්ත්වයට ප්‍රධාන ම හේතුව ලෙස මා දකින්නේ අධ්‍යාපන විද්‍යාව අනුව ක්‍රියා නොකිරීම. අධ්‍යාපන විද්‍යාව අනුව යම් අධ්‍යාපන ප්‍රතිසංස්කරණයක් කළ යුත්තේ කෙසේ ද? යන්න පියවරෙන් පියවර පැහැදිලි ව දැකගත හැකියි. මේ ප්‍රතිසංස්කරණ සිදු කරන්නේ ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්. එහෙත් ඔවුන් සර්වඥ නැහැ. වැරදි වෙන්න පුළුවන්. නැවත සුපරීක්ෂාකාරී ව විමර්ශනයට ලක් කිරීමේ ක්‍රියාවලියක් සිදු වීම ඉතා වැදගත්.

මේ ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියේ විෂය මාලා සංවර්ධනය හා ගුරු පුහුණුව යනාදී කුලුනු යම් සාධනීය මට්ටමකට ගොඩනංවාගෙන තිබෙනවා. එහෙත් මේ ක්‍රියාවලියට ඇතුළත් සෙසු කුලුනු සම්බන්ධයෙන් සෑහීමකට පත් විය නොහැකියි. රටේ ජනතාව දැනුවත් කිරීම ආරම්භ කර තිබෙන්නේ දැන්. කුලුනු 05ම එකිනෙක සමාන්තර ව මතු විය යුතුයි පියවරෙන් පියවර. මේ අසමබර බව සම්බන්ධ ගැටලු හඳුනාගෙන ඉදිරියට ගමන් කිරීමයි දැන් කළ යුතු වන්නේ.

පවතින අධ්‍යාපන ක්‍රමයේ දැඩි පීඩනයක් දරුවන්ට දැනෙන්නේ ලිඛිත පරීක්ෂණ මත විශ්වාසය තැබීම නිසා. එයින් මැන බලන්නේ අධ්‍යාපන විද්‍යාවේ දක්වන පහළ ප්‍රජානන කුසලතා පමණයි. දැනුම සහ අවබෝධයයි වැඩි වශයෙන් මනින්නේ. භාවිතය යන්න මනින්නෙත් ඉතා අඩුවෙන්. මේ නිසා දරුවන් කටපාඩම් කරගෙන කෙටිකාලීන මතකයෙන් විභාගවලට පෙනී සිටිනවා. ඒ අනුව ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමයේ විෂය අරමුණු සහ ඇගයුම් ක්‍රියාවලිය ගැළපෙන්නෙ නැහැ. උදාහරණයක් වශයෙන් භාෂා විෂයවල තිබිය යුතු චතුර්විධ භාෂා කුසලතා ඇගයීමට අපට ක්‍රමවේදයක් නැහැ. මේ නිසා ගුරුවරුන් ඒ සම්බන්ධ කුසලතා දරුවන් තුළ වර්ධනය කරන්නේ නැහැ.

නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල මොඩියුල ඔස්සේ සාම්ප්‍රදායික තක්සේරුකරණ ක්‍රියාවලිය සංශෝධනයට ලක් ව තිබීම සාධනීය කරුණක්. මෙහි 'සම්භවන තක්සේරුව' එනම් 'ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ සිදුවන තක්සේරුවක්' තිබෙනවා. මෙහිදී වන්නේ විවිධ ඇගයීම් ක්‍රමවලින් ගුරුවරයා තක්සේරුකරුවෙකු වෙමින් කාර්යසාධන මත පදනම්

වූ තක්සේරුවක් සිදු කිරීම. එයින් ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඔස්සේ මැන බැලීම් සිදු වන නිසා දරුවන්ගේ නිපුණතා වර්ධනය වෙනවා.

ඉදිරි වසර තුළ මේ සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට පූර්ණ බලතල සහිත කමිටුවක් පත් විය යුතුයි. මේ ආයතන අතර සම්බන්ධීකරණය ප්‍රමාණවත් නැහැ. විශේෂයෙන් අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය, විභාග දෙපාර්තමේන්තුව සහ ජාතික අධ්‍යාපන ආයතනය ස්වාධීන වෙන්න උත්සාහ කළත් මේ සියලු දෙනා මෙහෙයවීමට හැකි බලයක් සහිත කමිටුවක් පත් කර ගැනීම ඉතා වැදගත්. එය සමහරවිට අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්වරයාගේ යටතේ ක්‍රියාත්මක වන කමිටුවක් වෙන්න පුළුවන්. එම කමිටුවේ පරිපාලන මෙන් ම සෘජු ව අධ්‍යාපන ක්ෂේත්‍රයට සම්බන්ධ අධ්‍යාපනඥයන් නියෝජනය විය යුතුයි. අවම වශයෙන් මෙරට අධ්‍යාපන පීඨවල පීඨාධිපතිවරුන් නිල බලයෙන්

ඉදිරි වසර තුළ මේ සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට පූර්ණ බලතල සහිත කමිටුවක් පත් විය යුතුයි. මේ ආයතන අතර සම්බන්ධීකරණය ප්‍රමාණවත් නැහැ. විශේෂයෙන් අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය, විභාග දෙපාර්තමේන්තුව සහ ජාතික අධ්‍යාපන ආයතනය ස්වාධීන වෙන්න උත්සාහ කළත් මේ සියලු දෙනා මෙහෙයවීමට හැකි බලයක් සහිත කමිටුවක් පත් කර ගැනීම ඉතා වැදගත්. එය සමහරවිට අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්වරයාගේ යටතේ ක්‍රියාත්මක වන කමිටුවක් වෙන්න පුළුවන්.



මේ කමිටුවට පත් විය යුතුයි. 2019 වර්ෂයේ සිට අද දක්වා පත් වූ කමිටුවල අධ්‍යාපනඥයන්ගේ නියෝජනය ඉතා අඩුයි.

අනෙක් ප්‍රධාන කාරණය වන්නේ මූල්‍ය ප්‍රතිපාදනය. මෑත ඉතිහාසයේ ප්‍රතිසංස්කරණවලට අදාළ ඉහළ මට්ටමේ පුහුණුවීම්වලට සෑහෙන මුදල් වියදම් කරනවා. එහෙත් ගුරුවරයාගේ සිට වියදම් කපා හැරීමට පටන් ගන්නවා. ඉතා විශිෂ්ට අධ්‍යාපන ක්‍රමයක් වුවත් ක්‍රියාත්මක වන්නේ ගුරුවරයා මත. 'රටක අධ්‍යාපනයේ ගුණාත්මකභාවය එරට ගුරුවරයාගෙන් ඔබ්බට නොයයි' යන්න මතක තබාගෙන මෙහිදී ක්‍රියාත්මක විය යුතුයි. වැටුප් වැඩි වූ පමණින් ගුරුවරයාගේ ගුණාත්මකභාවය ඉහළ යන්නෙ නැහැ. ඔවුන් පුහුණු කිරීමට අඛණ්ඩ, විධිමත් වෘත්තීය සංවර්ධනයක් සිදු විය යුතුයි. ඒ අනුව ගුරු පුහුණුව සඳහා මෙන් ම පාසල්වල භෞතික සම්පත් සංවර්ධනයට ප්‍රමාණවත් පරිදි ප්‍රතිපාදන වෙන් විය යුතුයි. ක්‍රියාත්මක තලයේදීයි අඩුපාඩු පවතින්නේ. ඒවා නිවැරදි ව කළමනාකරණය කර ගතහොත් මේ වැඩපිළිවෙළ සාර්ථක කර ගන්න පුළුවන්.

පළමු වැනි ශ්‍රේණියේ මොඩියුල ක්‍රියාත්මක කරන අතරතුර පළමු වැනි පාසල් වාරයෙන් පසු සියලු පාර්ශ්වවල අදහස් ලබාගෙන අධ්‍යාපන ක්ෂේත්‍රයට සම්බන්ධ ස්වාධීන ආයතනයකින් එම මොඩියුල ක්‍රියාත්මක කිරීම සම්බන්ධ ව අධ්‍යයනයක් කළ යුතුයි. වාර තුනට ම අදාළ ව එලෙස නිර්දේශ ලබාගෙන, ක්‍රියාත්මක කිරීමේදී ඇති වන අඩුපාඩු පියවරෙන් පියවර හඳුනාගෙන 2027 වර්ෂයේදී ඒවා අවම කරගැනීමට ක්‍රියා කළ හැකියි. මේ ආකාරයට වසර ගණනාවක් කියාත්මක වීමෙන් නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පාදක ව සාර්ථක අධ්‍යාපන ක්‍රමයක් නිර්මාණය කර ගැනීමට අපට හැකිවනු ඇති.

**නිරෝෂි දොඹගහගේ**

# විප්ලවයට




1959 ජනවාරි මස 01 දින සිදුවූ කියුබානු විප්ලවයට වසර 67ක් සපිරෙනවා. මේ ලිපිය පළ වන්නේ ඒ නිමිත්තෙන්.

**ඩබ්ලිව්. එම්. ශාන්තප්‍රිය**

බටහිර ඉන්දීය කොදෙව් දූපත් සමූහයේ විශාලතම දූපත වන කියුබාවට කුඩා දූපත් 4,195ක් පමණ අයත්. මෙහි අසල්වාසී රටවල් වන්නේ එක්සත් ජනපදය (ෆ්ලොරිඩා ප්‍රාන්තය), බහමාස්, ජැමෙයිකාව, හයිටි හා මෙක්සිකෝව යන රටවල්. කියුබාවේ විශාලත්වය වර්ග කිලෝමීටර් 110,860ක් වන අතර ජනගහනය මිලියන 10ක් පමණ වෙනවා.

ස්පාඤ්ඤ යටත් විජිතයක් ව පැවති කියුබාව (1492 සිට 1898 දක්වා) ඇමරිකන්-ස්පාඤ්ඤ යුද්ධයෙන් පසු 1898 වසරේ සිට ඇමරිකන් බලපෑමට යටත් ව තිබූ රටක්. 1902 වසරේදී කියුබාවට නාමික නිදහසක් ප්‍රදානය කෙරුණ ද දිගට ම ඇමරිකානු ආධිපත්‍යයට ඔවුන් යටත් ව තිබුණා. ඒ නිසා ම බලයට පැමිණි පාලකයන් ඇමරිකානු රූකඩ පාලකයන් වූ අතර ඉන් කැපී පෙනෙන පාලකයෙකු වූයේ ෆුල්ජෙන්සියෝ බැටිස්ටා. හමුදා නිලධාරියෙකු වූ බැටිස්ටා 1933 වසරේදී එවකට සිටි ජනාධිපති ජෙරාර්ඩෝ මචාඩෝ බලයෙන් පහ කිරීමට දායක වූ සැරයන්වරුන්ගේ කුමන්ත්‍රණයකට නායකත්වය දුන්නා. 1940 වසරේදී ජනාධිපති ධුරයට තරග වැදී ජයගෙන ඔහු ජනාධිපති ධුරය ඉසිළුවේ 1944 වසර දක්වා. 1940 ජනාධිපතිවරණයේදී ඔහුට ප්‍රතිසංස්කරණවාදී කියුබන් කොමියුනිස්ට් පක්ෂයේ සහාය හිමිවන අතර කොමියුනිස්ට් පක්ෂයේ දෙදෙනෙකුට ඔහුගේ ඇමති මණ්ඩලයේ ඇමතිකම් ද හිමි වුණා. මේ කාලයේ ඇමරිකා එක්සත් ජනපදය බැටිස්ටා සමඟ සිටියේ අමනාපයෙන්. මේ නිසා ඔහුගේ ධුර කාලය අවසන් වීමෙන් පසු ඇමරිකා එක්සත් ජනපදයේ ෆ්ලොරිඩා ප්‍රාන්තයට ගොස් එහි ජීවත් වුණා. 1952 වසරේ මැයි ජනාධිපතිවරණයට ඉදිරිපත් වීමට නැවත බැටිස්ටා කියුබාවට පැමිණෙන්නේ එක්සත් ජනපද පාලනය සමඟ එකඟත්වයක් ඇති ව. එහෙත් මැයි මාසයේ ජනාධිපතිවරණය පැවැත්වීමට තිබියදී 1952 මාර්තු මාසයේදී ඇමරිකා එක්සත් ජනපදයේ මූල්‍ය හා මිලිටරි සහාය ඇති ව කුමන්ත්‍රණයකින් ඔහු බලය අත්පත් කර ගත්තා. ඒ, ජනාධිපතිවරණයේදී නියත පරාජයකට මුහුණදෙන බව ප්‍රත්‍යක්ෂ වූ නිසා. බලය අත්පත්කරගත් වහා ම බැටිස්ටා 1940 ව්‍යවස්ථාව අත්සිටුවා කලින් ඔහුට සහාය දුන් කියුබානු කොමියුනිස්ට් පක්ෂය ද තහනම් කළා. වැඩ වර්ජනය කිරීමේ නිදහස ඇතුළු බොහෝ දේශපාලන අයිතිවාසිකම් අවලංගු කර සීනි වතු හිමි ධනවත් වතු හිමියන් සමඟ එක් වී ඔහු පවත්වාගෙන ගියේ ඉතා පීඩාකාරී පාලනයක්.

## බැටිස්ටා පාලනයට එරෙහි අරගලය

බැටිස්ටාගේ නීතිවිරෝධී අත්තනෝමතික පාලනයට එරෙහි ව පුළුල් විරෝධයක් එල්ල වන්නට වූ අතර මේ විරෝධයට නායකත්වය දුන්නේ තරුණ නීතිඥයෙකු වූ පිදෙල් කස්ත්‍රෝ. ඔහු නීතියෙන් බැටිස්ටාගේ පාලනයට එරෙහි ව ක්‍රියා කරන්නට උත්සාහ දැරුවත් එය සම්පූර්ණයෙන් ම අසාර්ථක වනවා. ඉන්පසු ඔහුගේ නායකත්වයෙන් යුත් තරුණ කණ්ඩායමක් යොමු වූයේ සන්නද්ධ ආකාරය මුල්කරගත් ජන නැගිටීමකින් බැටිස්ටා පාලනය පෙරළා දැමීමේ මාවතකට. පිදෙල් 1,200ක පමණ තරුණ පිරිසක් සංවිධානය කරන අතර ඉන් කණ්ඩායමක් සන්නද්ධ ව සූදානම් කළා. මේ කණ්ඩායමේ අරමුණ වූයේ ප්‍රධාන හමුදා කඳවුරක් හෝ දෙකක් හෝ අත්පත් කරගෙන ජන නැගිටීමක් සමඟ සන්නද්ධ ආකාරයෙන් බලය අල්ලා ගැනීම.

මේ සැලස්මට අනුව පිදෙල්ගේ නායකත්වයෙන් වූ ප්‍රධාන කණ්ඩායම 1953 ජූලි 26 දින කියුබාවේ දෙවැනි විශාලතම හමුදා කඳවුර වූ ඔරියන්ටේ පළාතේ සන්තියාගෝ ඩි කියුබා නගරයෙහි පිහිටි මොන්කාඩා බැරක්කයට පහර දෙන අතර රාවුල් මාටිනෙස් අරාරාස්ගේ නායකත්වයෙන් යුත් කණ්ඩායමක් බයාමෝ නගරයෙහි පිහිටි කාර්ලෝස් එම් ඩි සෙස්පීඩස් බැරක්කයට පහර දෙනවා. මේ ප්‍රහාරයට සම්බන්ධ වූ පිරිස 136ක්. හයිඩී ශාන්තමරියා සහ මෙල්බා හර්නන්ඩෙස් යන තරුණියන් දෙදෙනා ද මීට අයත් වුණා. බැරක්කවලට පහර දුන්නේ ජූලි 26 දින පාන්දර 05ට පමණ වුවත් මේ ප්‍රහාර සාර්ථක වුණේ නැහැ. කඳවුරු දෙකට එල්ල කළ මේ ප්‍රහාරයෙන් හමුදා සෙබළුන් 16 දෙනෙක් හා පොලිස් භටයෙක් මරණයට පත් වුණා. 28 දෙනෙකු තුවාල ලැබුවා. කස්ත්‍රෝට අනුව සටන්කරුවන් 05 දෙනෙක් මොන්කාඩා ප්‍රහාරයේදී මැරුම් කෑ අතර පසුව අල්ලා ගන්නා ලද සටන්කරුවන් 108 දෙනෙකු මරා දමන්නේ දස වද දීමෙන්. කස්ත්‍රෝ ඇතුළු 18 දෙනෙක් හසු නොවී බේරී පලා යාමට සමත් වුවත් පසුව අත්අඩංගුවට ගෙන නඩු අසා සිරගත කෙරුණා. "ඉතිහාසය මාව නිර්දෝෂී කරනු ඇත" යනුවෙන් පිදෙල් ඉදිරිපත් කළ සුප්‍රකට දේශනය සිදුකරන්නේ මේ නඩු විභාගයේදී.

පිදෙල්ලා වරදකරුවන් කර සිරගත කළත් රටෙනුත් ජාත්‍යන්තර වශයෙනුත් එල්ල වූ බලපෑම් නිසා බැටිස්ටා පාලනයට 1955 මැයි 15 දින පිදෙල් කස්ත්‍රෝ ඇතුළු සටන්කරුවන් 18 දෙනා පොදු සමාවක් යටතේ නිදහස් කිරීමට සිදු වුණා. නිදහස ලැබූ පිදෙල් නව විප්ලවවාදී ව්‍යාපාරයක් වූ ජූලි 26 ව්‍යාපාරය සංවිධානය කිරීමට මුල පිරුවා. පිදෙල්ලාට වැඩ කිරීමට සිදු ව තිබුණේ දැඩි මර්දනකාරී තත්ත්වයක නිසා පිදෙල් ඇතුළු පිරිස තීන්දු කළේ වෙනත් රටකට ගොස් කණ්ඩායමක් සංවිධානය කරගෙන කියුබාවට පැමිණ අරගලය දියත් කිරීමට. ඒ අනුව පිදෙල් ඇතුළු කණ්ඩායමක් මෙක්සිකෝවට ගොස් පිටුවහල් ව විදෙස්ගත ව සිටි කියුබානුවන් එක්කරගෙන රහසිගත ව කණ්ඩායමක් සංවිධානය කර ගැනීමට පියවර ගත්තා. කැස්ත්‍රෝලාට චේ ගුවේරා හා කියුබානු පිටුවහලෙකු ව සිටි කැමිලෝ සියන්ෆියුගෝස් හමු වන්නේ මෙක්සිකෝවේදී. කණ්ඩායමක් පුහුණු කරගෙන කියුබාවට ගොස් බැටිස්ටා

> නව විප්ලවීය ආණ්ඩුව විසින් බැටිස්ටා තහනම් කර තිබූ කොමියුනිස්ට් පක්ෂය නීතිගත කරනු ලැබූ අතර විප්ලවීය ප්‍රජාතන්ත්‍රීය ප්‍රතිසංස්කරණ රාශියක් ක්‍රියාවට නැගුවා. ඒවා අතර ගොවිජන ප්‍රතිසංස්කරණ නීතිය ප්‍රකාශයට පත් කිරීම හා ඉඩම් ප්‍රතිසංස්කරණ මාලාවක් ක්‍රියාවට නැගීම, එක්සත් ජනපද ඉඩම් හිමියන් ප්‍රමුඛ විදේශිකයන්ගේ ඉඩම් අත්පත් කර ගැනීම, කර්මාන්ත ජනසතු කිරීම ආදිය වනවා.



පාලනය පෙරළා දැමීමේ අරගලය බළමුළු ගැන්වීමයි පිදෙල්ලාගේ අරමුණ වූයේ. මෙසේ සංවිධානය වෙමින් සිටින අතරතුර ඒ ගැන මෙක්සිකානු ආණ්ඩුවට ඉව වැටී තිබුණු බව දැනගත් පිදෙල්ලා සිය කණ්ඩායම සමඟ කියුබාවට යන්න තීරණය කරනවා. ගමන සඳහා මිල දී ගන්නා ලද ග්‍රෑන්මා නම් වූ යාත්‍රාවෙන් 1956 නොවැම්බර් 25 දින ඔවුන් කියුබාව බලා පිටත් වන්නේ 20 දෙනෙකුට පමණ යා හැකි ව තිබූ යාත්‍රාවකින් සටන්කරුවන් 82ක් සමගින්. දෙසැම්බර් 02 දින ඔවුන්ට ගොඩ බැසීමට සිදු වුණේ ඔවුන් අපේක්ෂා කළ ස්ථානයට නොව විශාල හමුදා කණ්ඩායමක් සැඟව සිටි ස්ථානයකට. මෙහිදී හමුදාවෙන් එල්ල වූ ප්‍රහාරයෙන් බේරී අපේක්ෂිත සියරා මයෙස්ත්‍රා කඳුකරය කරා යා හැකි වූයේ පිදෙල් කස්ත්‍රෝ, චේ ගුවේරා, රාවුල් කැස්ත්‍රෝ හා කැමිලෝ සියන්ෆියුගෝස් ඇතුළු 20 දෙනෙකුට පමණයි.

සියෙරා මයෙස්ත්‍රා කඳුකරය ආශ්‍රිත ප්‍රදේශයේ වූයේ අරගලකාරී ජනතාවක්. එම ප්‍රදේශය විප්ලවකාරී සටන්කරුවන්ට වැඩ කිරීම සඳහා තෝතැන්නක් වුණා. පිදෙල්ගේ නායකත්වයෙන් යුත් ජූලි 26 ව්‍යාපාරය සියෙරා මයෙස්ත්‍රාවල සිට නව ක්‍රියාකාරීන් බඳවා ගනිමින් ගරිල්ලා බළ ඇණි සංවිධානය කළ අතර නගරවල ද යටිබිම්ගත ගරිල්ලා කණ්ඩායම් හා ජන සංවිධාන ගොඩ නැගීමට නායකත්වය දුන්නා. ජූලි 26 ව්‍යාපාරයේ මෙහෙයවීමෙන් ගරිල්ලා ප්‍රහාර ද නාගරික වැඩවර්ජන හා විරෝධයපෑම් ද සංවිධානය කෙරුණු අතර බැටිස්ටා විරෝධී ව්‍යාපාරය රට මුළුල්ලේ ම වැඩී ගියා. මේ අරගල ක්‍රියාකාරිත්වය තුළ 1958 දෙසැම්බර් 31 දින රට මැද පිහිටි උපායමාර්ගික ස්ථානයක් වූ සැන්ටා ක්ලාරා නගරය පිදෙල් ක්‍රස්ත්‍රෝ ප්‍රමුඛ විප්ලවවාදීන් අතට පත් වීමත් සමඟ ම බැටිස්ටා ජෙනරල් ඉයුජින් කැන්ටිලෝට බලය පවරා දෙමින් 1959 ජනවාරි 01 දින පාන්දර 02ට පමණ ඔහුගේ පවුලේ අයත් සමඟ ඩොමිනිකන් ජනරජයට පලා යනවා. පිදෙල් ක්‍රස්ත්‍රෝ ප්‍රමුඛ ජූලි 26 ව්‍යාපාරයේ නායකයන් 1959 ජනවාරි 08 දින අගනුවරට ඇතුළු වූ අතර ජනතාව ඔවුන් ව පිළිගත්තේ

උණුසුම් ව. සංක්‍රමණීය පියවරක් ලෙස ලිබරල්වාදී මැනුවෙල් උරුෂියා සියායෝ (MANNUAL URRUTiA ZiEO) තාවකාලික ජනාධිපති ලෙස පත් කළා.

නව විප්ලවීය ආණ්ඩුව විසින් බැටිස්ටා තහනම් කර තිබූ කොමියුනිස්ට් පක්ෂය නීතිගත කරනු ලැබූ අතර විප්ලවීය ප්‍රජාතන්ත්‍රීය ප්‍රතිසංස්කරණ රාශියක් ක්‍රියාවට නැගුවා. ඒවා අතර ගොවිජන ප්‍රතිසංස්කරණ නීතිය ප්‍රකාශයට පත් කිරීම හා ඉඩම් ප්‍රතිසංස්කරණ මාලාවක් ක්‍රියාවට නැගීම, එක්සත් ජනපද ඉඩම් හිමියන් ප්‍රමුඛ විදේශිකයන්ගේ ඉඩම් අත්පත් කර ගැනීම, කර්මාන්ත ජනසතු කිරීම ආදිය වනවා. කියුබානු විප්ලවයට පෙර ඇමරිකා එක්සත් ජනපදය හා අනෙකුත් විදේශීය ආයෝජකයන් කියුබානු ආර්ථිකයේ ආධිපත්‍යය දැරූ අතර ඔවුන් වගා කළ හැකි ඉඩම්වලින් 75%ක්, අත්‍යවශ්‍ය සේවාවලින් 90%ක් සහ සීනි නිෂ්පාදනයෙන් 40%ක් පාලනය කළා.

මේ ක්‍රියාමාර්ග නිසා ඇමරිකා එක්සත් ජනපද සබඳතා පළුදු වුණා. එක්සත් ජනපදය මුලදී කියුබානු විප්ලවයට හිතකර ප්‍රතිචාරයක් දැක් වූ අතර එය ලතින් ඇමරිකාවට ප්‍රජාතන්ත්‍රවාදය ගෙනඒමේ ව්‍යාපාරයක් ලෙස දුටුවා. එහෙත් පසුව කස්ත්‍රෝට බලයට ඒමට ඉඩ දීම තමන් කර ගත් බරපතළ වැරද්දක් බවයි එක්සත් ජනපදයේ පිළිගැනීම වුණේ. පිදෙල් පාලනය පෙරළා දැමීමට එක්සත් ජනපදය නොයෙකුත් කුමන්ත්‍රණ දියත් කළ අතර විප්ලවය නිසා ෆ්ලොරිඩාවට පලා ගොස් සිටි කියුබානු ප්‍රතිගාමීන් කියුබානු ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවීය පෙරමුණ නමින් සංවිධානය කර 1961 අප්‍රේල්වල ආක්‍රමණයක් ද දියත් කළ'මුත් මෙය සම්පූර්ණයෙන් ම පරාජයට පත් කෙරුණා.

කියුබාව ලෝකයේ සැලසුම්ගත ආර්ථිකයක් පවතින රටක්. සංචාරක ව්‍යාපාරය, පුහුණු ශ්‍රමය, සීනි, දුම්කොළ සහ කෝපි අපනයනය මත කියුබාවේ ආර්ථිකය රඳා පවතිනවා. ඉහළ සාක්ෂරතාව, අඩු ළදරු මරණ අනුපාතය, ඉහළ ආයු අපේක්ෂාව වැනි සමාජ දර්ශක කලාපයේ සෙසු රටවලට වඩා ඉහළ තත්ත්වයක පවතිනවා. නිවසට ම පැමිණ සියලු පුරවැසියන්ට ප්‍රතිකාර කරන නිදහස් සෞඛ්‍ය සේවාවක් පවතින රටක් කියුබාව. නොමිලේ අධ්‍යාපන සේවයක් පවතිනවා සේ ම world wide fund for nature (WWF) අනුව තිරසර සංවර්ධන ප්‍රතිපත්ති සපුරාලන ලෝකයේ එක ම රට කියුබාව. මේ සියල්ල සිදු වූයේ 1960 සිට එක්සත් ජනපදය පැන වූ බරපතළ විස්තීරණ සම්බාධක රාශියක් මැද්දේ.

කියුබානු විප්ලවයේ පුරෝගාමියා වූ පිදෙල් කස්ත්‍රෝ වසර 49ක් රට පාලනය කර 2008 වසරේදී විශ්‍රාම යන අතර ඉන්පසු ඔහුගේ සොයුරු රාවුල් කස්ත්‍රෝ රාජ්‍ය නායකත්වයට පත්වෙනවා. ඔහු 2018 වසර දක්වා රාජ්‍ය බලය උසුළන අතර ඉන්පසුව රාජ්‍ය නායකත්වයට පත් වන්නේ මිගෙල් ඩයස් කැනෙල්.




මහජන විප්ලවයක ප්‍රධාන කරුණු අතර සුවිශේෂ කරුණක් ලෙස මහජනයා සවිඥානික හා සංවිධිත බලයක් බවට පත්කිරීම ඉතා වැදගත්. කෙතරම් අභියෝග පැමිණියත් ඒවාට මුහුණදෙමින් අල්ලාගෙන සිටීමට සවිඥානික මහජන බලය විප්ලවීය ව්‍යාපාරයකට ඉතා වැදගත්. එහෙත් අතිබලගතු සතුරු වටලෑමක් හා විය හැකි ප්‍රහාරාත්මක මැදිහත්වීමකදී එහි පැවැත්ම කාලය පිළිබඳ ප්‍රශ්නයක්.

ඇමරිකානු සම්බාධක නිසා අද කියුබාව පවතින්නේ ආර්ථික වශයෙන් ඉතා දුෂ්කර තත්ත්වයක. මෙය කියුබානු කොමියුනිස්ට් පාලනයේ වරද නිසා ඇති වූ බවට ප්‍රචාරය කරන්නේ අධිරාජ්‍යවාදීන් ඇතුළු ධනේශ්වරයන් පමණක් නොව සමාජවාදීන් යැයි කියන ඇතැමුන් ද. ඇමරිකානු සම්බාධක ඇතුළු විවිධ කුමන්ත්‍රණකාරී ක්‍රියාකාරිත්ව නොවන්නට කියුබාව ලොව ආදර්ශමත් රටක් වීම වැළැක්විය නොහැකි බව පැවසිය යුතුයි. පිදෙල් කස්ත්‍රෝ බලයට පැමිණි දා සිට බලයෙන් යන තෙක් ම ඔහු ඝාතනය කිරීමට 638 වාරයක් උත්සාහ කිරීමෙන් ම එරටට බටහිර අධිරාජ්‍යවාදී කඳවුරෙන් එල්ල වූ අභියෝගය තේරුම් ගන්නට පුළුවන්. කියුබාවට දැන් ට්‍රම්ප් පාලනය යටතේ ඇමරිකාවෙන් එල්ල වී ඇති තර්ජනය හමුවේ කියුබානු රජය බිඳ දැමෙන්නට පුළුවන්. එහෙත් එය කියුබානු පාලනයේ ප්‍රශ්නයක් නොව ජාත්‍යන්තර ප්‍රතිගාමිත්වයේ මැදිහත් වීම පිළිබඳ ප්‍රශ්නයක්. ඒ නිසා ආර්ථික ප්‍රහාර, කුමන්ත්‍රණකාරී මැදිහත්වීම් ඇතුළු මහත් දුෂ්කරතා හා බාධක මධ්‍යයේ තවමත් කියුබානු රාජ්‍යය පවතින්නේ ජනතාවගෙන් සවිඥානික අතිබහුතරය ආණ්ඩුව සමග සිටින නිසා. මහජන විප්ලවයක ප්‍රධාන කරුණු අතර සුවිශේෂ කරුණක් ලෙස මහජනයා සවිඥානික හා සංවිධිත බලයක් බවට පත්කිරීම ඉතා වැදගත්. කෙතරම් අභියෝග පැමිණියත් ඒවාට මුහුණදෙමින් අල්ලාගෙන සිටීමට සවිඥානික මහජන බලය විප්ලවීය ව්‍යාපාරයකට ඉතා වැදගත්. එහෙත් අතිබලගතු සතුරු වටලෑමක් හා විය හැකි ප්‍රහාරාත්මක මැදිහත්වීමකදී එහි පැවැත්ම කාලය පිළිබඳ ප්‍රශ්නයක්.



# මලකි දුවේ නුඹ

**තුසිත ජයසුන්දර**

අදින් වසර කිහිපයකට පෙරාතුව කල්පන හා වින්දන ආරියවංශ දෙසොහොයුරන් සිනමාකරණයට එක්වන්නේ සුලබ චරිත සමඟ දුලබ සිදුවීම් මැනවින් මුසු කර ගත් අනුවේදනීය සිනමාපටයකින්. මේ නොපැසුණු ලකුණු අවම කරගත් 'ප්‍රේමය නම්' සිනමාපටයයි. අනතුරු ව ඔවුන් විසින් නිමවන ලද 'රූකඩ පැංචි' සිනමාපටය පිළිබඳ මතකය මෙහිලා ආවර්ජනය නොකෙරෙන්නේ සහේතුක ව. මන්ද ඔවුන්ගේ අභිනව සිනමා මෙහෙයුම වන 'මලකි දුවේ නුඹ' විනිවිද දකිනු පිණිස වඩාත් ම මහෝපකාරී වන්නේ 'ප්‍රේමය නම්' නිසා. මෙහෙයින් ම 'මලකි දුවේ නුඹ' හඳුනා ගන්නා පළමු වටයේදී ම  පසක්කොට ගත හැකි වන්නේ එය 'ප්‍රේමය නම්' බට මඟ අතරතුරදී හමුවූ සිනමාපටයක් ලෙසින්. 'මලකි දුවේ නුඹ' සිනමාපටය 'ප්‍රේමය නම්'හි නිමවුම් ගුණ ඉක්මවා ගියේදැයි යන පැනය මේ මොහොතේදී නැඟීම සුදුසු නැහැ. මන්ද මේ කල්පන - වින්දන දෙසොහොයුරන්ගේ මුල් සමයේ සිනමා මෙහෙයුමක් වන නිසා. මේ අනුව මෙසමයේදී දත හැක්කේ කල්පන හා වින්දන දෙසොහොහුරන් 'ප්‍රේමය නම්' හා 'මලකි  දුවේ නුඹ' මාදිලියේ සිනමාපට නිමැවුමට උත්සුක වන බව.

'ප්‍රේමය නම්'හිදී මෙන් නොව 'මලකි දුවේ නුඹ'හිදී කල්පන හා වින්දන දෙසොහොයුරන් තත්කාලීන නාගරික මැද පන්තික දිවියේ සුලබ ලකුණු සමඟ විවෘත ගනුදෙනුවකට එළඹීමකටයි වෑයම් කරන්නේ. එහෙත් 'ප්‍රේමය නම්'හිදී මෙන් ම ඒ ඒ චරිත දෙස දයාබර ව නෙත් හෙළන්නටත් චරිත ඇතුළාන්තයේ පවත්නා හැඟුම්බර ඇවතුම් පැවතුම් හසු කර ගන්නටත් ඔවුන් උත්සුක වෙනවා. 'ප්‍රේමය නම්' එක අතකින් යම් මනෝ ව්‍යාධියක  හැඩ රුව පිළිබඳ කරුණු දැක්වූ සිනමාපටයක්. එහෙයින් සිදුවන අත්වැරදීම් හා මඟහැරීම් සමඟ ම ගොඩ නැංවූ සිනමාපටයක්. 'මලකි දුවේ නුඹ'හිදී නම් කල්පන - වින්දන දෙසොහොයුරන් එබඳු පිළිවෙතක සහය පතන්නේ නැහැ. එනමුත් ගැටුම් විරහිත හා ගැටුම් අවම සුවදායී කුටුම්බයක් පිළිබඳ බලාපොරොත්තු දල්වා ගන්නට ඇවැසි ඉඩකඩ ඔවුන් සිය රසිකයන්ට ලබා දෙන්නේ කිසිදු ලෝබකමක් නොමැති ව.

නිරතුරු ඇස ගැටෙන හා ඇසුරට වැටිය හැකි සුලබ චරිත සතරක් සිනමාපටය පුරා ම තුලනාත්මක ව සංචරණය කරවන්නට කල්පන - වින්දන දෙසොහොයුරන් සිය තිරනාටකයෙන් ලැබෙන  අවසරය මැනවින් උපයෝගී කොට ගන්නවා. වෙසෙසින් ම රූපමය ගුණාංග සතු බලය සම්බන්ධයෙන් ඔවුන් සතු ව සැලකිය යුතු වැටහීමක් තිබෙන බවයි පෙනී යන්නේ. එසේ ම රූපණයේ සමත්කම් උචිත පරිදි හසුරුවා ගැනීමේ වුවමනාව කෙරෙහි ද ඔවුන් දක්වන



'ප්‍රේමය නම්' එක අතකින් යම් මනෝ ව්‍යාධියක  හැඩ රුව පිළිබඳ කරුණු දැක්වූ සිනමාපටයක්. එහෙයින් සිදුවන අත්වැරදීම් හා මඟහැරීම් සමඟ ම ගොඩ නැංවූ සිනමාපටයක්. 'මලකි දුවේ නුඹ' හිදී නම් කල්පන - වින්දන දෙසොහොයුරන් එබඳු පිළිවෙතක සහය පතන්නේ නැහැ. එනමුත් ගැටුම් විරහිත හා ගැටුම් අවම සුවදායී කුටුම්බයක් පිළිබඳ බලාපොරොත්තු දල්වා ගන්නට ඇවැසි ඉඩකඩ ඔවුන් සිය රසිකයන්ට ලබා දෙන්නේ කිසිදු ලෝබකමක් නොමැති ව.

සැලකිල්ල අතිමහත්. වාචික ප්‍රකාශ තවත් අරුතක් කුළුගන්වන අයුරින් සනිටුහන් කරලීමට ද ඔවුන් දක්වන අවධානය කැපී පෙනෙනවා.

මෙහිලා කල්පන හා වින්දන රසිකයා හමුවට කැඳවන්නේ නිරතුරු හමුවන හෝ හඳුනන චරිත සතරක්. සුවිශේෂතා අවම චරිත සතරක්. හිටපු විනිසුරුවරියක වන මිත්තනිය වෙසෙන්නේ තට්ට තනි ව ම. අමනාප වූ දියණිය අගනුවර වෙසෙන අවිවේකී යුධියුබ්කාරියක්. නිල සැමියකු නොමැති ව උපන් ඇගේ දියණිය පසුවන්නේ යොවුන් වියේ. මේ අතරට පැමිණෙන්නේ ප්‍රකට ලේඛකයකු ද වන මැදිවියේ සරසවි ඇදුරෙක්.

කල්පන හා වින්දන සිනමාකරුවන් පැකිළීමකින් තොර ව ම මේ සිව්දෙනා සිය දැක්මේ සීමාව තුළ රඳවන්නේ බලහත්කාරකමකින් තොර ව. මේ අනුව මිත්තණිය, දියණිය, මිනිපිරිය හා සරසවි ඇදුරු තැන එක ම පසුබිමක හැසිරෙන අයුරු දත හැකිවනවා. එක අතකින් ඔවුන් සිව්දෙනා ම සිය දිවිය හා හාත්පස පරිසරය දකින්නේ තම තමන්ගේ දැක්මෙන්. එහි ඇති යුක්තිසහගත බව නිරායාසයෙන් ගළපාලන්නට සිනමාකරුවන් දිගින් දිගටම උත්සුක වනවා. එහෙත් කෙමෙන් මොවුන'තර වැඩෙන සබඳතා සමඟ එම නොපෑහීම් දුරුවී යන වගයි  දැක ගත හැක්කේ. සිය මන්දගාමී රූප රචනයෙන්  උපරිම ඵල නෙළා ගන්නා සිනමාකරුවන් සිනමාපටය නිමා කරන්නේ රසික දෑස් තෙත් කළ  දුක් කඳුළුක් පිසදාලමින්. රසිකයා සතුටු කඳුළු හෙළන්නේ එකිනෙකා මත යැපෙන යහපත් මිනිස් සබඳතා සිය දෑස් අභියස ම දැකීමේ සතුට වාවා ගත නොහැකි ව. එනම්  මිත්තනිය හා ඇගේ දියණිය දිගුකාලින විරසකය අතහැර දැමීම නිසා. මිනිබිරිය අලුතෙන් හඳුනා ගත්  සරසවි අදුරු තැන හා පිතෘ ස්නේහයෙන් බැඳුණු  නිසා. 'ඉක්බිති සියල්ලෝ ම සතුටින් ජීවත් වූහ' යන සුලබ වැකිය රසිකයාට දනවන අතරවාරයේයි  කල්පන හා වින්දන 'මලකි දුවේ නුඹ'හි නිමාව සනිටුහන් කරන්නේ.

මේ සිව්දෙනා අර්බුදයකට යන්නේ හුදෙකලාව හා පීඩනය පරදවා සතුට ආසක්ත කර ගත හැකි විකල්ප මං සපයා ගැනීම අවදානම් සහගත විය හැකි නිසා. එහෙත් අවබෝධය හා ඒ සමඟින් පැමිණෙන නොපසුබට බව සමඟ වෙළෙමින් විකල්ප මඟකට පිවිසෙන මොවුන් සතුට සිය දිවි අලෝකමත් කරන එක ම ආකාරය සේ දකින්නේ වෙනස්වීම් දෙස සැකයෙන් බලන රසික පිල් පවා බැහැර නොකරමින්.

මෙහිලා කල්පන හා වින්දන වෙත ඉහළ ම සහයක් ලබා දෙන්නට උක්ත චරිත සතර ජීවමාන කළ සිව්දෙනා ම සමත්වනවා. මිත්තණියගේ චරිතයේ ඇති ගැඹුර හා පරිණත බව ආයාසයකින් තොර ව හසුකරගන්නට මාලිනී ෆොන්සේකා සමත් වන්නේ සිය දිගුකාලීන අත්දැකීම් සතු බලසම්පන්න බව නිසා. සමනලී ෆොන්සේකා සියුම් පරිවර්තන සහිත දියණියගේ චරිතයට ලබාදෙන වටිනාකම ඉමහත්. කුශේන්යා ෆොන්සේකාගේ බුහුටි බව රසික සිත් සතන් සසල කරන්නේ නොපමාව. රසික නෙතට දුක් කඳුළු සේ ම සතුටු කඳුළු ද වැඩිපුර ම රැගෙන එන්නේ ඇයයි. ශ්‍යාම් ප්‍රනාන්දු සරසවි ඇදුරු චරිතයේ පුළුල් බවත් සීමාසහිත බවත් ගළපාලන්නේ සුපුරුදු නිහඬතා සමඟ. මේ ඔහු මෑතදී රැගෙන ආ මතක හිටින සුළු රූපණයක්.




'මලකි දුවේ නුඹ' සමඟින් කල්පන හා වින්දන වෙසෙසින් ම අමතන්නේ අනුවේදනීය පුවත් සංගෘහිත සිනමා අත්දැකීම් විඳ ගනු රිසියෙන් සිනමාශාලා ඇසුරට ප්‍රිය රසික පිරිස් ය යන්න පැහැදිලියි. බොහෝ විට මේ පිරිස් සුසැදෙන්නේ පවුලේ සාමාජිකයන් ලෙසින්. සමකාලීන ව තිරගත ඇතැම් සිරිලක සිනමාපට වෙනත් අන්දමේ රසික පිරිස් අමතන්නට වැර දරන වග නොරහසක්. විටෙක ධනෝපායනයේදී පෙරට එන්නට සමත් වන්නේ එබඳු සිනමාපට. මේ 'මලකි දුවේ නුඹ' බඳු සිනමාපට මෙසමයේදී මුහුණදෙන ගැටලුවක්. එහෙත් 'මලකි දුවේ නුඹ' සඳහා වන රසික සහභාගිත්වයත් රසික ආකල්පත් පවසන්නේ මෙයට මුහුණදෙන්නට කල්පන හා වින්දන ගත් තීන්දුව අභියෝගාත්මක් වූ බව.





නුවන් කුමාර කටුගම්පල


# ඇණ්දී සේකර











වඩා උස් ව පෙනෙන කාව්‍යාත්මයත් ගීතාත්මයත් හැරුණුකොට මහගම සේකරට තිබුණේ තවත් කලා සාහිත්‍යාත්ම රැසක්. ඒවාත් ඔහුගේ සිනමාත්මයත් ගැන තිබෙන්නේ ලේඛන, භාෂණ රැසක්. සේකරගේ චිත්‍රාත්මය සැඟවී පවතින්නේ මේ කලාත්ම රැස අතර. ඒවා අප අතර ඉතිරි කර සිය මනුෂ්‍යාත්මය රැගෙන ඔහු නික්ම ගිය පසු 2026 ජනවාරි 14 දින සැමරුණේ, මරණය තෙක් අවුරුදු 47ක් ජීවත් වූ සේකර මරණයෙන් පසු ජීවත් වන 50 වැනි වසර.

ඔහු උපන් ගම නියෝජනය කරමින් රාජ්‍ය අනුග්‍රහය ඇති ව දොම්පේ ප්‍රාදේශීය සභාවත් ගම්පහ දිස්ත්‍රික් සංවර්ධන කමිටුවත් සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයත් එක් ව සංවිධාන කළ චාම්, එහෙත් හරවත් සැමරුම් වැඩසටහනක් රදාවාන තුංමංහංදියේදී සහ ආචාර්ය රත්න ශ්‍රී විජේසිංහ විසින් සිදු කරන ලද සැමරුම් දේශනයක් ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී පැවැත්වුණා. එහිදී ද සේකර නිර්මාණ පිළිබඳ විචාරාත්මක ව සාකච්ඡා වූ අතර ජනවාරි 14 සහ 15 දෙදින කොළඹදී පැවැතියේ මහගම සේකර චිත්‍ර නිර්මාණ සීමිත සංඛ්‍යාවක් ඇතුළත් 'මහගම සේකර හා දෘශ්‍ය කලා' ප්‍රදර්ශනය.

රාජ්‍ය පාර්ශ්වයත් රසික සහෘදයා පෙරටු කොටගත් මහජන පාර්ශ්වයත් මහගම සේකර කුටුම්භය ප්‍රමුඛ පවුලේ ඥාති හිතමිත්‍රාදීනුත් වශයෙන් පැහැදිලි ව බෙදී වෙන් ව සිදු කරන සැමරුම් උලෙළ අතරින් මැවෙන්නේ සේකර, ලෝකය රසවින්දනය උදෙසා එකමුතු කරන්නට තැත් කළ අපූර්වත්වය. එදාට මෙන් ම අදට ද හෙටට ද වලංගු, එනම් තත්කාලීන, සමකාලීන සහ සර්වකාලීන ගුණ රැඳෙන නිර්මාණ පෙළහරින් සේකර ඉල්ලා සිටියේ ඒවායේ ජීවමාන ඔබ (තමා) සොයා ගන්නා ලෙස මිස ඔහු (සේකර) සෙවීමට මහන්සි නොවන ලෙස.

මා ලිව් කවි මට වගේ ම
ඔබ හැමටත් පොදු වනු ඇත
සබඳ! එවිට මගෙ කවියේ
මා නොසොයා ඔබ දකින්න... එලෙස කීව ද අප ඔහුගේ කලා කෘතිවල අප (තමා) දකින්නට උත්සාහ කරනවා ද?


සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ දෘශ්‍යකලා පීඨයේ (එවක රජයේ ලලිත කලායතනයේ) විදුහල්පතිවරයකු වූ මහගම සේකර නමින් නම් කළ ගොඩනැගිල්ලේ හේවුඩ් කලා කෞතුකාගාරය (Heywood Museum) නිර්මාණය කර ඇතත් ඔහු ඇඳි එකදු සිතුවමකින්වත් එය සරසන්නට චිත්‍රයක් ලබා දීමට මනුෂ්‍යයකු නොසිටීම ම ඛේදයක් නොවේ ද? එහි හෝ වෙනත් කලාගාරයක හෝ ඒවා සංරක්ෂිත ව ප්‍රදර්ශනය කර පාසල් සිසුන්ට, සරසවි විද්‍යාර්ථීන්ට සහ පොදු රසිකයාට නරඹන්ට සහ අධ්‍යයනය කරන්නට හැකියාව තිබුණානම් කොතරම් අගෙයි ද?

ඒ අඩුව නිසා ම ඔහුගේ චිත්‍ර ගැන ප්‍රබල ශාස්ත්‍රාලයීය කියවීමක් සිදු වී නැති තරම්. එවැන්නක් සිදු වීමටනම් ඒ නිර්මාණ එක් තැනකින් මහජනයාට දැක බලාගෙන රසවිඳිය හැකි කලාගාරයක් ජාතික

වශයෙන් බිහි විය යුතුයි. එවැනි පරිශ්‍රයක් ප්‍රබුද්ධ කියවීමකට හොඳම තෝතැන්නක් වන බව අවිවාදාත්මකයි. අධ්‍යාපනික, ශාස්ත්‍රීය සහ පර්යේෂණාත්මක වශයෙන් ඉතා වැදගත් චිත්‍ර නිර්මාණ රාශියක් මහගම සේකර නිර්මාණ සමුච්චයේ තිබුණත් අවම වශයෙන් විශ්වවිද්‍යාල පර්යේෂකයකුට ශාස්ත්‍රීය පර්යේෂණයක් හෝ අධ්‍යයනයක් හෝ සඳහා පාදක කර ගන්නටවත් සේකර චිත්‍රයක ගුණාත්මක තත්ත්වයෙන් යුත් මුද්‍රිත අනුපිටපතක් හෝ ඩිජිටල් පිටපතක් හෝ ලබා ගැනීමට අදටත් අපහසුයි නොව, නොහැකියි. ඒ, එක් එක් පුද්ගලයන් ඒවායේ මුල් පිටපත් සහ අනුපිටපත් ද තැන් තැන්වල සන්තකයේ තබාගෙන ඡායාරූපයක්වත් ලබා ගැනීමට නොදෙන තත්ත්වය මත. එය, සිය ජීවිතාදර්ශයෙන් කලාව සහ මානවයා වෙනුවෙන් පෙනී සිට ඒ වෙනුවෙන් ම ජීවිතය දිය කර හළ මහගම සේකර නම් විශිෂ්ටයාට පරිභව කිරීමක් නොවන්නේ ද? සේකර අපේක්ෂා කළ ආකාරයට ඔහුගේ නිර්මාණවලින් රසික සහෘදයාට තමා දකින්නට හෝ ස්වයං ව තම චරිතය කියවා ගැනීමට හැකියාව ලැබීමටනම් ඒවා පරිශීලනය කරන්නට අවස්ථා පුළුල් සහ පහසු කළ යුතුයි.

පණ දෙවැනි කොට ඒ නිර්මාණ තවමත් ආරක්ෂා කරගෙන සිටින සියලු දෙනා සමාජයේ විශේෂ ප්‍රශංසාවට ලක්විය යුතු අය බව අවධාරණය කළ යුත්තක්. එහෙත් එයින් එදා මෙදාතුර ඒ නිර්මාණවල පිටපත් සමාජගත ව සාකච්ඡාවට බඳුන්වෙමින් තිබුණානම් සහෘදයා ලබන්නට තිබූ වින්දනය අහිමි කිරීමේ වරද කිසිසේත් නිවැරදි වන්නේ නැහැ. වෙළෙඳ හෝ වාණිජමය නොවන හෝ අරමුණකින් රසවින්දනාත්මක, අධ්‍යයනමය සහ පර්යේෂණාත්මක කාර්ය සඳහා ඔහුගේ නිර්මාණවල ඡායාරූපයක් හෝ පිටපතක් හෝ පහසුවෙන් ලබා ගැනීමට අවකාශ නොසලසා තවදුරටත් දැඩි ආවරණ යොද සිටීනම් සේකර, සහෘද දෙපාර්ශ්වයට ම කරන ද්‍රෝහීකමක්. එය ම, මරණයෙන් පසුත් පනස් වසක් දිවි ගෙවූ මහගම සේකරට තවදුරටත් මිනිසුන් සමග පහසුවෙන් දීර්ඝායුෂ වළඳන්නට ඉඩ ඇහිරෙන ක්‍රියාවක්. ඒ, දෘශ්‍ය කලා සම්බන්ධ උසස් අධ්‍යාපනය ලබන සිසුන්ගේ අධ්‍යයන කාර්යයට උපයෝගී කර ගත හැකි තරම් දියුණු ඉගෙනුම්කාරක සම්පත් සහ මෙවලම් රැසක් ඔහුගේ මේ කෙටිකාලීන නිර්මාණ ජීවිතය තුළ නිස්සරණාධ්‍යාශයෙන් ඉතිරි කර ගොස් තිබෙන නිසා සහ සේකර ඒවා මූල්‍යකරණය හෝ සන්තක අයිතිය හෝ අපේක්ෂා නොකළ නිර්ව්‍යාජ කලාකරුවකු නිසා.

විශේෂයෙන් ඔහුගේ චිත්‍රවලින් රේඛා, වර්ණ, ආලෝකය, අඳුර, ඉඩ, පරිමාණය, සංකල්ප රූප යනාදිය භාවිතය අනුව පුද්ගලයාට තමා සහ සමාජය කියවා ගනිමින් ගැඹුරු රසවින්දනයකට අවශ්‍ය පහසුකම් සැපයෙනවා. මව සහ දරුවා වැනි චිත්‍රයකින් සේකරගේ මව නොව ප්‍රේක්ෂකයකුට තමාගේ මව සිහියට






නැගෙන ලෙස නිර්මාණය කර තිබීම මීට ලබා දිය හැකි සරල ම උදාහරණයක් බවත් චිත්‍රයක දෘශ්‍ය රූප භාවිතයේ තිබෙන සුවිශේෂිත ම වැදගත්කම වන තමාගේ අත්දැකීම්, දැනුම සහ පරිචය ආශ්‍රයෙන් ගැඹුරට ගමන් කර ප්‍රඥාසම්පන්න විඳීමක් දක්වා ගමන් කළ හැකි මාවතක් සහෘදයාට විවර කරදීමට හැකි වීමේ මුඛ්‍ය අවශ්‍යතාව ඉටු කිරීමට සේකර චිත්‍ර සමත් බවත් සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ දෘශ්‍ය කලා පීඨයේ කථිකාචාර්ය ආචාර්ය සත්සර ඉලංගසිංහ ප්‍රකාශ කරනවා. පිකාසෝගේ 'ගුවර්නිකා - ස්පාඤ්ඤ සිවිල් යුද්ධයේ විලාපය' චිත්‍රයෙන් දැක්වෙන තත්ත්වය ම අද දවසේ ගාසා තීරයේ සිදු වන යුද්ධයේ විලාපයෙන් ද දකින්නට ලැබීමෙන් චිත්‍රයක තිබිය යුතු සර්වකාලීන සනාතන සත්‍යය විදහාලන ගුණය පැහැදිලි වන්නා සේ සේකරගේ චිත්‍රවල ද එබඳු සර්වකාලීන ලක්ෂණ තිබෙන බවත් ඔහු පවසනවා. සමාජයේ පංති විෂමතාව සහ අනවශ්‍ය තරගය නිසා ඇතිවී තිබෙන සංකීර්ණත්වය, ජනතාවගේ පාරම්පරික චින්තන රටාව, කුල මල පිළිබඳ ජනමතය, ගම සහ නගරය හා ප්‍රේමය සහ පවුල වැනි සංකල්පවල පවතින ගතානුගතික බව යනාදී ලක්ෂණ නූතනවාදී, ගෝලීයකරණයට ලක් වූ වර්තමානයේත් නොනැසී තිබෙන බව ඔහුගේ චිත්‍ර ගැඹුරින් විමර්ශනය කරන විට පෙනී යන්නක්. ඒ, ඒවායේ සර්වකාලීන ගුණයත් ඒවා ඔහු ජීවත් වූ වකවානුවේ පරිසරයේ පිළිබිඹුව මනාව පෙන්වන කැඩපත් බඳු නිසා කාලීන ගුණයත් එකට කැටි කරන්නට සේකරට තිබූ නිසඟ හැකියාව පෙන්වන නිදසුන්. මේවා ශිල්පීයත්වය ද වෘත්තීයභාවය ද මානුෂීයත්වය ද තාක්ෂණික භාවිතය ද එක සේ විශිෂ්ට ලෙස භාවිත කර දේශීයත්වයත් විශ්වීයත්වයත් යන අන්ත දෙක ම සිය නිර්මාණවල එකට තැන්පත් කළ හැකි නිර්මාණකරුවකුගේ ලක්ෂණ.

අචාර්ය ඉලංගසිංහ විස්තර කරන පරිදි "චිත්‍රයක් යනු සැලසුම්සහගත සංවිධිත සංඥා පද්ධතියකි" යන්න සනාථ කරන නිර්මාණ රාශියක් සේකර නිර්මාණ සමුච්චයේ තිබෙනවා. 'හඳ සහ නිව්යෝර්ක් නුවර' වැනි චිත්‍රයක පෘෂ්ඨය මත එකිනෙකට දුරස්ථ පරිසර තත්ත්ව, කාල පරාස, සමාජ, සංස්කෘතික, ආගමික සහ ආර්ථික පද්ධති, ගැඹුරු මානව සංවේදනා ඇතුළු ප්‍රතිරෝධතා එකිනෙක ගැටීමට සලස්වා ඇති පරිචය අපූර්ව වූවක්. ඒ නිසා ම මෙවැනි ශිල්පියකුගේ චිත්‍රයක් රසවිඳීමට යම්තාක්දුරකට හෝ පුහුණු කළ, එසේත් නැත්නම් සහජයෙන් ලද වින්දනාත්මක හැකියාවක් මෙන් ම වාසනා මහිමයක් ද කෙනෙකුට තිබිය යුතුයි.

මිනිස් සිතෙහි භාවමය හා විඥානමය අංශ ගැඹුරු හා සියුම් ලෙස විවරණය කෙරෙමින් ඉදිරිපත් කෙරෙන පෙනෙන කලාව, ඇසට ගෝචර වන කලාව හෙවත්







දෘශ්‍ය කලාව (Visual Art) යන්න නූතනයේ කැන්වසය මත ඇඳෙන චිත්‍රයකිනුත් තට්ටුවක් හෝ පෘෂ්ඨයක් හෝ මත නිමැවෙන මූර්තියකිනුත් ඔබ්බට ගොස් වඩාත් දියුණු තියුණු සහ පැතිරුණු ක්ෂේත්‍ර ගණනාවකයි විහිදී ගොස් තිබෙන්නේ. අද ඊට සැරසිලි කලා, ගෘහනිර්මාණ ශිල්පය, ඡායාරූපකරණය, සංගීතය, සාහිත්‍යය, නර්ථනය, නාට්‍යය, සිනමාව, රංගනය, කැටයම් ශිල්පය, මුද්‍රණ ශිල්පය වැනි කලාංග ද අයත් සේ සැලකෙනවා. නූතනවාදී කලා ධාරාව විසින් කලාගාරයෙන් එළියට ගොස් අවකාශය ද භාවිත කරමින් භූමි කලාවත් (Land Art) ශිල්පියාගේ ශරීරය යොදා ගනිමින් දේහ කලාවත් (Body Art) බාහිර ශිල්පියකුගේ ශරීරය පාවිච්චි කරමින් නිරූපණ කලාවත් (Performing Art) සංගීතය, නර්ථනය වැනි ප්‍රාසංගික කලාවනුත් (Performance Art) වැනි බහුවිධ කලා මාධ්‍යවල එකතුව දෘශ්‍ය කලා යනුවෙන් නම් කරන ලද බවත් ආචාර්ය ඉලංගසිංහ පැහැදිලි කරනවා. ඒ, හැටේ දශකයේ මුල්භාගයේ සිටි කලා විචාරකයන් විසින්. සේකර දෘශ්‍ය කලා භාවිතය සිනමාවටත් සංගීතයටත් සාහිත්‍යයටත් නාට්‍යයටත් පුවත්පත් කලාවටත් ඇඳුම් මෝස්තර නිර්මාණයටත් පොත් කවර නිර්මාණයටත් යොමුව බහුවිධ පුළුල් ක්ෂේත්‍ර කරා පැතිරී ඇත්තේ ඒවා අධ්‍යයනයෙන්.

පශ්චාත් නූතනවාදය, කාර්මික විප්ලවය, තාක්ෂණ දියුණුව, බහුවිධ මාධ්‍යවල යාවත්කාලීන වීම සමඟ භාවිතයට එන චිත්‍ර කලාවේ නව ඉසව් නිසා ශිල්පියා හුදෙක් අතින් ඇඳීමෙන් සහ වර්ණ තැවරීමෙන් ඔබ්බට ගොස් චිත්‍රය මත යම් යම් දේ ඇලවීම, කැන්වසයේ වෙනස්කම් සිදු කිරීම වැනි දේ අත්හදා බැලුවා. එපරිද්දෙන් චිත්‍ර කලාව පැතලි රූපයෙන් වෙනස් ව ස්ථාපන කලාවක් (Installation Art) ලෙස වර්ධනය වූ බව ද පහදන්නේ ආචාර්ය සත්සර ඉලංගසිංහ. මේ ශීඝ්‍ර වෙනස්කම් සිදු වන අවධියේ විසූ සේකරගේ දෘශ්‍ය කලා හැකියාව එබඳු අත්හදාබැලීම් ඇසුරේ ගැඹුරු සංකල්ප සාධනය කරමින් ක්‍රම ක්‍රමයෙන් වර්ධනය කර ගත් ශිල්පීයත්වයක් සහිත වූවක්.

සේකරගේ ශිල්පීයත්වය ගැන ආචාර්ය ඉලංගසිංහ මෙසේ ද පවසනවා. "චිත්‍ර ශිල්පීන් දෙයාකාරයි. ඒ, පැහැදිලි ව හඳුනාගත හැකි ඒකාකාර ශෛලියක් පවත්වාගෙන ගිය ජෝර්ජ් කීට් වැන්නන් සහ දේශීය, පෙරදිග සහ බටහිර වැනි ශෛලිවලට අයත් බහුශෛලීය නිර්මාණ කළ මහගම සේකර වැන්නන් වශයෙන්. එනම් සේකර ඒකශානරීය චිත්‍ර කලාවේදියෙක් හෙවත් ශෛලියකට කොටු වූ චිත්‍ර ශිල්පියෙක් නොවෙයි. ඔහු තොවිල්පවිල්වල බලි රූප වැනි ගැමිකම මුසුවුණු දේශීය සාම්ප්‍රදායික හැඩතල සහිත චිත්‍රත් පෝල් ක්ලී වැනි යුරෝපීය ශිල්පීන්ගේ චිත්‍රවල හැඩතල සහිත වියුක්ත චිත්‍රත් (Abstract Art) කාටූන් චිත්‍රත් ගුහා චිත්‍රත් (Rock Art) ළමා චිත්‍රත් කුරුටු චිත්‍රත් තෙල්සායම් චිත්‍රත් යනාදී සියල්ලේ ම සැරිසරමින් ප්‍රංශයේ පිකාසෝ සහ ඉන්දියාවේ එම්.එස්. හුසේන් වැනි ලෝක ප්‍රකට චිත්‍ර ශිල්පීන් පරිද්දෙන් වෘත්තීය සහ ශිල්පීය ගුණ ආරක්ෂා වන පරිදි විශිෂ්ට අත්හදා බැලීම්වල නියුතු වූවකු ලෙස හඳුනා ගත හැකියි."





වර්ෂ 1956, 1971 හා 1972දී මෙරට ඇතිවූ සමාජ, ආර්ථික සහ දේශපාලන ප්‍රවණතා සහ ලංකාවේත් ලෝකයේත් ඉතිහාසය, සංස්කෘතිය, ආගම්, දර්ශනවාද පිළිබඳ දැනුමත් ඔහුගේ කලා නිර්මාණවල කේන්ද්‍රගත ව තිබෙන්නේ අවියෝජනීය ලෙස. මිනිසා සිය ජන්ම දේශය සහ ලෝකය වෙනුවෙන් ඉටු කළ යුතු යුතුකම් හා වගකීම්, මෙරට ජනයාගේ සරල ආධ්‍යාත්මික ජීවන රටාවේ ශීඝ්‍ර පිරිහීම ඇතුළු රටේ සමස්ත දේහය ඉසියුම් ව විමර්ශනය කළ ආකාරය මහගම සේකර නිර්මාණවලින් එළිපෙහෙළි වන්නේ 'කලාකරුවා සෑම තැනක ම ඇති දේ සියුම් ව උකහා ගන්නා ගිජුලිහිණියකු වැනි විය යුතුය' යන කියමන සනාථ කරමින්. එබඳු වූ සේකර නිර්මාණවලින් අප (තමා) සොයා නොගන්නා තෙක් අපට සේකර ද හමු නොවනු ඇති.

සේකරගේ සිතුවම් - අන්තර්ජාලයෙන්

# රාජ්‍ය සේවා තරග විභාග අත්වැල

## ආදර්ශ ප්‍රශ්නෝත්තර - 2



ඉදිරිපත් කිරීම
**නාලක දිසානායක**
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාර්ලිමේන්තු කටයුතු), මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය හා අධ්‍යක්ෂ (පාලන) වැ.බ රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

රාජ්‍ය සේවයට නවකයන් බඳවා ගැනීම සඳහා වන විවිධ තරග විභාග මෙන් ම දැනට සේවයේ නිරත නිලධරයන්ට පැවැත්වෙන කාර්යක්ෂමතා කඩඉම් විභාග සඳහාත් එක සේ වැදගත් වන විවිධ මාතෘකා ඔස්සේ ආදර්ශ ප්‍රශ්නෝත්තර ද සහිත ව 'දෙසතිය' ගෙන එන ලිපි මාලාවේ දෙවැනි දිගහැරුමයි මේ.

**1. දූෂණ විරෝධි පනත, තොරතුරු දැන ගැනීමේ අයිතිය පිළිබඳ පනත හා රජයේ නිවාඩු පනත යන පනත්හි අංක පිළිවෙළින් දක්වන්න.**

❖ දූෂණ විරෝධි පනත - 2023 අංක 09

❖ තොරතුරු දැන ගැනීමේ අයිතිය පිළිබඳ පනත - 2016 අංක 12

❖ රජයේ නිවාඩු පනත - 1971 අංක 29

**2. ලෝක දූෂණ විරෝධි දිනය කවදා ද?**

❖ දෙසැම්බර් 09

**3. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවෙහි කී වැනි පරිච්ඡේදයේ රාජ්‍ය මූල්‍ය හා සම්බන්ධ විධිවිධාන දැක්වේ ද?**

❖ xvii වැනි පරිච්ඡේදය

**4. මූල්‍යමය වටිනාකමක් ගැබ් වී ඇති හෝ මුදලක් අය කිරීමෙන් අනතුරුව නිකුත් කරන හෝ පත්‍රිකා අඩංගු පොත් හෙවත් උපපත්‍රිකා පොත් ප්‍රධාන වශයෙන් වර්ග 02කට බෙදිය හැකි ය. ඒ මොනවා ද?**

❖ භාණ්ඩාගාර උපපත්‍රිකා පොත්

❖ දෙපාර්තමේන්තුමය උපපත්‍රිකා පොත්

**5. රාජ්‍ය වියදම ප්‍රධාන කොටස් 02කි. ඒ මොනවා ද?**

❖ මූලධන වියදම්

❖ ප්‍රාග්ධන වියදම්

**6. මූල්‍ය පාලනය හා සම්බන්ධ කාර්ය පවරා දීමේදී ආදායම් හා වියදම් සම්බන්ධ බලතල පැවරෙන අවස්ථා දෙකෙහි පියවර වෙන වෙන ම දක්වන්න.**

❖ ආදායම් සම්බන්ධ ව - තක්සේරු කිරීම, එකතු කිරීම, ප්‍රතිග්‍රහණය

❖ වියදම් සම්බන්ධ ව - බලය දීම, අනුමත කිරීම, සහතික කිරීම, ගෙවීම

**7. වර්තමානයේ ක්‍රියාත්මක දූෂණ විරෝධි ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කළ යුතු කාල රාමුව කුමක් ද?**

❖ 2025 - 2029

**8. දිවයිනේ රාජකාරී ගමන් හා සබැඳි ආයතනික කටයුතුවලදී භාවිත වන සංග්‍රහ දීමනාව/ ගමන් වියදම් දීමනාව හා නාගරික බල මණ්ඩලය යන වචන සඳහා වන අර්ථ නිරූපණ කවරේ ද?**

❖ සංග්‍රහ දීමනාව - රාජකාරී ගමනකදී නවාතැන් හා යැපීම් වෙනුවෙන් දරන ලද වියදම ප්‍රතිපූරණයට ලබා දෙන දීමනාවයි.

❖ ගමන් වියදම් දීමනාව - රාජකාරී ගමනකදී මහා මාර්ගයේ වාහනවලින් ගමන් කිරීමේදී දරන ලද වියදම ප්‍රතිපූරණයට ලබා දෙන දීමනාවයි.

❖ නාගරික බල මණ්ඩලය - මහ නගර සභා හෝ නගර සභා හෝ සීමාව අදහස් කරයි.

**9. රාජ්‍ය/ පළාත් රාජ්‍ය නිලධරයෙකු සඳහා අදාළ වන වර්තමාන වැටුප් චක්‍රලේඛය කුමක් ද?**

❖ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025

**10. 1975 සිට 2025 තෙක් ක්‍රියාත්මක වූ පොදු වැටුප් චක්‍රලේඛ මොනවා ද?**

(මෙහිදී පොදු චක්‍රලේඛ යන්නෙන් අදහස් කරනුයේ, පොදුවේ සමස්ත රාජ්‍ය සේවයට ම වැටුප් සංශෝධනය සිදු කිරීමට අදාළ වූ චක්‍රලේඛ වේ.)

❖ 1975.04.01 සිට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 96

❖ 1982.01.01 සිට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 197

❖ 1986.01.01 සිට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 327

❖ 1988.01.01 සිට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 387

❖ 1993.01.01 සිට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 37/92

❖ 1997.01.01 සිට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 2/97(iii)

❖ 2004.01.01 සිට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/2003

❖ 2004.12.01 සිට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 09/2004

❖ 2006.01.01 සිට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006

❖ 2016.01.01 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016

❖ 2025.01.01 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025

මෙම ප්‍රශ්න මාලාව ඔස්සේ විවිධාකාරයේ ප්‍රශ්න ඉදිරිපත් කිරීමෙන් බලාපොරොත්තු වන්නේ තමන් පෙනී සිටින විභාගය හෝ පරීක්ෂණය හෝ අනුව විවිධ පරාසයේ දැනුම සොයා යාම අත්‍යාවශ්‍ය බව අවධාරණය කිරීමයි.

**(2025 දෙසැම්බර් මස කලාපයේ 39 වැනි පිටුවේ 'විභාග' යටතේ රජයේ නිලධරයෙකුගේ වැඩ තහනම් කළ හැකි අවස්ථා මොනවාද? යන 4 වැනි ප්‍රශ්නයේ** "ජනරජයේ ව්‍යවස්ථාවට අවනත නොවීම, ජනරජය අපකීර්තියට පත් වන අයුරින් කටයුතු කිරීම හෝ එසේ කිරීමට ඉඩ හැරීම." යනුවෙන් නිවැරදි විය යුතු ය)



# රග්බි

**අනිල් වීරසිංහ**

වාර්ෂික ආසියා වයස අවුරුදු 19න් පහළ රගර් (රග්බි) ශූරතා තරගාවලිය 2026 වසරේ ශ්‍රී ලංකාවේ පවත්වන බව නොබෝදා ප්‍රකාශයට පත් කෙරුණා. හොංකොං, ජපානය, තායිවානය, මැලේසියාව, තායිලන්තය වැනි ආසියාතික රගර් කණ්ඩායම් තරග වදින මේ තරගාවලිය ආසියාතික රගර් දින දර්ශනයේ වාර්ෂික තරගාවලියක්. මීට පෙර රග්බි කනිෂ්ඨ තරගාවලිය 2000, 2014 වසරවල ශ්‍රී ලංකාවේ පවත්වා තිබෙන අතර 2017 වසරේ හොංකොං සමඟ සම සත්කාරකත්වය ලබා ඇති බවත් වාර්තාවල සඳහන්. අවස්ථා කිහිපයකදී ම ශ්‍රී ලංකාව මෙහි අනුශූරතාව දිනා තිබෙනවා.

විශේෂයෙන් කොළඹ හා මහනුවර යන නගරවල ක්‍රිකට් ක්‍රීඩාව හැරුණු විට වඩාත් ජනප්‍රියතම ක්‍රීඩාව ලෙස රගර් ක්‍රීඩාව හඳුන්වන්න පුළුවන්. අතීතයේ ක්‍රිකට් වාරය අප්‍රේල් මාසයේ අවසන් වීමත් සමඟ ම රගර් තරග මාලා ආරම්භ වූ අතර වර්තමානයේ මෙය ක්‍රිකට් වාරය සමඟ සමගාමී ව දිව යනවා.

වාර්තාගත කරුණු අනුව මෙරට රගර් ක්‍රීඩාව ආරම්භ වී ඇත්තේ 1879 වසරේදී. ඒ, මෙරට මුල් ම රග්බි ක්‍රීඩා සමාජය ලෙස කොළඹ පාපන්දු සමාජය 1879 වසරේ ජූනි 28 දින පිහිටුවා ගැනීමෙන්. මෙය පසුව කොළඹ හොකී ක්‍රීඩා සමාජය හා එක්වීමෙන් සි.එච්.එෆ්.සි. නමින් හැඳින්වෙනවා. මෙය වර්තමාන රග්බි ක්‍රීඩා සමාජ අතර ඉදිරියෙන් ම සිටින කණ්ඩායමක්. මෙරට මුල් ම රග්බි ක්‍රීඩා සමාජය ලෙස කොළඹ පාපන්දු සමාජය බිහි වනවිට එංගලන්තය ලොව පළමු රග්බි සංගමය පිහිටුවාගෙන ගතවී තිබුණේත් වසර 08ක් වැනි කාලයක්. විශේෂයෙන් ඒ වනවිට ලංකාව එංගලන්තයට යටත් රාජ්‍යයක් ව තිබීම ඔවුන්ගේ ක්‍රීඩා වූ ක්‍රිකට් හා රග්බි යන ක්‍රීඩා මෙහි ස්ථාපිත වීමට මූලික වශයෙන් බලපා තිබෙනවා. කොළඹ, මහනුවර මෙන් ම දියතලාව, දික්ඔය වැනි වතුකරයේ ප්‍රදේශ ආශ්‍රිතවත් මෙය වඩාත් ජනප්‍රිය වූ බව සඳහන්.

මෙරට පැවති මුල් ම රග්බි තරගය ලෙස කොළඹ පාපන්දු සමාජය හා ලෝක XV කණ්ඩායම අතර 1879 ජූනි 30 දින ගාලු මුවදොර පිටියේ පැවති තරගය වාර්තා වෙනවා. 1880 වසරේ දියතලාව සහ දික්ඔය අතර තරගයක් හැටන්හි දාරවැල්ල, දික්ඔය ක්‍රීඩා පිටියේ පැවත් වී ඇති බවත් මෙය ක්‍රීඩා සමාජ දෙකක් අතර පැවති මුල් ම තරගය ලෙසත් සඳහන්. 1908 අගෝස්තු 10 දින ආරම්භ කරන ලද සිලෝන් රග්බි පාපන්දු සංගමය (මෙය වර්තමානයේ ශ්‍රී ලංකා රග්බි නමින් හැඳින්වෙයි) ආසියාවේ පළමු ජාතික රග්බි සංගමය වීමත් විශේෂත්වයක්.

වර්තමානයේ රග්බි ක්‍රීඩාව සඳහා තරගාවලි කිහිපයක් පවතින අතර වඩාත් ප්‍රමුඛතම තරග මාලාව ලෙස ක්ලිෆර්ඩ් කුසලාන තරගාවලිය සඳහන් කළ හැකියි. 1911 වසරේ එවකට මෙරට වැඩ බලන ආණ්ඩුකාරවරයා වූ හියු ක්ලිෆර්ඩ්ගේ ආර්යාව වූ ක්ලිෆර්ඩ් මැතිනිය මේ ක්‍රීඩාවට තිබූ තම ලැදියාව හේතුවෙන් සමස්ත ලංකා කණ්ඩායම හා එක්සත් සේවා කණ්ඩායම අතර පැවති රග්බි තරගය සඳහා මේ කුසලාන ප්‍රදානය කළා. මේ තරගාවලිය නතර වන්නේ පළමු ලෝක යුද්ධය හේතුවෙන්. පසුව හියු ක්ලිෆර්ඩ් මෙරට ආණ්ඩුකාරවරයා ලෙස පත් වීමෙන් පසු 1926 වසරේ මෙය උඩරට, පහත රට, ලාංකික හා ඒකාබද්ධ සේවා කණ්ඩායම අතර සිවිකොන් තරගාවලියක් ලෙස පවත්වා එහි ජයග්‍රාහකයන් වෙනුවෙන් මේ නමින් ම නව කුසලානයක් පිරි නමා තිබෙනවා. එහෙත් එවරත් මේ තරගාවලියට හරස් වන්නේ යුද්ධය. එවර දෙවැනි ලෝක යුද්ධය මත මෙය 1938 වසරෙන් පසු නැවත වරක් නතර වන අතර ක්‍රීඩා සමාජ තරගාවලියක් ලෙස පසුව ආරම්භ වන්නේ 1950 වසරේ සිට. එවර මහනුවර ක්‍රීඩා සමාජය, දියතලාව මලල හා ක්‍රිකට් ක්‍රීඩා සමාජය, දික්ඔය මස්කෙලිය ක්‍රිකට් සමාජය, ඌව ජිම්කානා සමාජය, කැලණිවැලි සමාජය, හැව්ලොක් ක්‍රීඩා සමාජය, කොළඹ හොකී හා පාපන්දු සමාජය (සි.එච්.හා

එෆ්.සි.), ලාංකික රග්බි හා පාපන්දු සමාජය (සි.ආර්.සහ එෆ්.සි.) යන කණ්ඩායම් අට අතර පැවැත්වෙන තරගාවලියේ ශූරතාව හැව්ලොක්ස් කණ්ඩායම දිනා ගන්නවා.

1960 දශකයේ ආරක්ෂක අංශ වන පොලිස්, යුධ, ගුවන් හා නාවික යන හමුදා කණ්ඩායම් මේ තරගාවලිය සඳහා අවතීර්ණ වීමත් විශේෂයි. මේ අතරින් පොලිස් කණ්ඩායම විශේෂ වන්නේ ඔවුන් 1970-80 දශකවල වඩාත් තරගකාරී කණ්ඩායමක් ලෙස මේ ශූරතාව අවස්ථා කිහිපයකදී ම ජය ගැනීම. අවසන් වරට ඔවුන් මෙය ජය ගන්නේ 2024 වසරේයි. අතීතයේ පැවති දිඹුල මලල හා ක්‍රිකට් ක්‍රීඩා සමාජය, දික්ඔය මස්කෙළිය ක්‍රිකට් සමාජය, ඌව ජිම්කානා සමාජය, කැලණිවැලි සමාජය වැනි ක්‍රීඩා සමාජ වත්මන් ක්‍රීඩා සමාජ තරග බිමේ දැක ගැනීමට නැහැ.

මුලදී ලීග් ක්‍රමයට පැවති ක්ලිෆර්ඩ් කුසලාන තරගාවලිය 1985 වසරේ සිට පිළිමලුන් පිටු දැකීමේ ක්‍රමයට පැවැත්වෙන අතර එතැන් සිට ලීග් තරගාවලිය එහි අනුග්‍රාහකයන්ගේ නම්වලින් හැඳින්වීම ආරම්භ වුණා.



ක්‍රීඩා සමාජ තරග මාලා සඳහා බොහෝවිට විදෙස් රටවල ක්‍රීඩකයන් සහභාගි කරවා ගැනීමත් විශේෂත්වයක්. මෙය වඩාත් කැපී පෙනුණේ 1980 දශකයේ මැද පමණ සිට. විශේෂයෙන් ෆීජි දූපත් ක්‍රීඩකයන් මේ අතර වඩාත් දස්කම් දක්වා තිබෙනවා. මේ ක්‍රීඩකයන් අතරින් වඩාත් කැපී පෙනුණේ එකල සි.එච්. සහ එෆ්.සි. කණ්ඩායම නියෝජනය කළ අපිසායි නගාටා යන ක්‍රීඩකයා. ඔහුගේ දස්කම් හේතුවෙන් අනෙක් ක්‍රීඩා සමාජ ද පසුව ෆීජි ජාතික ක්‍රීඩකයන් කෙරෙහි වැඩි අවධානයක් දැක්වීම දැක ගන්නට ලැබුණා.

ක්‍රීඩා සමාජ තරගවලට මෙන් ම මෙරට පාසල් රග්බි තරගවලට ද ඇත්තේ යහපත් ප්‍රේක්ෂක ආකර්ෂණයක්. ලුවී එඩ්මන්ඩ් බ්ලේස් 1891 වසරේදී මහනුවර කිංග්ස්වුඩ් විද්‍යාලයට රග්බි ක්‍රීඩාව හඳුන්වා දුන් අතර මෙරට පළමු අන්තර් පාසල් තරගය ලෙස 1906 වසරේදී මහනුවර කිංග්ස්වුඩ් විද්‍යාලය සහ මහනුවර ත්‍රිත්ව විද්‍යාලය අතර පවත්වා තිබෙනවා. මෙය ජය පරාජයෙන් තොර ව නිමා වූ තරගයක් ලෙසයි වාර්තා වන්නේ. 1945 ආරම්භ වූ කොළඹ රාජකීය හා මහනුවර ත්‍රිත්ව විදුහල අතර බ්‍රැඩ්බි කුසලාන තරගාවලියත් වාර්ෂික පාසල් තරග පිටියේ කැපී පෙනෙන තරගයක්. පාසල් සඳහා ලීග් මෙන් ම පිළිමලුන් පිටුදැකීමේ තරගාවලියක් වාර්ෂික ව පැවැත්වෙනවා. කොළඹ ඉසිපතන, රාජකීය, ශාන්ත පීතර්, ශාන්ත ජෝශප්, ගල්කිස්ස ශාන්ත තෝමස්, විද්‍යා විද්‍යාලය, මහනුවර ත්‍රිත්ව, කිංස්වුඩ්, ධර්මරාජ, කටුගස්තොට ශාන්ත අන්තෝනි, කොළඹ වෙස්ලි, සහිරා පාසල් රග්බි පිටියේ ශූරතා ජයගත් කණ්ඩායම්.

1907 වසරේ නවසිලන්ත ඕල් බ්ලැක් කණ්ඩායම හා සමස්ත ලංකා කණ්ඩායම අතර පැවති තරගයයි මෙරට පැවති මුල් ම ජාත්‍යන්තර රග්බි තරගය. මේ තරගයෙන් ජය අත්වුණේ නවසිලන්ත ඕල් බ්ලැක් කණ්ඩායමට.

ක්‍රීඩා සමාජ තරගවලට මෙන් ම මෙරට පාසල් රග්බි තරගවලට ද ඇත්තේ යහපත් ප්‍රේක්ෂක ආකර්ෂණයක්. ලුවී එඩ්මන්ඩ් බ්ලේස් 1891 වසරේදී මහනුවර කිංග්ස්වුඩ් විද්‍යාලයට රග්බි ක්‍රීඩාව හඳුන්වා දුන් අතර මෙරට පළමු අන්තර් පාසල් තරගය ලෙස 1906 වසරේදී මහනුවර කිංග්ස්වුඩ් විද්‍යාලය සහ මහනුවර ත්‍රිත්ව විද්‍යාලය අතර පවත්වා තිබෙනවා.

රටවල් වශයෙන් නොවුණත් ඉන්දියාවේ ක්‍රීඩා සමාජ අතර 1924 සිට පැවැත්වෙන සමස්ත ඉන්දීය රග්බි ශූරතා තරගාවලියේ ශූරතාව සඳහා ලංකාවත් අතීතයේ සහභාගි වුණා. 1929 හා 1932 මෙහි ශූරතාව දිනා ගැනීම මුල් යුගයේ මෙරට රග්බි ක්‍රීඩාව ලද සුවිශේෂ ජයග්‍රහණයක්. එම අවස්ථාවල මෙරට කණ්ඩායම් නියෝජනය කර ඇත්තේ ලංකාවේ ජීවත් වූ සුදු ජාතිකයන්.

1974 මෙරට පැවති සිව් වැනි ආසියාතික රග්බි තරගාවලිය ශ්‍රී ලංකාව රග්බි පිටියේ උසස් දස්කම් දැක්වූ තරගාවලියක් ලෙස සැලකෙනවා. ශ්‍රී ලංකාව එවර සිංගප්පූරුව, ලාඕසය හා මැලේසියාව යන කණ්ඩායම් පරදවා අවසන් මහා තරගයට පිවිස ජපානය ඉදිරියේ පරාජය වුණත් අනුශූරතාව දිනා ගැනීම වැදගත් සිදුවීමක්. තවමත් ලෝක කුසලාන රග්බි තරගාවලිය සඳහා එක ම අවස්ථාවක හෝ සුදුසුකම් ලබා ගැනීමට නොහැකි වුණත් ආසියාවේ රගර් ක්‍රීඩාව අතින් අංක 05 ස්ථානයේ සිටින ශ්‍රී ලංකාව 2016 ආසියාතික සත් සාමාජික රග්බි ශූරතා අනුශූරතාව, 2024 ආසියාතික රග්බි 01 කොටසේ ශූරතාව ලබාගෙන තිබෙනවා. ශ්‍රී ලංකාව දැනට සත් සාමාජික තරග කාණ්ඩයෙන් පසු වන්නේ ආසියාවේ 03 වැනි ස්ථානයේ.

ශ්‍රී ලංකා රග්බි සම්මේලනයේ ප්‍රධාන විධායක නිලධාරි හසන් සිංහවංශ පවසන ආකාරයට වසර තුනක පමණ කාලයක් නොයෙකුත් ප්‍රශ්නවලට සහ අධිකරණ ක්‍රියාමාර්ගවලට මැදි වී සිටි ශ්‍රී ලංකා රග්බි 2025 ඔක්තෝම්බර් මාසයේ සිට නව සභාපති පවිත්‍ර ප්‍රනාන්දු පත්වීමත් සමඟ වෙනසකට ලක් ව තිබෙනවා. අදහස් දක්වන විධායක නිලධාරි හසන් සිංහවංස; "2025 වසරේ නවසීලන්තය සමඟ ශ්‍රී ලංකාවේදී කිලෝ 85 තරගවලට සහභාගි වුණා. මැලේසියාව සමඟ තරග වැදුණා. ලෝක කුසලාන සුදුසුකම් ලැබීමේ තරග තුනක් ක්‍රීඩා කළා. මීට අමතර ව රටවල් 12ක සහභාගිත්වයෙන් පැවැත්වූ ආසියාතික සත් සාමාජික දෙවැනි අදියර පිරිමි හා කාන්තා රග්බි ශූරතාව හොඳින් ක්‍රීඩා කළ නිසා නැවත වරක් නවසීලන්ත කිලෝ 85 කණ්ඩායම අප්‍රේල් මාසයේ ශ්‍රී ලංකාවට පැමිණීමට නියමිතයි. අප්‍රේල් 29 සිට මැයි 12 දක්වා එම තරග පැවැත්වෙනවා කොළඹ සහ මහනුවර."

මෙවැනි පසුබිමක 2026 වසරේ දෙසැම්බර් මස 13 දින සිට 20 දින දක්වා මෙරට පැවැත්වෙන වයස අවුරුදු 19න් පහළ ආසියාතික රගර් තරගාවලිය මෙරට රග්බි ක්‍රීඩාව ගැන සුබවාදී බලාපොරොත්තු ඉහළ නංවනු ඇතැයි අපේක්ෂා කළ හැකියි.




# දෙසතිය

පුවත් සඟරාව

## විශේෂාංග ලේඛකයන්ට ඇරයුම්

- දෙස්/විදෙස්
- ආර්ථික
- දේශපාලන
- අධ්‍යාපන
- පරිසර
- විද්‍යා
- සෞඛ්‍ය
- කලා
- සාහිත්‍ය
- ක්‍රීඩා

මෑතකදී ඔබ විසින් සම්පාදනය කරන ලද
**විශේෂාංග ලිපියක ඡායා පිටපතක්** සමඟ
**ජීවදත්ත අයදුම්පත්‍රයක්**
**2026 පෙබරවාරි 15 දිනට පෙර** පහත ලිපිනයට යොමු කරන්න.

**ලිපිනය** - සංස්කාරක - දෙසතිය පුවත් සඟරාව
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, අංක 163,
කිරුළපන මාවත, කොළඹ 05
විද්‍යුත් ලිපිනය : desathiya.editor@gmail.com

වැඩිදුර විස්තර සඳහා අමතන්න **0112513757 / 0112513153**




හිටපු ඕස්ට්‍රේලියානු ක්‍රිකට් කණ්ඩායම් නායක ස්ටීවන් ස්මිත් සංවේදී වෙමින් පැවැත්වූ මාධ්‍ය හමුව. ''මගේ ජීවිත කාලය පුරා ම මම මේ ගැන පසුතැවෙනවා කියලා මම දන්නවා.'' ඔහු මෙලෙස කියා සිටියේ 2018 වසරේ මාර්තු මාසයේදී. ඒ, සිය නායකත්වය යටතේ පන්දුවේ ආලේපනයක් ගැලවීමේ වංචාවට වසරක තරග තහනමකට ලක්වීමෙන් පසුව.




වසරක තරග තහනමෙන් පසු 2019 වසරේදී යළි පිටියට පිවිසි ඔහු අශෙෂ් තරගාවලියේ පළමු ටෙස්ට් තරගයේදී එංගලන්තයට එරෙහි ව Edgbaston ක්‍රීඩා පිටියේදී ශතකයක් වාර්තා කිරීමේ අවස්ථාව. 2019 අගෝස්තු 01 දින ආරම්භ වූ මේ තරගාවලියේ පළමු ඉනිමේදී ලකුණු 144ක් ලබා ගැනීමට ස්මිත් සමත් වුණා.

## පසු සටහන

වරදකට දඬුවම් හිමිවිය යුතුයි. එය නිවැරදි කර ගැනීමටත් නව ජවයකින් නැඟී සිටීමටත් කෙනෙකුට හැකියාව තිබෙනවා. වරද පිළිගැනීමටත් එය නිවරදි කර ගැනීමටත් අවශ්‍ය වන්නේ අප්‍රතිහත ධෛර්යයක් පමණයි.

දෙසතිය පුවත් සඟරාව
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයක්
www.dgi.gov.lk www.news.lk
පුවත් සඟරාවක් ලෙස ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර ඇත
Department of Government Information
news.lk
GFU Sri Lanka
Rs. 100/-